ISSN 1391 - 1031
2016 දෙසැම්බර්
22 වෙළුම 09 කලාපය

ආධාරය රු 30/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"ආත්ම ලාභය නොතකා වැඩ කිරීමෙන් තොරව, සෑම සියලු පුද්ගලයෙක්ම දරන යෝධ ප්‍රයත්නයක් නොමැතිව, ජීවිතය නව රටාවකට ගොඩනැංවීම සඳහා දැඩි බවක් සහ අධිෂ්ඨානයක් දක්වන්නේ නැතිව, සියලුම කම්කරුවන්ගේ සහ සියලුම දුප්පත් ගොවියන්ගේ දැඩි සංවිධාන වීමක් සහ සහෝදරාත්මක විනයක් නොමැතිව, මේ සියල්ල නොමැතිව ගැලවීමේ මඟක් නොමැත.'"

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**5 වන වෙළුම, 141 පිටුව**

**05** **දේශපාලනය, අවස්ථා...**



රජයේ සේවකයෝ තම අයිතීන් ඉල්ලා අරගල කරති. ගොවියෝ පාරට බසිති. ධීවරයෝ වීදි...

**09** **අයවැය...**





දවසින් දවස වර්ධනය වන වෙළඳ ශේෂ පරතරය පියවීම කෙසේ වෙතත් පරතරයේ වර්ධනය...

**11** **පෙනුමේ හා හරයේ...**



විවිධ තරු රටා 'රාශි' ලෙස මිනිසා විසින් නම් කළේද මෙම 'පෙනුම' සත්‍ය සේ...

**12** **වරාය විකිණීම හා...**



රාජපක්ෂ පාලනය පෙරළා දමා බලයට පැමිණි රනිල් - මෛත්‍රී හයිබ්‍රිඩ් ආණ්ඩුවට මේ වන විට...

සංවාදය.......................... 03
තරුණ............................. 04
ආවර්ජනා......................... 06
විශේෂ............................. 07
ජාත්‍යන්තර....................... 08
කාන්තා........................... 10
වේදිකාව.......................... 13
විශේෂාංග......................... 14

# ජ.වි.පෙ.ට එරෙහි අවලාදකරුවෝ මඩට බසිති

02 පිටුවට






**යුක්තිගරුක දේශයක්!** **සාධාරණ සමාජයක්!!** **නිවහල් මිනිසෙක්!!!**

# දුම්රිය තාක්ෂණ ශිල්පී සංගමයේ වාර්ෂික සමුළුව මුළුදෙයි

දුම්රිය පෞද්ගලීකරණය කිරීමට සහ සේවක අයිතීන් කප්පාදු කිරීමට එරෙහිව දුම්රිය තාක්ෂණ ශිල්පීන් පෙළගැස්වීම තේමාව කොට ගත් දුම්රිය තාක්ෂණ ශිල්පී සංගමයේ 08වැනි වාර්ෂික සමුළුව දෙමටගොඩ ධාවනබල උප දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා හා සමාජ ආයතන ශාලාවේදී නොවැ. 22 දින පෙ.ව. 10.00ට ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් සහ දුම්රිය තාක්ෂණ ශිල්පී සංගමයේ ප්‍රධාන ලේකම් එම්.ඒ. රත්නසිරි සහෝදරයා ඇතුළු සාමාජිකත්වකගේ සහභාගිත්වයෙන් සාර්ථකව පවත්වන ලදී.

සමුළුව සඳහා සහෝදර සංගමයක් වන දුම්රිය සේවා පොදු සේවක සංගමයේ ප්‍රධාන ලේකම් එස්.පී. විතාන සහෝදරයා සුභ පැතුම් එක් කරමින් සහභාගි වී සිටි අතර තාක්ෂණ ශිල්පීහුද විශාල පිරිසක් සහභාගි වී සිටියහ.




# කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ සංගමය 17වැනි නියෝජිත සමුළුව පවත්වයි

'සේවාව රැකගැනීමට, සේවක අයිතීන් දිනාගැනීමට වැඩකරන ජනතා බලයක් උදෙසා'යන තේමාව යටතේ රාජ්‍ය සේවා කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ සංගමයේ 17වැනි නියෝජිත සමුළුව පසුගිය 24වැනි දින පෙරවරුවේ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් කොළඹ, මහජන පුස්තකාලීය ශ්‍රවණාගාරයේ පවත්වන ලදී. ඒ සඳහා රාජ්‍ය සේවා කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ සංගමයේ ප්‍රධාන ලේකම් චන්දිම විමලසුරේනන්ද්‍ර සහ ප්‍රධාන සභාපති යූ. පලිහවඩන සහෝදරයාද ඇතුළු දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි විශාල සාමාජික සංඛ්‍යාවක් සහභාගි වී සිටියහ.




# හවුල් ආණ්ඩුවේ අයවැය ලේඛනය වැඩකරන ජනතාවගේ කර මතට තවත් බරක් - NTUC

2017 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මෛත්‍රී-රනිල් හවුල් ආණ්ඩුවේ අයවැය ලේඛනය, වැඩකරන ජනතාවගේ කර මතට තව තවත් බර පැටවෙන වැය බරක් පමණක් බව ඉතා පැහැදිලියැයි ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය පෙන්වා දෙයි. අයවැය පිළිබඳව මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් එහි ප්‍රධාන ලේකම් සමන්ත කෝරළේආරච්චි සහෝදරයා විසින් නිකුත් කරන ලද නිවේදනය වැඩිදුරටත් මෙසේ සඳහන්ය.

'රටේ ආර්ථික ක්‍රියාවලියට එක එල්ලේම සම්බන්ධ වන රාජ්‍ය හා පෞද්ගලික අංශයෙන් සියලු සේවකයින් සම්පූර්ණයෙන්ම අමතක කර දමා, ඔවුන්ගේ වැටුප් හෝ දීමනා කිසිවක් වැඩි නොකර බදු, දඩ හා ණය බර පමණක් පටවා තිබේ. එමෙන්ම මෙවර අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ දී ආහාර ද්‍රව්‍ය ඇතුළු අත්‍යවශ්‍යට භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාමද වළක්වාලිය නොහැකිවනු ඇත. වැඩකරන ජනතාවගේ ජීවන බර තව තවත් වැඩිකිරීම නිසා ජීවත්වීමේ අරගලයකට මුහුණ දීමට වැඩ කරන ජනතාවට සිදුවන බවත් අයවැය සකස් කිරීමට පෙර ජනතාවගෙන් එකතු කරගත් අදහස්, යෝජනා කිසිවක් අයවැය යෝජනා ලෙස ඉදිරිපත් නොකිරීමෙන් පොදු ජනතාව මුලා කර ඇති බවත් පෙන්වා දෙමු.

වැඩ කරන ජනතාව තවත් වටයකින් සාමාජමය හා ආර්ථික වශයෙන් මහා පීඩාවකට පත් කර ඇත. වැඩි කරන ලද භාණ්ඩ හා සේවාවලට ගෙවීමට සිදුවන මිල ඉහළ යාම නිසා, ජීවත් වීමට නොහැකි තත්වයක් අනිවාර්යයෙන්ම උද්ගත වනු ඇත. ජීවත් වීමට ප්‍රමාණවත් වැටුපක් දිනාගැනීම සඳහා වැඩකරන ජනතාව මැදිහත් කරගත් වැටුප් අරගලයකට පිවිසීමට ඉදිරි කාලයේදී සිදුවන බව රනිල්-මෛත්‍රී මෙන් මේ හවුල් ආණ්ඩුවට අවධාරණය කිරීමට ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය ලෙස අපට සිදුවී ඇත.'

# අධ්‍යාපනයේ අවශ්‍යතා හඳුනා නොගත් අයවැයක් - ගුරු සේවා සංගමය

2017 අයවැය සකස් කිරීමට පෙර මුදල් අමාත්‍යාංශය මගින් අයවැය සඳහා ලාංකේය පුරවැසියන් සංවිධානය හා වෘත්තීය සමිතිවලින් යෝජනා ලබා ගත්ත ද එම යෝජනා පිළිබඳ කිසිදු සැලකිල්ලක් දක්වා නොමැති යැයිද ආණ්ඩුවේ හිතවතුන්ගේ වුවමනාවන්ට සරිලන පරිදි සකස් කර ඇතැයිද ලංකා ගුරු සේවා සංගමය විසින් පෙන්වා දෙයි.

'අවුරුදු 20කට ආසන්න කාලයක් තුළ නොවිසඳුනු ගුරුවරුන්ගේ වැටුප් විෂමතා ගැටලුව මෙවර අයවැයෙන්ද නොසලකා හැර තිබේ. මෙම වැටුප් විෂමතාව හේතුවෙන් තවමත් රාජ්‍ය සේවකයින් අතරින් අඩුම වැටුප් ලබන පිරිස වන්නේ ගුරුවරුන් හා විදුහල්පතිවරුන් බව පැහැදිලි කරුණකි. නමුත් මෙම අයවැයේදී ගුරු- විදුහල්පතිවරුන්ට කිසිදු සහනයක් ලබාදීමට වත්මන් ආණ්ඩුව කටයුතු කර නැත. වත්මන් හවුල් ආණ්ඩ්ුව බලයට පැමිණීමේදී අධ්‍යාපනයට ජාතික ආදායමෙන් 6%ක් වෙන්කරන බවට පොරොන්දු දුන්නද අඩුම තරමින් එය 2% කට වත් ගෙන ඒමට ආණ්ඩුව අසමත් වී තිබේ. මෙමගින් පෙන්නුම් කරන්නේ වත්මන් ආණ්ඩුව අධ්‍යාපනය කෙරෙහි දක්වන ඉතා දුර්වල මැදිහත් වීමයි. අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව සීමිත ක්ෂේත්‍ර කිහිපයකට පමණක් සීමාවෙමින් අයවැය ප්‍රතිපාදන වෙන්කර තිබීමත් ගුරුවරුන්ගේ, විදුහල්පතිවරුන්ගේ ඇතුළු ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ වැටුප්, උසස්වීම් සම්බන්ධව අයවැයේදී කිසිදු සඳහනක් හෝ ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදුනොවීම දැඩිව සැලකිල්ලට ගතයුතු කරුණකි.' එහි ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයාගේ අත්සනින් නිකුත් කළ නිවේදනයේ සඳහන්ය.

# ෆිදෙල් කස්ත්‍රෝ නම් අපේ කාලයේ විප්ලවවාදියාට අපගේ විප්ලවීය උත්තමාචාරය!

## ජනතා විමුක්ති පෙරමුණ

**ෆිදෙල් කස්ත්‍රෝ සහෝදරයාගේ අභාවය වෙනුවෙන් ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලය විසින් පසුගිය 26වැනි දින නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනය සම්පූර්ණයෙන් මෙසේය.**

කියුබානු සමාජවාදී විප්ලවයේ නිර්මාතෘ, හිටපු කියුබානු ජනාධිපති ෆිදෙල් කස්ත්‍රෝ සහෝදරයා 90 හැවිරිදිව සිටියෙදී අපගෙන් සමුගෙන ගොස් තිබේ. ඔහුගේ නික්මයාම හේතුවෙන් ශෝක වන ලොව පුරා විප්ලවාදීන්, වාමාංශිකයින්, අධිරාජ්‍ය විරෝධීන් පමණක් නොව මානව වර්ගයාට ආදරය කරන කෝටි සංඛ්‍යාත මිනිසුන් අතරට එක්වන අපි ඔහුට අපගේ විප්ලවීය උත්තමාචාරය පුදකර සිටිමු.

අධිරාජ්‍යවාදයේ පිළිකන්නක් බවට පත්කරනු ලැබ දරිද්‍රතාවයේ, නූගත්භාවයේ පත්ලටම ගිල්වා තිබූ කියුබානු ජනතාවත් රටත් වත්මන් ලෝකයේ ඉහළම සමාජ ආර්ථික දර්ශකයන් වෙත ඔසවා තැබීම වෙනුවෙන් ඔහුගේ දායකත්වය කිසිවෙකුටත් අමතක කළ නොහැක. හුදු කියුබාවට පමණක් සීමා නොවූ ඔහුගේ නායකත්ව භූමිකාවේ බලපෑම ආසියානු, අප්‍රිකානු හා ලතින් ඇමරිකානු විප්ලවාදී හා වාමාංශික ව්‍යාපාරයන්ටද පොදුවේ මෑත කාලීන ලෝක දේශපාලනය හැඩගැන්වීමේලාද කරන ලද්දේ අති මහත් බලපෑමකි. නිරවි යුද සමයේ සමාජවාදී කඳවුරේ ප්‍රබල නායකයෙකු වූ ඔහු 90 දශකයේ මුල සෝවියට් කඳවුරේ බිඳවැටීමෙන් පසුද සමාජවාදයේ ධජය අත් නොහැර 'සමාජවාදය නැත්නම් මරණය' සටන් පාඨය තුළ කියුබානු ජනතාවට ජයග්‍රහණ අත්පත් කරදීම සඳහා ලබාදුන් නායකත්වය කියුබානු ජනතාව කිසිදා අමතක නොකරනු ඇත.

වියපත් වී ක්‍රියාකාරී දේශපාලනයෙන් ඉවත් වූ පසුවද ලෝක සමාජ ආර්ථික දේශපාලනික සිදුවීම් සම්බන්ධයෙන් තම විදග්ධ දේශපාලන මතවාද ලිඛිත සටහන් මගින් ලෝක ජනතාව හමුවේ තැබූ ෆිදෙල් සහෝදරයා තම ජීවිතයේ අවසන් මොහොත දක්වාම විප්ලවාදීත්වයෙන් නොවැහැරුණු අසහාය අයෝමය නායකයෙකි. සියවසකට ආසන්න ඔහුගේ ජීවිතය තුළ ඔහු විසින් ගැඹුරින් සටහන් තබන ලද යුග පුරුෂ නායකත්වය තවත් සියවස් ගණනාවක් වුවද සමස්ත ලෝකවාසී ජනතාවගේ හදවත් තුළ නොමැකී රැඳෙනු ඇති බවට සැකයක් නැත.

ෆිදෙල් කස්ත්‍රෝ නම් අපේ කාලයේ අසහාය විප්ලවවාදියාගේ වියෝවීම වෙනුවෙන් ශෝක වන සමස්ත ලාංකේය පීඩිත ජනතාව සමග එක්වෙමින් ජනතා විමුක්ති පෙරමුණ ලෙස අපි අපගේ විප්ලවීය උත්තමාචාරය මෙසේ පුදකර සිටිමු.

# මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳ කෝප් වාර්තාව නිකුත්වීමෙන් පසු ගත යුතු හදිසි ක්‍රියාමාර්ග

**ජනතා විමුක්ති පෙරමුණ පසුගිය 09වැනිදා මාධ්‍ය හමුවක් පවත්වමින් දේශපාලන මණ්ඩලයේ නිවේදනයක් ප්‍රකාශයට පත් කළේය. එම නිවේදනය සම්පූර්ණයෙන් මෙසේය.**

වත්මන් එජාප-ශ්‍රීලනිප හවුල් ආණ්ඩුව පිහිටවූ වහාම මහ බැංකු අධිපති ධුරයට අගමැතිවරයාගේ මිතුරෙක් වන අර්ජුන් මහේන්ද්‍රන් මහතා පත් කරන ලද අතර 2015 පෙබරවාරි 27වැනිදා මහ බැංකුව විසින් බැඳුම්කර නිකුත් කිරීමේදී විශාල වංචාවක් සිදුවිය. ඉන් රජයට විශාල මූල්‍යමය පාඩුවක්ද සිදුවිය. 2015 ජනවාරි 08 මහින්ද රාජපක්ෂ පාලනය නිමාකරමින් ප්‍රකාශයට පත්වූ ජනවරමේ ප්‍රධානම ඉල්ලීම වූයේ, වංචා-දූෂණ නතර කිරීමත් දූෂිතයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමත්ය. එහෙත් එම ජයග්‍රහණයේ උණුසුම මැකී යන්නටත් පෙර මහ බැංකුව විසින් බැඳුම්කර නිකුත් කිරීම හරහා මහා මූල්‍ය වංචාවක් සිදුකළ අතර එය ජනවරමට පයින් ගැසීමක් විය. මෙම වංචාව සිදුවූ වහාම ඒ පිළිබඳ මුලින්ම රටට හෙළිකරනු ලැබුවේ ජවිපෙ විසිනි. ඉන් නොනැවතී ජවිපෙ ඉල්ලා සිටියේ එම වංචාව පිළිබඳව වහාම පරීක්ෂණයක් කරන ලෙසත් ඊට ඉඩ සැලසීම සඳහා හිටපු මහ බැංකු අධිපතිවරයා එම ධුරයෙන් තාවකාලිකව හෝ ඉවත් කරන ලෙසත්ය. එහෙත් ඒ කිසිවකට ආණ්ඩුව ඇහුම්කන් දුන්නේ නැත. මෙම බැඳුම්කර වංචාව යට ගැසීමට ආණ්ඩුවත් විශේෂයෙන් අගමැතිවරයාත් විසින් උත්සාහ ගනු ලැබූවද මේ පිළිබඳ පරීක්ෂණ කෝප් කමිටුව හෙවත් පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභාව වෙත පවරා ගැනීම හේතුවෙන් මෙම වංචාව යට ගැසීමට නොහැකි විය.

මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳ කෝප් කමිටුව විසින් සිදුකළ පරීක්ෂණ හා විමර්ශනවලින් අනතුරුව එහි අවසන් වාර්තාව සකස් කිරීමට යාමේදීද වාර්තාව දුර්වල කිරීමට කෝප් කමිටුව තුළ සිටින එජාපය නියෝජනය කරන කමිටු සාමාජිකයන් විසින් උත්සාහ දරන ලද බව රහසක් නොවේ. එම උත්සාහය අසාර්ථක වූ විට දැන් මහ බැංකු බැඳුම්කර වංචාව ගැන ජනතාව නොමඟ යවන විවිධ මත ප්‍රකාශ කරන ඔවුන් හා ආණ්ඩුව ඒ අතරම මේ පිළිබඳව ගතයුතු ක්‍රියාමාර්ග නොගෙන සිටී. ඔවුන් දැන් උත්සාහ කරන්නේ බැඳුම්කර වංචාව හුදු නිලධාරීන් මත පමණක් පටවා ආණ්ඩුවත් අගමැතිවරයාත් එකී වගකීමෙන් මුදා ගැනීමටය.

මහ බැංකු බැඳුම්කර වංචාවට සෘජු ලෙසම සම්බන්ධ වී සිටින්නේ, හිටපු මහ බැංකු අධිපතිවරයාත් මහ බැංකුවේ නිලධාරීන් කිහිප දෙනෙකුත් පර්පචුවල් ට්‍රෙෂරීස් ආයතනයත් වුවද මේ වංචාව පිළිබඳ වගකීමෙන් මිදීමට ආණ්ඩුවටත් විශේෂයෙන් අගමැතිවරයාටත් හැකියාවක් නැත. විශේෂයෙන් අගමැතිවරයා විසින් මෙහි දේශපාලන වගකීම බාරගත යුතුව තිබේ. ඒ, පසුගිය කාලය පුරා ඔහු මේ සම්බන්ධයෙන් ක්‍රියාකළ ආකාරය අනුවය.

- පොදුවේ මුදල් අමාත්‍යාංශය යටතේ පැවැති මහ බැංකුව නව ආණ්ඩුව පිහිටුවීමත් සමඟ අගමැතිවරයා විසින් තමන් යටතට පවරා ගැනීමත්

15වැනි පිටුවට

# ජ.වි.පෙ.ට එරෙහි...

01 පිටුවෙන්

වත්මන් මෛත්‍රී-රනිල් ආණ්ඩුවේ මහා පරිමාණ වංචා දූෂණ හෙළිදරව් කරමින් ඊට එරෙහිව ක්‍රියාත්මක වීමත් සමඟ වත්මන් ආණ්ඩුවේ දූෂිත ඇමතිවරුන් ඇතුළු විවිධ කණ්ඩායම් විසින් ජ.වි.පෙ.ටත් එහි නායකත්වයටත් එරෙහිව සාහසික බොරු සහ අවලාද ව්‍යාපාරයක් ආරම්භ කර තිබේ.

මේ සඳහා එ.ජා.ප. ආණ්ඩුවේ ඇතැම් දූෂිත පුද්ගලයින්ට හිතවත් අන්තර්ජාල වෙබ් අඩවිද ඒවායින් වැටුප් ලබන කුලීකරුවන්ද විවිධාකාරයෙන් ක්‍රියාත්මක වෙමින් සිටින බව අනාවරණය වී ඇත. එකිනෙකාගේ දූෂණ වංචා සඟවා ගැනීම වෙනුවෙන් හා යටපත් කරගැනීම වෙනුවෙන් දූෂිත රාජපක්ෂ කල්ලියේ සහයෝගයද මේ සඳහා ලබාගැනීමට ඔවුහු උත්සුක වී සිටිති.

ආණ්ඩුවේ වංචා දූෂණ සිදුවීම් හෙළිදරව් කෙරෙන විට ඒවාට සම්බන්ධ ඇතැම් ඇමතිවරුන් ජ.වි.පෙ.ට එරෙහි මඩ ව්‍යාපාර සැලසුම් කර ඇති අතර ඔවුන්ගේ අරමුණ වී ඇත්තේ, ඔවුන් ජනතාව ඉදිරියේ දේශපාලනිකව නිරුවත්වීම හේතුවෙන් ඇතිවන කෝපය ජ.වි.පෙ.ට එරෙහි අවලාද නැගීම මගින් මුදාහැරීමය.

එසේම වත්මන් ආණ්ඩුවටත් රාජපක්ෂ කල්ලියටත් ධනපති පාලනයටත් එරෙහිව නව ජනතාවාදී පාලනයක් සඳහා ජ.වි.පෙ. ගොඩනඟමින් සිටින ජනතා මධ්‍යස්ථානය වෙත විවිධ ජන කණ්ඩායම් හා බලවේගවල සහයෝගය වැඩිවෙමින් තිබීමත් ජ.වි.පෙ. කෙරෙහි ජනතාවගේ විශ්වාසය වර්ධනය වෙමින් තිබීමත් හමුවේ ජ.වි.පෙ. පිළිබඳ ජනතා විශ්වාසය බිඳදැමීමද මෙම අවලාදකරුවන්ගේ අරමුණක් වී තිබේ.

මේ පිළිබඳව කරන ලද විමසුමකදී නියමුවා වෙත අදහස් දැක්වූ ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, ගැටලුවලින් පීඩාවට පත් ජනතාවට විසඳුම් පතා විශ්වාසය තැබිය හැකි එකම පක්ෂය ජ.වි.පෙ. බවට පත් වෙද්දී සියලු ප්‍රතිගාමීන් කලබලයට පත්වීම තේරුම් ගත හැකි බව පැවසීය. මෙම බංකොලොත් දූෂිත පුද්ගලයින්ගේ සාහසික අවලාදවලින් ජ.වි.පෙ. ගමන නතර කළ නොහැකි බව ඔවුන් දැන ගත යුතු අවධාරණය කළ විජිත හේරත් සහෝදරයා, ජනතාව තවදුරටත් මෙම අවලාද නොපිළිගන්නා බවත් ඒවා පිළිකෙව් කරන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# වෙනස් විය යුත්තේ ජනතාවයි!



**ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති, ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා**

***නියමුවා:- 2017 වසර වෙනුවෙන් ආණ්ඩුව අයවැයක් ඉදිරිපත් කළා. මේ අයවැය කා වෙනුවෙන්ද?***

***ලාල් කාන්ත සහෝදරයා:-*** ආණ්ඩුව කියනවා, අයවැයක් ඉදිරිපත් කළා කියලා. ආණ්ඩුවට මේක අයවැයක් තමයි. නමුත් මේ රටේ ජනතාවට මේක වැයක් පමණයි. ඔවුන්ට ආදායම් නැහැ. මීට කලින් ලංකාවේ කුමන ආණ්ඩුවක් කුමන අයවැයක් ඉදිරිපත් කළත් බදු, දඩ ගහපු චෝදනා වසා ගන්න, ජනතා විරෝධීභාවය සඟවා ගන්න ජනතාවට ආදායම් ලැබෙන ක්‍රම ගැන කිවුවා. මෙවර අයවැයේ යෝජනාවලදීවත් පාර්ලිමේන්තුවට මේක ඉදිරිපත් කරද්දිවත් මේ දවස්වල යන විවාදෙදිවත් ආණ්ඩුවෙ එක කථිකයෙක්වත් ජනතාවට ආදායම් ලැබෙන විදිහක් කියන්නෙ නැහැ. ඇත්තටම කියන්න බැරි මේකෙ එහෙම එකක් නැති නිසා.

මේක ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යන වැඩපිළිවෙළ. ඒක විකිණීම, අධික දඩ, අධික බදු මත පදනම් වුණු වැඩපිළිවෙළ. ආදායම් නොමැතිව වියදම් පමණක් වැඩි වීම නිසා සාමාන්‍ය ජනතාවට ජීවත්වෙන එක අභියෝගයක් කරන වැඩපිළිවෙළ. ආණ්ඩුව තවත් අවුරුද්දක් රෝලක් ගහගන්න කියවන වැඩපිළිවෙළ.

***නියමුවා:- ආණ්ඩුව අයවැයට සති දෙකකට පෙර වැට් බදු පනවා අයවැයෙන් ජනතාව මත තවත් බදු පැටෙව්වා. මේ බදු බර ජනතාව කොහොම දරාගනීද?***

***ලාල් කාන්ත සහෝදරයා:-*** මේ අයවැය ඇතුළෙ ස්ථිර ආදායම් ලබන ලබන හැමෝම බරපතළ ආර්ථික අර්බුදයකට ඇදගෙන වැටෙනවා. ස්වයං රැකියා කරන මේසන් බාසුන්නැහැ, වඩු බාසුන්නැහැ, කොණ්ඩෙ කපන කෙනා කීයක් හරි වැඩිකර ගනී. නිෂ්පාදකයා පිරිවැයට අනුව මිල තීරණය කර ගනීවි.

මේ අයවැයේ දැවැන්තම අවිධිමත් ක්ෂේත්‍රයේ අයට යම් දුරකට එහෙම කරගන්න පුළුවන්. නමුත් ආයතනික ගත විධිමත් ක්ෂේත්‍රවල අයට, එනම් රාජ්‍ය සේවකයින්ට, පෞද්ගලික අංශයේ සේවකයින්ට, ස්ථිර ආදායම් ලබමින් සිටින අයට, ගොවියාට තමන්ගේ ජීවිතයේ බරපතළ දුෂ්කරතාවයන්ට මුහුණදීමට සිදුවනවා, ආදායම් වැඩිවීමේ මාර්ග මෙම අයවැයේ නැති නිසා. සෙසු අය බදු, දඩ වැඩි වෙනකොට තමන්ගෙ ආදයම් වැඩි කර ගනීවි. 150/-ට කොණ්ඩෙ කපපු කෙනා 200/-ක් කරගනීවි.

> "මේ අයවැය ජනතාවට අවාසිදායකයි, හානිකරයි. විකිණීම, අධික දඩ, අධික බදු හමුවේ රාජ්‍ය අංශයේ පෞද්ගලික අංශයේ වැඩකරන ජනතාව සටන් මඟට පිවිසේවි. ඒ ක්ෂේත්‍රයන් නායකත්වය ගත් අරගලයක් එනවා. අනෙකුත් පීඩාවට පත්වෙන ජනතාවටත් යුතුකමක් තියෙනවා ඒ අරගලයත් එක්ක එකතු වෙලා සටන් කරලා ජයග්‍රහණ ලබාගන්න."

ප්‍රහාරය එල්ල වී තිබෙන්නේ ස්ථිර ආදායම්ලාභීන්ටයි. මේ කතා කරන මොහොත වන විටත් අයවැයට අදාළ විවාදය පැවැත්වෙමින් තිබෙනවා. අපි ආණ්ඩුවට කියන්නේ පුළුවන්නම් මේ අයවැයෙන් මිනිසුන්ගේ ආදායම් ඉහළ යන විදිහ කියන්න. ඇත්තටම එහෙම එකක් නැහැ. මේ වැය බර ජනතාවට දරාගන්න බැහැ. ඔවුන්ට කලින් පාලනය එපා වුණා වගේම දැන් ඉන්න කණ්ඩායම් දෙකත් එපා වේවි. ඔවුන්ට තමන්ගේ ජීවිතය වෙනුවෙන් සටන් මඟට එන්න සිදුවේවි.

ජනතාවට වගකීමක් තියෙනවා, මේ අයත් එක්ක මේ ගමන යන්න බැහැ කියලා තේරුම් ගන්න. ඔවුන් සාම්ප්‍රදායික පක්ෂවලින් ගැලවිලා පැමිණිය යුතුයි. වෙනස් සමාජ ආර්ථික ක්‍රමයක් තෝරා ගත යුතුයි. ඇතිවී තිබෙන තත්වය පාලකයින්ගේ වැරැද්ද නෙමෙයි. මේ පාලකයින්ට දොස් කියා පළක් නැහැ. ඔවුන්ගේ ආර්ථික ප්‍රතිපත්තිය ඔවුන් ක්‍රියාත්මක කරනවා. ඒ නිසා බ්‍රෙෂ්ට් කිවුවා වගේ මෙවැනි පාලකයින් බලයට ඒමේ වරද ජනතාවගේ. මේ පාලකයින් පත්කරගෙන ඔවුන්ට දොස් තැබීමෙන් පළක් නැහැ. මේ සමාජ ආර්ථික ක්‍රමයත් මේ පාලකයොත් පරදවන්න අවශ්‍යයි කියන එක මේ ජනතාව තේරුම් ගත යුතුයි. වෙනස් විය යුත්තේ ජනතාවයි. ජනතාව මාරු කළ යුතු යැයි බර්ටෝල්ඩ් බ්‍රෙෂ්ට් කිවුවේ ඒකයි.

ගැටලුවට විසඳුම ජනතාව වෙනස් වීම පමණයි. මේ රටේ බුද්ධිමතුන්ගේ, කලාකරුවන්ගේ වගකීම වන්නේ මේ ජනතාව වෙනස් කිරීමේ කටයුත්තයි. තමන්ගේ බලය හඳුනාගත් පුරවැසියන් ගොඩනැගීමයි.

***නියමුවා:- අයි.එම්.එෆ්. වට්ටෝරුව මුදල් ඇමතිවරයා නැවතත් පුනරුච්චාරණය කරමින් සිටිනවා. රාජ්‍ය ආයතන විකිණීමට යෝජනා කරනවා. සෞඛ්‍ය හා අධ්‍යාපන සේවා පෞද්ගලීකරණය දිරිගන්වන යෝජනා ඇතුළත්. මේ ක්ෂේත්‍ර තුළ වැඩකරන ජනතාව මේ තත්වයට මුහුණ දෙන්නේ කොහොමද?***

***ලාල් කාන්ත සහෝදරයා:-*** මේ ආණ්ඩුවෙ ප්‍රතිපත්තිය තමයි රජය නිෂ්පාදනයට සම්බන්ධ නොවිය යුතුයි කියන එක. නිෂ්පාදනය කියන්නේ භාණ්ඩ හා සේවා. විශේෂයෙන් අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍ර ගත්තොත් රජය එම සේවාවලින් ඉවත්වෙමින් තිබෙනවා. අයවැය ගෙනත් තිබෙන්නේ ඒ ප්‍රතිපත්තියට අනුවයි. ඒ අනුව සෞඛ්‍යයට මුදල් කප්පාදු කර තිබෙනවා. අධ්‍යාපනයට, කෘෂිකර්මයට අඩුකර තිබෙනවා. ආණ්ඩුවේ අරමුණ ඒ ඔස්සේ ඉදිරියට යාමයි. තමන්ගේ ප්‍රතිපත්ති නිසා මිනිසුන් කොපමණ සංඛ්‍යාවක් ප්‍රතිකාර නොමැතිව මියයාවිද, කී දෙනෙකුට රස්සා නැතිවේවිද, ළමුන් කී දෙනෙක් අධ්‍යාපනයෙන් පිටමං වේවිද, ගොවීන් කී දෙනෙක් දිවි නසා ගනීවිද කියන එක ආණ්ඩුවට වැදගත් නැහැ.

මේ අයවැය ජනතාවට අවාසිදායකයි, හානිකරයි. විකිණීම, අධික දඩ, අධික බදු හමුවේ රාජ්‍ය අංශයේ පෞද්ගලික අංශයේ වැඩකරන ජනතාව සටන් මඟට පිවිසේවි. ඒ ක්ෂේත්‍රයන් නායකත්වය ගත් අරගලයක් එනවා. අනෙකුත් පීඩාවට පත්වෙන ජනතාවටත් යුතුකමක් තියෙනවා ඒ අරගලයත් එක්ක එකතු වෙලා සටන් කරලා ජයග්‍රහණ ලබාගන්න. 2017 ජනවාරියේ මේ අයවැය ක්‍රියාත්මක වෙනකොට සමස්ත ජනතාවට සටන් මඟට පිවිසෙන්න සිදුවේවි. ඒත් මේ ප්‍රතිපත්තිවලට එරෙහි සටන්වලට අවසන් ජයග්‍රහණ ලබා ගත හැක්කේ දේශපාලන සටන් බිමකදී පමණයි. සමස්ත ජනතාව දේශපාලන පෙරමුණේදී තමන්ට ලැබෙන පළමු අවස්ථාවේදීම මේ ආණ්ඩුවල ජනතා ද්‍රෝහී ප්‍රතිපත්තිය පරාජය කළ යුතුයි.

***නියමුවා:- මේ මොහොතේ වැඩකරන ජනතාව වගේම සමස්ත ජනතාව පොදු සටනක් වෙත කැඳවනු ලැබ තිබෙනවා. බල හුවමාරුවක් වෙනුවෙන් වූ පුළුල් ජන බලවේගයක් ගොඩනැගීමේ***

**15 වැනි පිටුවට**

# අලුත් හොරෙක්ද? අලුත් සමාජයක්ද?

පසුගිය දිනවල වේදිකා නාට්‍යයක ප්‍රචාරක පෝස්ටරයක් බොහෝ තැන්වල අලවා තිබුණි. එහි සඳහන් වූයේ "අලුත් හොරෙක් ඕනෑකර තිබේ" යනුවෙනි. වර්තමාන ලංකාවේ දේශපාලනය තුළද මෙය දැකිය හැකිය. ඒ ධනවාදයට අලුත් නායකයෙක් හෙවත් අලුත් හොරෙක් සෙවීමේ උත්සාහයයි.

මේ වනවිට මෙතෙක් ලංකාව පාලනය කළ හා පාලනය කරමින් සිටින සියලුම ධනපති නායකයෝ අසාර්ථකත්වයට පත්ව සිටිති. මහින්ද රාජපක්ෂ සිය වසර 9ක දේශපාලනය තුළ අසාර්ථකත්වයට පත්වූ අතර ඒ නිසාම 2015 ජනවාරි පරාජයට පත්වූයේ නැවත බලයට ඒමට ඉඩ අහෝසි කර ගනිමිනි. වර්තමානයේ රට පාලනය කරන මෛත්‍රී-රනිල් දෙදෙනාම තම පාලනයට වසර 2ක් ගතවන විට අසාර්ථකත්වයට පත්ව සිටිති. දැන් ධනපති ක්‍රමය අලුත් මුහුණක් සොයන්නේ ඒ නිසාය. මහින්ද රාජපක්ෂට ඇඳුම් අන්දවා නැවත ගෙන ඒමට තවමත් සමහරු උත්සාහ දැරූවද එය කළ නොහැක්කක් බවට බවට පත්ව තිබෙන්නේ ඔහු ජනතාවට එපා වූ නායකයෙක් වීම නිසා හා 19වැනි සංශෝධනයට අනුව ඔහුට නැවත ජනාධිපතිවරණයකට ඉදිරිපත්වීමට නොහැකි නිසාය. (මෙය මෙසේ වන්නේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි නොවීමේ ඉඩකඩ වැඩි තත්වයක් තුළය.)

මේ තත්වය තුළ දැන් ධනවාදය පවත්වා ගැනීමට නම් අලුත් මුහුණක් අවශ්‍යය. අලුත් නායකයෙක් හෙවත් "අලුත් හොරෙක්" අවශ්‍යය. ඒ හොරුන්ගේ පැත්තෙනි. ධනපති ක්‍රමය යනු හොරකම නීත්‍යානුකූල කළ ක්‍රමයකි. ධනවාදය තුළ හොරාකන නීත්‍යානුකූල ක්‍රමය හඳුන්වන්නේ "සූරාකෑම" ලෙසය. ධනවාදය තුළ "පෞද්ගලික දේපළ යනු සොර බඩුවලට තවත් නමක් වේ." යනුවෙන් ප්‍රංශ මනෝරාජික සමාජවාදියෙකු වූ පියෙර් ජෝෂප් පෲඩන් පැවසුවේ මේ නිසාය. එකී ධනවාදය මේ වනවිට තවත් පිරිහී තිබේ. එහි නීත්‍යානුකූල හොරකමට අමතරව පාලක කණ්ඩායම් සිය රාජ්‍ය බලය යොදවා කරන මහා පරිමාණ මහජන මුදල් කොල්ලකෑම්ද තිබේ. ලංකාව වැනි රටවල ආණ්ඩුවක් යනු හොර නඩයකි. ඔවුන්ගේ අරමුණ බලය තිබෙන කාලය තුළ කොමිස්වලින්, කොන්ත්‍රාත්වලින්, විවිධ මගඩිවලින් මහජන මුදල් හොරකම්කර පෞද්ගලිකව ගොඩගසා ගැනීමය. වර්තමානයේ මහබැංකු බැඳුම්කර මගඩියේ සිට ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ට මසකට රු. ලක්ෂ 7 ගණනේ කුලියට වාහන ගැනීම දක්වා පුළුල් පරාසයක මෙය සිදුවේ. මේ ක්‍රියාවලියේදී ආණ්ඩුවේ කණ්ඩායමට නායකයෙක් සිටින අතර ඔහු රටේ නායකයා බවට පත්වේ. ඒ සමඟ ඔහු හොර රැළක නායකයා බවටද පත්වේ. ඇත්ත එයයි.

ධනවාදය තුළ බලය සඳහා පොරකන හොරු රැළට අවශ්‍ය රට හැදීම නොව හැකි තරම් හොරකම් කිරීමය. ඒ සඳහා ඔවුන්ට නායකයෙක් අවශ්‍ය වේ. මෙය අත්‍යවශ්‍ය වන්නේ, රට පාලනය කරමින් සිටින කණ්ඩායමේ නායකයා හෝ නායකයින් ජනතාවගේ විරෝධයට ලක්ව, ඔවුන්ට තවදුරටත් ජනතා විශ්වාසය දිනාගැනීමට නොහැකි වන තත්වය තුළය. ඔවුන් ඊළඟ වටයේ පරාජයට පත්වීමට නියමිත තත්වය තුළය. රට පාලනය කරන කණ්ඩායමේ නායකයින් ජනතාවගෙන් ප්‍රතික්ෂේප වනවිට ඒ වෙනුවට ජනතා විශ්වාසය දිනාගත හැකි අලුත් මුහුණක් ඕනෑ වේ. මේ මෙහොතේ ලංකාවේ දේශපාලනය තුළ උභතෝකෝටිකයක් පවතී. ඒ රට පාලනය කරන මෛත්‍රී-රනිල් හවුල ජනතාවට එපාවන විට ඊට විකල්ප ලෙස කලින් පැරදුණු මහින්ද රාජපක්ෂ යළි ගෙනඒමට නොහැකිවී තිබීමය. අලුත් නායකයෙක් හොයන්නේ ඒ නිසාය. දැන් පරාජය වී සිටින හොරු රැළ තම අලුත් නායකයා ලෙස ගෝඨාභය රාජපක්ෂ ගෙන ඒමට පිඹුරුපත් සකසන්නේ මෙම අර්බුදයෙන් ගොඩවීම සඳහාය.

අර්බුදයෙන් අර්බුදයට ගිය ධනවාදය තුළ පීඩාවට පත්ව සිටින, කොල්ලකෑමට හා රැවටීමට ලක්ව සිටින පොදු ජනතාවට දැන් අවශ්‍ය වන්නේ කුමක්ද? ඒ පරණ හොරු රැළට නායකත්වය දීමට අලුත් හොරෙක් නොව, හොරකම හා ජඩකම තම පැවැත්ම කරගත් දුෂ්ට ධනපති ක්‍රමය වෙනස්කර ඒ වෙනුවට අලුත් සමාජයක් නිර්මාණය කර ගැනීමය. දැන් අබලන්ව ඇති, කල් ඉකුත්වූ සමාජක්‍රමයක් වන ධනවාදයට "හොඳ නායකයින්" නිර්මාණය කිරීමට නොහැකිවාක් මෙන්ම "හොඳ නායකයින්ට" ධනවාදය තුළ කළ හැකි දෙයක්ද නැත. මන්ද ධනවාදය ඉල්ලා සිටින්නේ, ධනවාදයට ගැලපෙන්නේත් හොරු කණ්ඩායමකට නායකත්වය දිය හැකි කෙනෙක් නිසාය.

ධනවාදී පාලනයට අලුත් හොරෙක් ආ පමණින් කිසිවක් වෙනස් වන්නේ නැත. හොරකමට අලුත් මුහුණක් දීමට පවා දැන් ධනවාදය අසමත්ය. එකම හොර නඩයක් දෙපැත්තට පැන පැන පාට පක්ෂ මාරු කරමින් සිටින අතර කුමන හොර නඩය බලයට ආවද ජනතාවට අත්වන්නේ එකම ඉරණමකි. හොරුන්ගේ ක්‍රමය වෙනස් කිරීමට ජනතාව අදිටන් කරගත යුත්තේ ඒ නිසාය.

අපේ රටේ ඉතිහාසයේ විශාලතම වංචා-දූෂණ හා මහජන මුදල් නාස්තියට දායකවී හොරකමේ කප් ගසා සිටින මෙම හොර නඩ දෙකම පරදා ඉන් රට මුදාගෙන නව දේශපාලන ගමනක් යාමටත් ඒ සඳහා නව නායකත්වයක් යටතේ නව සමාජයක් ගොඩනැගීමට දැන් ජනතාව සූදානම් විය යුතුය. දැන් ජනතාව ඉල්ලා සිටිය යුත්තේ ධනවාදයට අලුත් නායකයෙක් හෙවත් අලුත් හොරෙක් නොව ධනවාදයට විකල්ප අලුත් සමාජ ක්‍රමයකි. එය ගොඩනැගිය හැක්කේ ජ.වි.පෙ. නායකත්වයෙන් පමණි.



YES WE CAN

# තාරුණ්‍යයේ බලාපොරොත්තු හා අයවැය

හැමදාමත් මෙන්ම මෙවරද ඉදිරිපත්වී ඇති ඇයවැය ජනතාව මත බදුබර පටවමින් ජනතාව පෙළන තවත් අයවැයක් වී ඇත. වත්මන් ආණ්ඩුව බලයට පත්වීම සඳහා උදවු කළ පිරිස අතර තරුණයන් ප්‍රමුඛ පිරිසක් වූ අතර වත්මන් ආණ්ඩුව බලයට පත්වන විට තරුණයන් උදෙසා ලබා දුන් පොරොන්දු රැසකි. රැකියා ලබාදෙන බවට ලබාදුන් පොරොන්දුව, තරුණයන්ට නොතෙමී යාමට කාර් ලබාදෙන බවට ලබාදුන් පොරොන්දුව හා නොමිලේ අන්තර්ජාල පරිහරණයට Free Wi-Fi කලාප පිළිබඳ ලබාදුන් පොරොන්දුවද ඒ අතර ඉදිරියෙන් තිබුණි. මෙවර අයවැය ආණ්ඩුව බලයට පත්ව ඉදිරිපත් කරන දෙවන අයවැය වුවද තරුණයන් වෙනුවෙන් මේ දක්වා එකදු පොරොන්දුවක් වත් ඉටුකර නොමැත. විදිමත් රැකියා ලබාදීමක් කෙසේවත් සිදුනොවුනු අතර පුරප්පාඩුවක් පිරවීමද සිදුකළේ දේශපාලනඥයින්ගේ හිතවත්කම් මතය. මෙවර අයවැයේදී පසුගිය අයවැයට වඩා උසස් අධ්‍යාපනයෙන් රුපියල් බිලියන 4ක් කප්පාදු කර ඇති අතර වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයෙන් රු. බිලියන 3.1 ක් කප්පාදු ඇත. පසුගිය වසරට වඩා මේ වසරේ සමස්ත අධ්‍යාපනයෙන් රු. බිලියන 33ක් කප්පාදු කර ඇත. මෙයින් ආණ්ඩුවේ රැකියා ප්‍රතිපත්තිය කුමක්දැයි හරියටම පැහැදිලි වේ.

Free Wi-Fi කලාප වෙනුවට අද ඇත්තේ සිටවූ බෝඩ් ලෑලි පමණකි. ඒ වෙනුවට දුරකථන හා අන්තර්ජාල ගාස්තු මත තිබූ බදු ප්‍රමාණය දෙගුණයක් කිරීම අයවැයට කලින්ම සිදුකළේය. මේ අයවැයෙන් වෙනමම අන්තර් ජාලසේවා මත 50% ක බද්දක්ද යෝජනාකොට ඇත. තරුණයන්ට අද වනවිට ආහාර, අදුම්, නිවාස මෙන්ම දුරකථනය හා අන්තර්ජාලය අත්‍යාවශ්‍ය දේ බවට පත්ව ඇති බව නොරහසකි. නමුදු ආණ්ඩුව සිදුකළේ තරුණ වුවමනාවන්ට පස්ස හැරවීමකි. කාර් ලබාදෙන්නට කතා කළ අණ්ඩුව මෙවර අයවැයෙන් තරණයන්ට බයිසිකලයක් හෝ ත්‍රීවිලරයක් ලබාතැනීමට තිබූ අවස්ථාවටද වැට බැඳදමා ඇත්තේ ඒ සඳහා ලබාදුන් ලීසිං පහසුකම 50% සහ 75% ප්‍රමාණයකට ඉහළ දමමිනි. තරුණයන් ගැන තවදුරටත් ආණ්ඩුව නොසිතන බවට හොඳටම පැහැදිලිය. පසුගිය ආණ්ඩු මෙන්ම වත්මන් ආණ්ඩුවද පළමුව අමතක කරදැමු පිරිස තරුණයන්ය.

ලාංකේය සමාජය තුළ බලයට පත් හැම ආණ්ඩුවක්ම සිදුකළේ ඉහත ක්‍රියාදාමයම බව තරුණ අපට නොරහසකි. අයිතිවාසිකම් කප්පාදුව වඩා වඩාත් තිව්‍ර කරමින් පවතින වත්මන් ආණ්ඩුව හමුවේ ලාංකේය භූමිය මත වරප්‍රසාද නොලබන පිඩාවට පත් සිංහල, දමිළ, මුස්ලිම් තරුණ තරුණියන් අප සියලු දෙනාම තම අයිතිවාසිකම් දිනාගැනීම වෙනුවෙන් එක පෙරමුණකට පැමිණිය යුතු කාලය දැන් උදාවී ඇත.

# බාහිර උපාධි අධ්‍යාපන කප්පාදුවට එරෙහි අරගලය...

සෑම අවුරුද්දක් පාසාම මෙරට අධ්‍යාපන ක්‍රියාවලිය තුළ සිසුන් 250,000කට ආසන්න ප්‍රමාණයක් උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටී. එසේම ඉන් සිසුන් 150,000ක් පමණ විභාගය සමත් වුවද ඒ අතරිනුත් විශ්වවිද්‍යාල ප්‍රවේශ වරම් හිමිවන්නේ 25,000කටත් අඩු පිරිසක් සඳහා පමණි. එහෙයින් අපේ රටේ අධ්‍යාපන ක්‍රියාවලිය තුළ පවතින ඉඩපහසුකම් අවම වීම මත සෑම වසරකදීම 125,000ක් පමණ සිසුන් ප්‍රමාණයක් අසාධාරණයට ලක් වේ. මෙසේ අසාධාරණයට ලක් වන සිසුන්ගෙන් කොටසකට හෝ තම උපාධි සිහිනය සැබෑ කරගැනීම සඳහා තිබූ එකම අවස්ථාව වන්නේ බාහිර උපාධිය ලබා ගැනීමයි.

එහෙත් මෙම බාහිර උපාධිය සඳහා වන පාලකයින්ගේ කෙනෙහෙලිකම්වල අඩුවක් නැත. වත්මන් ආණ්ඩුව විසින් නිකුත් කර ඇති 2016/13 නැමැති චක්‍රලේඛනය මගින් බාහිර උපාධිය සඳහා සිසුන් බඳවා ගැනීමට සීමා පනවා ඇති අතර සිසුන් ප්‍රමාණය කප්පාදු කිරීම සඳහා පිඹුරුපත් සකසා ඇත. එහෙත් අපේ රටේ දුප්පත් දෙමව්පියන්ට, දරුවන්ට මෙන්ම රැකියාවේ උසස්වීමක් බලාපොරොත්තුවෙන් සිටින උපාධියක් අහිමි සියලු දෙනාටත් මෙම බාහිර උපාධිය ඉතා වැදගත්ය. එහෙයින් අද ඔවුන් සියලු දෙනාම තම අධ්‍යාපන අයිතිය ඉල්ලා පාරට බැස ඇත. වසර ගණනාවක් පුරා පෙරුම්පිරූ උපාධි සිහිනය ඇස් පනාපිටම සුණුවිසුණු කර දැමීමට ඉඩ නොදී දහස් ගණන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අද පාරට බැස ඇත. ඒ තම අධ්‍යාපන අයිතිය වෙනුවෙනි.

එහෙයින් සියල්ලන්ගේම නිදහස් අධ්‍යාපන අයිතිය වෙනුවෙන් හැමදාමත් සිය සහයෝගය පළ කරන සමාජවාදී තරුණ සංගමයේ මැදිහත් වීමෙන් හා තවත් සංවිධාන ගණනාවක එකතුවෙන් පිහිටුවා ඇති බාහිර උපාධි සුරැකීමේ සංවිධාන එකතුව විසින් පසුගිය කාලය පුරාම දිවයිනේ විවිධ දිස්ත්‍රික්ක හා නගර පුරා තම අධ්‍යාපන අයිතිය වෙනුවෙන් අරගල කිරීමට පටන් ගෙන ඇත. කොළඹ, මාතර, කලුතර, බදුල්ල, බණ්ඩාරවෙල, ඇඹිලිපිටිය, අම්පාර, පොළොන්නරුව, මාතලේ, තංගල්ල, මොණරාගල, කෑගල්ල හා ගාල්ල ආදී විවිධ ස්ථානවලදී පැවති විරෝධතා, පාගමන් හා පෙත්සන් අත්සන් කිරීම් මෙන්ම වීදිනාට්‍ය දැක්ම සඳහා සිසු සිසුවියන් මෙන්ම, තරුණ තරුණියන්ද, ගුරුවරුන් හා දෙමව්පියන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූ අතර සමහර අවස්ථාවලදී පොලීසියේ බාධාකිරීම් සහ විවිධ කඩාකප්පල් කිරීමේ උත්සාහයන්ද සිදුකෙරුණ ද ඒ කිසිවකින් හෝ නොනැවතී බාහිර උපාධිය රැකගැනීමේ සටන තවමත් ක්‍රියාත්මකය.

අරගලයෙන් තොර ජයග්‍රහණ නොමැති බව අපි දනිමු. එහෙයින් මේ කිසිවකට හෝ බිය නොවී, නොරැවටී, අතරමැද සාමදානවලින් තොරව අසාධාරණයට පත්වන සෑමට සාධාරණය ඉටුවන තුරු මේ සටනට නායකත්වය දීමට සමාජවාදී තරුණ සංගමය සූදානම් බවත් ජයග්‍රහණයෙන් මිස කුමන බාධක හමුවේ වුව මෙකී සාධාරණ සටන අත්නොහරින බවත් සමාජවාදී තරුණ සංගමයේ අපි සහතික කරමු.

*දිවයිනේ විවිධ ප්‍රදේශවලදී පවත්වන ලද බාහිර උපාධි අධ්‍යාපන කප්පාදුවට එරෙහි අරගලයේ කාච සටහන්.......*















## තරුණ



අරගලය කියන වචනයවත් නොදන්න
මිනිස්සුන්ට...
කියා දෙන්න..
අරගලය..
කුණාටුවලට හසු නොවුණානම්
කොයින්ද අලුත් ගොඩබිම්..
ලියන්න මේසේ
ඉඳීන්න පුටුව නැති උන්ට..
දෙනවා පියානෝ..
මහ උන්..
හීනයක්
දකිනවා අපිත්
හැමෝමත්...
ලස්සන ලෝකයක් ගැන..
ඒ හීනෙට පණ දෙන්න
මට බෑ..
ඒත්..
අපිට පුළුවන්..
මේ ඇරයුම
හීන දකින අයට..
මේ රොකට්ටුවේ
තව ඉඩ බොහෝමයි..
තියනවා
අපිටත් ලයිසන්..
ඒ නැතත්...විස්වාස කරන්න "අපිව"..

*හෝ ගානා පොකුණ*

## නුදුටු ඇස

### බයෝ ඩීසල්

රුහුණු විශ්වවිද්‍යාලයේ සිසුන් පිරිසක් ඉවතලන පොල්කුඩු හා ඇල්ගී විශේෂයක් යොදාගනිමින් බයෝ ඩීසල් නිපදවීමට සමත් වී සිටිති. එය ලංකාව තුළ බලශක්ති අර්බුදයට හා විදේශ විනිමය රට තුළ ඉතිරිකර ගැනීමට විසඳුමක් ලෙස යොදාගත හැකි බවත් එම තාක්ෂණය සමාජගත කිරීමට සූදානම් බවත්, මේ වන විටත් පොල්තෙල් හා වැටඑඩරු යොදාගෙනද බයෝ ඩීසල් නිපදවා ඇති බවත් ඔවුහු පවසති. ඉන්ධන වෙනුවෙන් විශාල පිරිවැයක් දැරීමට සිදුව තිබෙන මෙවැනි කාලයක මෙම සොයාගැනීම කෙතරම් වැදගත්දැයි විස්තර කළයුතු නොවේ. නමුත් ඛෙදවාචකය වන්නේ විද්‍යාව හා තාක්ෂණය තුලින් ලබා ගන්නා ජයග්‍රහණ වල සැබෑ ප්‍රතිලාභ රටේ බහුතරයක් ජනතාවට නොලැබීමයි. ලාභ ලැබීම පමණක් අරමුණු කරගත් බහුජාතික සමාගම්වල කැමැත්තට හා වුවමනාවන්වලට අනුව හැසිරෙන පාලකයන්ගෙන් බලාපොරොත්තු විය හැක්කේද මෙය පමණි.


### ජාතිය අනතුරේ

ජාතිවාදී හැඟීම් ඇතිවන ලෙස ප්‍රකාශ නිකුත් කිරීම හා හැසිරීම මත පසුගියදා පොලිසිය විසින් තරුණයන් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනිනි. එක් අයෙක් සිංහල බෞද්ධ උරුමය වෙනුවෙනුත් අනෙකා මුස්ලිම් ජනතාවගේ අයිතිය වෙනුවෙනුත් ක්‍රියා කොට තිබේ. එක් ජාතිවාදයක් විසින් අනෙක් ජාතිවාදය පෝෂණය කරන බව ඉතිහාසයේ අත්දැකීම් අපට කියා පායි. ජාතිවාදියා තම ප්‍රතිවිරුද්ධ ජාතිවාදියාට මහත් සේ වෛර කරන බව පෙන්වූවද ඔහුගේ පැවැත්ම රඳා පවතින්නේ අනෙක් ජාතිවාදියාගේ ක්‍රියාකාරීත්වය මතය. බොහෝ ජාතිවාදීන් දැනුවත්ව මේ සූදුව කරන අතර ඊට නොදැනුවත්ව ගොදුරුවන්නෝද සිටිති.

පාලකයින් නිතරම පොදු ප්‍රශ්නයට යවමින් අතුරු ප්‍රශ්න මතු කරමින් තම නොහැකියාව වසා ගැනීමට පහසුවෙන්ම යොදාගන්නේ ජාතිවාදයයි. මෙවර අයවැයෙන් තරුණයන්ගේ අයිතීන් විශාල ප්‍රමාණයක් කප්පාදු කොට තිබේ. එය බලපාන්නේ රටේ මුළුමහත් තාරුණ්‍යයටයි. තම කප්පාදු වන අයිතීන් වෙනුවෙන් නගන තරුණ හඬ යටපත් කිරීමට පාලකයින්ට අවශ්‍ය වන්නේ මෙවැනි ජාතිවාදයේ ගොදුරු බවට පත් තරුණයන්ය. ජාතිවාදීන් දැනුවත්ව හා නොදැනුවත්ව ඉටුකරන්නේ පාලකයන්ගේ එකී අරමුණය.

# දේශපාලනය, අවස්ථා හා අභියෝග

ලංකාවේ ධනපති ක්‍රමය යළි කිසි ලෙසකින්වත් ගොඩගත නොහැකි තරමට අර්බුදයට ගොස් ඇතැයි යන්න දැන් කාටත් පැහැදිලි වෙමින් තිබේ. 1948න් පසු ගෙවුණු වසර 68ක කාලය තුළ ධනවාදය පවත්වාගෙන යාම සඳහා අනුගමනය කළ සියලු ආර්ථික ප්‍රතිපත්ති හා පාලන ආකෘති අසාර්ථක වී තිබේ. මෙතෙක් රට පාලනය කළ සියලු ධනපති නායකයෝද අසමත් වූ අයගේ ගොඩට වැටී සිටිති. හදිසියේ මියයාම නිසා දේශපාලනයෙන් සමුගත් අය හැර අන් සියලු නායකයෝ ජනතාවගේ විරෝධයට ලක්ව, පරාජයට පත්ව සිය දේශපාලනය අවසන් කළ අය වූහ. දැන් ධනවාදයේ අර්බුදයට ධනවාදය තුළ විසඳුම් නැත. ධනවාදය වෙනස් කළ යුත්තේ ඒ නිසාය.



ලංකාවේ ආර්ථිකය අර්බුදයකය, එය රුපියල් කෝටි දශ ලක්ෂය ඉක්මවූ ණය කන්දරාවක් දරා සිටී, ණය කන්දරාවේ ප්‍රමාණය ජාතික ආදායමෙන් 76%ක් ඉක්මවා තිබේ. වසරක ණය පොලී වාරිකය රාජ්‍ය ආදායම ඉක්මවා සිටී. ඇමරිකන් ඩොලරය රුපියල් 150ක් වීම දක්වා රුපියල බාල්දුවී තිබේ. මේ තියුණු ආර්ථික අර්බුදයට ධනපති ආණ්ඩුව සතුව ඇත්තේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කසාය වට්ටෝරුවය. ඒ බදුබර හා දඩබර වැඩිකිරීම, සහන කැපීම, රාජ්‍ය සම්පත් විකුණා දැමීම (පෞද්ගලීකරණය) හා තව තවත් ණය ගැනීමය. එනම් ආර්ථික අර්බුදය නැමති වළෙන් ගොඩ ඒම නොව එය තව තවත් ගැඹුරට හාරාගෙන එහිම වැළලී යාමය.

ධනවාදයේ මෙම තියුණු අර්බුදය සමාජයේ සෑම ක්ෂේත්‍රයකටම පැතිරී ඇත්තේ පිළිකාවක් සේය. අධ්‍යාපනය අර්බුදයකි. පළමු පන්තියට දරුවෙක් ඇතුල්කර ගැනීමේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා එහි ඇත්තේ ගැටලු රැසකි. වසරකට පළමු පන්තියට ඇතුල්වන 360,000ක් පමණ ළමුන්ගෙන් 60,000ක් 5වන ශ්‍රේණිය නිමා වීමට පෙර පාසලින් පිටමං වන බව පැවසේ. ඒ, එම අර්බුදයේ ප්‍රතිඵලයය. එසේම සෞඛ්‍ය සේවය, ගමනාගමනය, ආදී මහජන සේවා අවුල් ජාලයක් වී ඇත. ඒ සියල්ලම අතර සමාජ අර්බුයන්ද ඇතිවී තිබේ. හොරකම්, අපරාධ, සංස්කෘතිකමය පිරිහීම් දිනපතා වර්ධනය වෙමින් තිබේ. ධනවාදයේ අර්බුදයට හසු නොවූ කිසිදු ක්ෂේත්‍රයක් තවදුරටත් නැත.

මේ අර්බුදය නිසා සියලු ජන කොටස් පීඩාවට පත්ව සිටිති. රජයේ සේවකයෝ තම අයිතීන් ඉල්ලා අරගල කරති. ගොවියෝ පාරට බසිති. ධීවරයෝ වීදි බසිති. ශිෂ්‍යයෝ පෙළපාලි යති. එපමණක් නොව කලා, සංස්කෘතික ක්ෂේත්‍රයේ අයට පවා තම අයිතීන් වෙනුවෙන් සටන් කිරීමට සිදුව තිබෙන්නේ රඟපෑම, සාහිත්‍යකරණය, නිර්මාණකරණය, ප්‍රාග්ධනයේ ආධිපත්‍යයට ගොදුරුවී තිබීම නිසාය.

මේ වනවිට රට මුහුණපා ඇති අර්බුදයේ විශේෂ වෙනසක් තිබේ. ඒ අර්බුදය පහළින් පමණක් ගලා යනවා වෙනුවට ඉහළටද ගමන්කර තිබීමය. ධනවාදයේ වෙනසක් අපේක්ෂා කරන අයගේ පැත්තෙන් ගත්විට එම තත්වය හොඳ තත්වයකි.

පැරණි ධනවාදය වෙනස්කොට නව සමාජයක් නිර්මාණය කිරීම හෙවත් සමාජ පරිවර්තනීය තත්වයකදී ධනවාදයේ අර්බුදය පහළින් මෙන්ම ඉහළින්ද ප්‍රකාශයට පත්වන බව මාක්ස්-ලෙනින්වාදයේ කර්තෘවරු ප්‍රකාශ කළහ. පහළින් ඇතිවන අර්බුදය යනු ධනවාදය තුළ නිතර තිබෙන, සාමාන්‍ය ජනතාවගේ පීඩාවයි. ඉහළින් ඇති අර්බුදය යනු ධනවාදයේ අර්බුදයේ ඉතාම බරපතළ අවස්ථාවල පමණක් මතුවන එකකි. එනම් පාලක පංතිය අර්බුදයට පත්වීමයි.

මේ වනවිට ලංකාවේ පාලක පංතිය දැවැන්ත අර්බුදයක සිටී. ධනපති කණ්ඩායම් දෙකෙන් එකකටවත් තනිව බලය පිහිටුවීමට තරම් ශක්තියක් නොවීම නිසා හවුල් ආණ්ඩුවක් ගොඩනැගී ඇත. එම හවුල සමගියේ සංකේතයක් නොව අසමගියේ සංකේතය වේ. එහි එකාට එකා නැත. ජනාධිපති බලය හා ආණ්ඩු බලය දෙපළකය. එවිට එම බල අධිකාර දෙකම දුර්වලය. ඊට මහජන සහයද නැත. පාලක එ.ජා.ප.යට රටේම බලය මුළුමනින්ම ලැබී නැත. එම නිසාම බිම් මට්ටමේ බලය නැත. පළාත්පාලන ආයතන තවම පිහිටුවීමට නොහැකිවීම නිසා ධනපති පාලනයේ පරිධියේ බලය දුර්වලව පවතී, එ.ජා.ප.යට වෙනදා මෙන් වෘත්තීය සමිතිවල, ගමේ සමූපකාරවල, දායක සභාවල බලය ඇල්ලීමට නොහැකි වී සිටී. එ.ජා.ප. නායකත්වයද දුර්වලය. අගමැති හැරුණු විට වෙනත් නායකයින් නැත. ධනවාදය දැන් නායකත්ව අර්බුදයකටද මුහුණ දී සිටී. ඊට ආකර්ෂණීය නායකයින් නැත.

ඒ අතර ශ්‍රීල.නි.ප.ය දෙකඩවී තිබේ. ඔවුහු එකිනෙකා හා අවි අමෝරා සටන් කරති. ශ්‍රීලනිප සාමාජිකයෝ මෛත්‍රීගේ නායකත්වය පිළි නොගනිති. ජනාධිපති ක්‍රමය දිගටම තිබුණහොත් මහින්දට නැවත ජනාධිපති විය නොහැක. රාජපක්ෂ කල්ලියද අර්බුදයකය. සමහරු ගෝඨාභය රාජපක්ෂ ගැන සිතන්නට පටන්ගෙන තිබෙන්නේ මේ නිසාය. රාජපක්ෂ කල්ලිය අලුතින් පක්ෂයක් පිහිටුවීය. එයද අර්බුදයකි. එම කල්ලියේම සමහරු එය විවේචනය කරති. ධනවාදය 'අන්තෝ ජටා බහි ජටා'ය. එනම් ඇතුළත් ගැටලුය; පිටත් ගැටලුය. පොදුවේ ගත්විට ධනවාදය එය පවත්වාගෙන යාමට නායකයෙක් නැති තත්වයටම වැටී තිබේ. ධනපති කල්ලි අලුත් මුහුණු සොයන්නේ මේ නිසාය.

මේ අර්බුද සියල්ල පෙළගැසී ධනවාදය අවසන් කිරීමේ අවස්ථාව උදාවෙමින් තිබුණද ඊට අභියෝගද තිබේ. දේශපාලනයේ අවස්ථා නිතර උදාවන්නේ නැත. එහෙත් දැන් එවැනි අවස්ථාවක් උදාවෙමින් තිබේ. එසේම දේශපාලනයේ අවස්ථා තනිවම එන්නේද නැත. ඒවා එන්නේ අභියෝගයද සමඟය. දැන් අපේ දේශපාලනයේ අභියෝගය කුමක්ද? ඒ ධනවාදය වෙනස්කිරීමට කැමති හා එය අවශ්‍ය අපේ පංතියේ නැත්නම් පීඩිතයාගේ අර්බුදයයි. ධනවාදයෙන් පීඩාවට පත් ජනතාවට වෙනසක් අවශ්‍යව තිබේ. එහෙත් ඔවුන් තවමත් සිටින්නේ සියවස් ගණනාවක් තිස්සේ ජීවත් වූ ධනේශ්වර මතවාදය තුළය. ධනේශ්වර හුරුපුරුදු තුළය. අතීත සම්ප්‍රදායන්ගෙන් මිදීමට තවමත් ඔවුන් හොඳින්ම සමත්ව නැත. ඔවුන්ගෙන් සමහරු තවමත් රටට නායකයින් සොයන්නේ තමන්ගේම පංතිය තුළින් නොව ප්‍රභූ පංතිය තුළිනි. වහාම වෙනස්කර ගත යුතු තත්වය එයයි. දැන් ජනතාව වෙනස් විය යුතුය. වෙනස් කළ යුතුය.

ධනවාදය සිය කැමැත්තන්ම ඉතිහාසයේ වේදිකාවෙන් බැස යන්නේ නැත. ප්‍රාග්ධන හිමියෝ, කළු සල්ලි උපයන ජාවාරම්කරුවෝ, වරප්‍රසාදිත පුද්ගලයෝ, අධිරාජ්‍යවාදීන් ඇතුළු සියලු දෙනා ධනවාදය රැක ගැනීම සඳහා යළිත් ජනතාවගේ මතවාද අවුල් කිරීමට, මනස පාලනය කිරීමට වෙර දරනු ඇත. අප ජීවත්වන මෙම යුගය තොරතුරු තාක්ෂණය වර්ධනය වූ ජනමාධ්‍ය විසින්, විශේෂයෙන් විද්‍යුත් මාධ්‍ය විසින් සමාජ විඥානය හසුරුවනු ලබන යුගයකි. අපේ රටේ ජන විඥානය පාලනය කරන විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය අයිතිකරුවෝ කවුද? ඔවුන් බොහෝ දෙනෙක් කළු සල්ලි උපයන ජාවාරම්කරුවෝය. ඔවුන්ගේ ප්‍රාග්ධනයේ පැවැත්ම සඳහා ධනපති ක්‍රමය අවශ්‍යය. ධනවාදය වෙනස් කරන විකල්ප දේශපාලන බලවේගයක් සමාජයේ නායකත්වය ගැනීම වළක්වා යළි අලුත් මුහුණකින් හෝ ධනවාදය ගලවා ගැනීම සඳහා නායකයින් ගොඩනැගීමේ මෙහෙයුම් ඔවුන් විසින් පටන්ගනු ඇත. සමාජ පරිවර්තන සටන කළ යුතු වන්නේ එම අභියෝගයටත්ටද මුහුණ දෙමිනි.

මේ තත්වය තුළ ධනවාදයේ අර්බුදයෙන් පීඩාවට පත්ව සිටින හැම දෙනාටම, හැම සමාජ කණ්ඩායමකටම වගකීමක් ඇත. ඒ මේ ජරපත් සමාජය වෙනස් කොට වඩා සාධාරණ සමාජවාදී සමාජයක් නිර්මාණය කිරීම සඳහා වන විශාලතම පුළුල්තම ජනතා බලවේගයේ කොටස්කරුවන් වීමය. ඊට දායක වීමය. නොඑසේව, අලුත් ධනපති නායකයෙක් (දියසෙන් කුමරා සේ) හෞතීස්ම කරගැනීම හෝ ධනවාදයේ මේ රික්තය සිවිල් සමාජ බලවේගයන් විසින් පිරවිය යුතු බවට පැවසෙන යළි ධනවාදයම රැකෙන මතවාදයන්ට ගොදුරු වීම නොවේ. මෙවැනි සංකීර්ණ දේශපාලන අවස්ථා තුළ විවිධ කණ්ඩායම්, වංචාකරුවන් ජනතාවට ලැබිය හැකි ජයග්‍රහණ උදුරා ගැනීමට විවිධ වේෂයන්ගෙන් කලඑළි බසිනු ඇත. එවැනි සියලු බොරුකාරයන්ට නොරැවටී ලැබෙමින් තිබෙන අවස්ථාව අත්පත්කරගැනීම සඳහාත් ඊට එරෙහිව මතුවන අභියෝග පැරදවීම සඳහාත් ජනතාවට මගපෙන්වන සමාජ බලවේග ධෛර්යයෙන් කටයුතු කළ යුතුය. සමාජයේ වෙනසක් සඳහා ජනතාව වෙනස් විය යුතුය. එසේම ජනතාව වෙනස්කළ යුතුය. මේ යුගයේ සැබෑ ප්‍රගතිශීලීන්ගේ කාර්යය එයයි.

> රජයේ සේවකයෝ තම අයිතීන් ඉල්ලා අරගල කරති. ගොවියෝ පාරට බසිති. ධීවරයෝ වීදි බසිති. ශිෂ්‍යයෝ පෙළපාලි යති. එපමණක් නොව කලා, සංස්කෘතික ක්ෂේත්‍රයේ අයට පවා තම අයිතීන් වෙනුවෙන් සටන් කිරීමට සිදුව තිබෙන්නේ රඟපෑම, සාහිත්‍යකරණය, නිර්මාණකරණය, ප්‍රාග්ධනයේ ආධිපත්‍යයට ගොදුරුවී තිබීම නිසාය.



"විප්ලවය යනු ඓතිහාසික අවශ්‍යතාවයක පැන නැගීමක් මිස හිතුවක්කාරකමක හෝ පුද්ගල කැමැත්තක ප්‍රතිඵලයක් නොවේ. කිසිවෙකුට විප්ලවය වැළැක්වීමට නොහැකිවාක් මෙන්ම විප්ලවය බලෙන් පැටවිය නොහැකිද වන්නේය. විප්ලවය වනාහී අති මහත් අවශ්‍යතාවයක පැන නැගීමකි"

**ෆිදෙල් කස්ත්‍රෝ**

ආවර්ජනා

# දූෂණයේ ආරක්ෂකයෝ හෙළිදරව් කෙරෙති



පසුගිය නොවැම්බර් මාසයේ මුල් සතිය වන විට මහ බැංකු බැඳුම්කර ගනුදෙනුවේදී සිදුවූ වංචාව පිළිබඳ සමාජ කතිකාව තීව්‍ර වී තිබුණි. ජ.වි.පෙ. මැදිහත් වීම හේතුවෙන් මෙම වංචාව ජනතාවට හෙළිදරව්වූ නමුත් ජයග්‍රහණයට පියවරුන් සියයයි යන පැරණි කියමන සිහි කරවමින් එය හෙළිදරව් කිරීමේ ගෞරවය ලබා ගැනීමට බොහෝ කොටස් ඉදිරියට පැමිණ තිබුණි.

රාජපක්ෂ පාලනය තුළ වංචාවේ පියවරුන් බවට නම් දරා සිටින පුද්ගලයින්ද මේ බැඳුම් කර සිද්ධියට මුවා වී තම වංචා වසා ගැනීමට එක් පසකින් කටයුතු කරද්දී එ.ජා.ප.ය මේ සිද්ධිය නිසාවෙන් තමන්ට වූ දේශපාලන හානිය සමනය කර ගැනිමට අවස්ථා සොයමින් සිටියේය. මේ අතර ජ.වි.පෙ. පසුගිය මෙන්ම වත්මන් ආණ්ඩුවේ වංචා, දූෂණයන්ට හවුල් වූවන් පිළිබඳවත් ඔවුන්ට රැකවරණය දෙන්නවුන් පිළිබඳවත් රටේ ජනතාව දැනුවත් කිරීමට තීරණය කරන ලදී.

එහි එක් ක්‍රියා මාර්ගයක් ලෙස "දූෂිතයෝ සහ ආරක්ෂකයෝ" යන මැයෙන් දේශන මාලාවක් දිවයිනේ ප්‍රධාන දිස්ත්‍රික් කිහිපයක පවත්වන ලදී. මෙහි ආරම්භක දේශනය පසුගිය නොවැම්බර් 01වැනිදා කොළඹ මහජන පුස්තකාලයේදී ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා විසින් පවත්වන ලදී. මේ දේශනය සඳහා පැමිණිවුන්ගෙන් මහජන පුස්තකාල ශාලාව අතුරු සිදුරු නැතිව පිරී ගිය අතර දූෂණ විරෝධී හඬ සංවිධානයේ කැඳවුම් කරු වසන්ත සමරසිංහ, පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහ පළාත් සභා මන්ත්‍රී ලක්ෂමන් නිපුණාරච්චි යන සහෝදරවරුද ඊට සහභාගි වී සිටියහ.

පසුගිය නොවැම්බර් 02 ගාල්ලේදීද, 03 තංගල්ලේදී සහ 04 වෙනිදා කුරුණෑගලදීද මේ සම්මන්ත්‍රණය පැවැත්වුණි.

# ඉල් මහ විරුවෝ සැමරෙති




සැබවින්ම අන් අයගේ ජීවත් වීමේ අයිතිය වෙනුවෙන් තම ජීවිත පූජා කළ වුන් පිළිබද ඉතිහාසයක් ඇති මෙරට එකම දේශපාලන ව්‍යාපාරය ජ.වි.පෙ. පමණි. අද දවසේද ජ.වි.පෙ. වංචාවට, දූෂණයට හෝ රටේ ජනයාගේ අයිතිවාසිකම් කඩ වන ඕනෑම අවස්ථාවක එයට එරෙහිව පෙරමුණ ගනු ලබන්නේ මේ අතීත විරුවන්ගේ ආභාෂයෙන් බව නොකිව මනාය.

1989 වසරේ නොවැම්බර් මාසය තුළ විශේෂයෙන්ම ජ.වි.පෙ. නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු පක්ෂයේ ඉදිරි පෙළ නායක නායිකාවන් මෙන්ම සාමාජික සාමාජිකාවන් විශාල ප්‍රමාණයක් එවකට පැවති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් ඝාතනය කරනු ලැබිණ. ජ.වි.පෙ විසින් පුරා වසර 27 ක් සමරනු ලබන ඉල් මහ විරු සමරුවට පදනම සැකසෙනුයේද එවන් වටපිටාවක් තුළය. මෙවරද ජ.වි.පෙ. විසින් 27 වන වරටත් සංවිධානය කරනු ලැබූ ඉල් මහ සමරුව පසු ගිය නොවැම්බර් 13 කොළඹ විහාර මහා දේවී එළිමහන් රංග පීඨයේදී මහත් උත්සව ශ්‍රීයෙන් පැවැත්වුණි.

එම අවස්ථාව සඳහා ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ඇතුළු පක්ෂයේ සාමාජික සාමාජිකාවන්ද විශාල ප්‍රමාණයක් සහභාගි වී සිටි අතර සමරු උළෙල අවසානයේ පැවති සංගීත සන්ධ්‍යාව සඳහාද ප්‍රවීන කලාකරුවෝ රැසක්ද සහභාගි වී සිටියහ.

මෙයට සමගාමීව ජ.වි.පෙ. විදෙස් කමිටු විසින්ද ඉල් සමරු පැවැත්වන අතර කුවේට් සමරුව ටිල්වින් සිල්වා, කටාර් සමරුව ලාල් කාන්ත සහ ලන්ඩන් සමරුව නලින්ද ජයතිස්ස යන සහෝදරවරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙයට අමතරව ඉතාලියේ මිලානෝ සහ ෆිරෙන්සි යන නගරවලද කැනඩාවේද එම සමරු උත්සව පවත්වන ලදී.

# ජ.වි.පෙ. ජාත්‍යන්තරයට




මෙරට තුළ ඇති ඇතැම් වාමාංශික, අධිරාජ්‍ය විරෝධී දේශපාලන ව්‍යාපාරයන්ට වඩා ඉදිරියෙන් ජ.වි.පෙ. ජාත්‍යන්තරය තුළ ක්‍රියාත්මක අධිරාජ්‍ය විරෝධී, වාමාංශික මෙන්ම ප්‍රගතිශීලී ව්‍යාපාර සමග සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන යමින් සිටී. ඇතැම් ප්‍රගතිශීලී ව්‍යාපාරයන්හි ප්‍රධාන නිලතල ආදියද මේ වන විට ජ.වි.පෙ.ට හිමිව තිබේ.

පසුගිය නොවැම්බර් 14 - 19 දක්වා නැම්බියාවේ වින්ඩෝර්ක නුවරදී පැවැත්වුණු 2017 රුසියාවේ මොස්කව් නුවර පැවැත්වීමට නියමිත 19වැනි ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙලේ දෙවන ජාත්‍යන්තර සූදානම් කිරීමේ සමුළුව සඳහා එම මූලස්ථානය නියෝජනය කරමින් පුබුදු සමරවීර සහෝදරයාත් සමාජවාදී ශිෂ්‍ය සංගමය නියෝජනය කරමින් එහි ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයාත් සහභාගි වූහ.

ආසියා පැසිෆික්, අප්‍රිකා, යුරෝපා, උතුරු ඇමරිකා, ලතින් ඇමරිකා සහ කැරිබියන්, මැද පෙරදිග ඇතුළු ලෝකයේ කලාප පහක් නියෝජනය කරන නියෝජිත රටවල් 35ක සංවිධාන නියෝජනය කරමින් 60කට අධික තරුණ හා ශිෂ්‍ය ජාත්‍යන්තර නියෝජිතයින් මෙයට සහභාගී වී තිබේ.

මේහා සමගාමීව ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ නියෝජිත සමුළුවක්ද නොවැම්බර් 18 දින පවත්වා ඇති අතර එහිදී ශ්‍රී ලංකාවේ වත්මන් දේශපාලන තත්වය, සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරීත්වය සහ සමුළු යෝජනා කිහිපයක් සමාජවාදී ශිෂ්‍ය සංගමය නියෝජනය කරමින් එයට සහභාගිවූ රංගන දේවප්‍රිය සහෝදරයා විසින් ඉදිරිපත් කරන ලදී.

# වත්මන් අර්බුදය විනිවිදින කෘතියක්



1991 වසරේ සෝවියට් සමූහාණ්ඩු සංගමය තීරණාත්මක ලෙස බිඳ වැටෙන විට ලොව බොහෝ රටවල වාමාංශික ව්‍යාපාර තම පැහැය පවා වෙනස් කරමින් සැඟව යද්දී දේශපාලන ව්‍යාපාරයක් ලෙස අතිශය දුෂ්කර තත්වයකට පත් සිටි ජ.වි.පෙ. තම අත රැදි රතු කොඩිය බිම තැබුවේ නැත.

එනිසාම සෝවියට් දේශය බිඳ වැටී වසර 20 ක් ගත වූ තැන ජ.වි.පෙ. සෝවියට් දේශයේ බිඳ වැටීමත්, ධනවාදයේ අර්බුදය පිළිබඳවත් පුළුල් න්‍යායික සහ ප්‍රායෝගික සංවාදයක් ගොඩනැගීම අරමුණු කර ගනිමින් තම සාමාජිකයින් ඉලක්ක කර අධ්‍යාපන සම්මන්ත්‍රණ මාලාවක් පවත්වන ලදී. සැබවින්ම අද දවසේද පෙරදාට වඩා එවන් සංවාදයක අවශ්‍යතාවය මතුව තිබෙන තත්වයක් තුළ එම සම්මන්ත්‍රණ මාලාව පදනම් කරගනිමින් "සෝවියට් දේශයේ බිඳ වැටීම සහ ධනවාදයේ වත්මන් අර්බුදය" නමින් කෘතියක් පසුගිය නොවැම්බර් 08 ජ.වි.පෙ. විසින් ජනගත කෙරිණි.

කොළඹ ජාතික ලේඛනාරක්ෂක ශ්‍රවණාගාරයේදී පැවති මෙම කෘතිය එළිදැක්වීමේ උත්සවයේදී සඳහා සෝවියට් දේශයේ අධ්‍යාපනය ලැබූ රජරට විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ජයන්තලාල් රත්නසේකර, ප්‍රවීණ ලේඛක ගුණසේන විතාන යන මහත්වරුන්ද ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයාද ප්‍රධාන දේශනයන් පැවැත් වූ අතර මේ අවස්ථාව සඳහා සෝවියට් දේශය පවතින අවධියේ එහි අධ්‍යාපන ලැබූ පිරිස් ඇතුළු විශාල පිරිසක් සම්බන්ධ වී සිටිනු දක්නට ලැබුණි.

# නව යුගයක් සඳහා මහජන ව්‍යාපාරයක් අවශ්‍යයි

ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා

**(පසුගිය 15වැනි දින රාවය 30වැනි සංවත්සරයේදී ඉදිරිපත් කළ දේශනයේ සංක්ෂිප්ත ලිඛිත සටහනක් කාලීන වැදගත්කම සලකා මෙසේ පළ කරමු.)**

අපි ආර්ථික වශයෙන් අතිශය ගැඹුරුතම අර්බුදයකට මුහුණදී තිබෙනවා. ඒක සරල නැහැ. රවි කරුණානායක අමාත්‍යවරයා ගියවර අය වැය ලේඛනය ඉදිරිපත් කරන වෙලාවේදී අපේ ණය ප්‍රමාණය රුපියල් බිලියන අටදාස් හාරසිය හතළිස් තුනයි කිව්වා. අග්‍රාමාත්‍යතුමා පසුගිය මාර්තු මාසයේදී කිව්වා නැහැ, අටදාස් හාරසීය තිස්තුන නොවෙයි අපි අලුතෙන් බිලියන එකසිය විසිතුනක් (කෝටි එක්ලක්ෂ දෙදාස් තුන්සීයක්) හොයාගන්න බැරුව තිබිලා හොයාගත්ත කිව්වා. ඒ වෙලාවේ අපි පාර්ලිමේන්තුවේදී ඇහුවා දැන් හරිද කියලා. එතුමා කිව්වා තාමත් විශ්වාස නැහැ කියලා. අපේ ණය පංගුව දසලක්ෂ, කෝටි දසලක්ෂ පනස්දාහ ඉක්මවිය හැකියි කිව්වා. ඒ කියන්නේ මොකක්ද? අපි ගැඹුරුතම ණය අර්බුදයක සිටිනවා. පසුගිය වසර පහ ඇතුළත වසර දෙකක් රාජ්‍ය මුළු ආදායම ණය පොලී වාරිකය ගෙවීමට ප්‍රමාණවත් නොවී තිබෙනවා. තව වසර දෙකක් රජය උපයාගන්නා ලද ආදායම ණය පොලී වාරිකය ගෙව්වට පස්සෙ කෝටි පන්සියකට වඩා අඩු ප්‍රමාණයක් ඉතිරිවී තිබෙනවා. ඒ නිසා මේ ණය අර්බුදයෙන් ගොඩඒමට නොහැකිවීමේ තත්වයකට අපි මුහුණදී තිබෙනවා.

**ආර්ථික විෂමතාවය**

ඊළඟ අපේ රටේ ආනයන අපනයන වෙළඳපොලේ ඇතිවී තිබෙන ගැටලුව. අපට ආසන්න වශයෙන් ගත්තොත් පිටරටින් භාණ්ඩ ආනයනය කිරීම වෙනුවෙන් ඩොලර් බිලියන 20ක් වැයවෙනවා. නමුත් අපි පිට රටට භාණ්ඩ විකුණා ලබාගන්නේ ඩොලර් බිලියන 10ට ආසන්න අගයක්. සියයට සීයක් වෙළඳ පරතරයක් තිබෙන රටක් නිර්මාණය වෙලා තිබෙනවා. අපේ රටේ රාජ්‍ය ආදායම 1994 දී රජයේ ආදායම දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 23%ක්ව පැවතුණා. 2014 රාජ්‍ය ආදායම 11.5%යි. රාජ්‍ය ආදායම හරි අඩකින් කඩා වැටී තිබෙනවා. 1994ට සාපේක්ෂව. අපේ ආදායම බෙදීයාමේ විෂමතාවය ඉහළම 10% අපේ රටේ ජාතික ධනයෙන් 38%ක් භුක්ති විඳිනවා. පහළම 10%ට හිමිවන්නේ අපේ රටේ ජාතික ධනයෙන් 1.1%යි. ඒ කියන්නේ කුමක්ද? රටේ අපි ඔක්කොම එකතුවෙලා ලොකු පාන් ගෙඩියක් හදනවා. ඒ පාන් ගෙඩිය පෙති 100කට කැපුවහම උඩම ඉන්න 10දෙනා පෙති තිස්අටක් භුක්තිවිඳිනවා. යටම ඉන්න 10 දෙනාට හම්බවෙන්නේ පෙත්තයි අනික් පෙත්තෙන් චුට්ටයි. සාධාරණද? අග්‍රාමාත්‍යවරයා පසුගිය නොවැම්බර් මාසයේ 05 වෙනිදා තම ආර්ථික ප්‍රකාශනය ඉදිරිපත් කරමින් කිව්වා රටේ ජනගහනයෙන් 43%ක, ලක්ෂ 80ක ආදායම, දෛනික ආදායම ඩොලර් 02ට අඩුයි කියලා. එහෙනම් අපි මහ ආර්ථික අර්බුදයකට ඇවිල්ල නැද්ද? අපි මේ ගමන්කරපු ආර්ථික මාවත අසාර්ථක නැද්ද?

හම්බන්තොට වරාය විකිණීම හෝ කොළඹ වරයේ නැගෙනහිර ජැටිය විකිණීම හෝ පුල්මුඩේ ඛනිජ වැලි එක විකිණීම හෝ කහටගස්දිගල පතල විකිණීම හෝ මේ අර්බුදයට උත්තරයක් නෙමෙයි. ආණ්ඩුවක් කියන්නේ ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිකරුවෝ නෙමෙයි. අද ආණ්ඩුවක් ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිකරුවෝ බවට පත්වෙමින් තිබෙනවා. ඒ නිසා මේ අසාර්ථකවූ ආර්ථික උපාය මාර්ගය වෙනුවට නව ආර්ථික උපාය මාර්ගයක් දෙසට රට පරිවර්තනය කිරීමේ අවදියකට පැමිණ තිබෙනවා. එක් යුගයක් අවසන්. ඒ යුගයට පැවරුණු කාර්යභාරයක් තිබෙනවා. කෘෂිකර්මාන්තය සංවිධිත කරන්න, ගල්ඔය ව්‍යාපාරය පටන් ගන්න, මින්නේරිය ව්‍යාපාරය පටන් ගන්න, කෘෂිකාර්මික පුහුණු පාඨමාලා පටන් ගන්න, ගම සහ නගරය අතර සම්බන්ධකම් හදන්න. දැන් ඒ යුගයේ කාර්ය භාරය අවසන්. ඒනිසා නව යුගයේ කාර්ය භාරයක් අපේ රටේ ආර්ථිකයේ පරිවර්තනයක් සඳහා විලිරුදාවකින් මේ සමාජය පෙළෙනවා. ඒක අපි අත්පත්කර ගතයුතු එක් දිශානතියක්.

**දූෂිත වළල්ල**

අනෙක මේ රාජ්‍ය පාලනය පිළිබඳ ප්‍රශ්නය වංචාව, දූෂණය, නාස්තිය පිළිබඳ ප්‍රශ්නය. මේක සරල ප්‍රශ්නයක් නොවේ. මේ හොරකම් කරන්නේ, නාස්ති කරන්නේ කාගේ ධනයද? මේ සිරිපාල මහත්තයගේ පොල්වත්තට පැනලා සුමනපාල මහත්තය පොල් ගෙඩිය අහුලගෙන ගිය ප්‍රශ්නයක් නොවේ. ඒක සිරිපාලටයි සුමනපාලටයි බේරගන්න පුළුවනි. සිරිපාලට කියන්න පුළුවන් ඔයා ඇහිඳගත් එකනේ අරන්යන්න කියන්න පුළුවනි. එහෙම නැත්නම් සිරිපාලට කියන්න පුළුවනි කරපු වැඩේ කැතයි පොල් ගෙඩිය දීලා යන්න කියන්න පුළුවනි. එහෙමත් නැත්නම් පොලිසියට ගිහිල්ල පැමිණිල්ලක් කරල නඩුවක් විභාග කරන්න පුළුවනි. මේක පෞද්ගලික ප්‍රශ්නයක්.

හැබැයි මේ හොරකම් කරලා තියෙන්නේ කාගේ ධනයද? මේ රටේ මහජනයා නිෂ්පාදනය කරන ධනයෙන් පංගුවක් මහ භාණ්ඩාගාරය ගන්නවා. මේ රටේ මහජනයාගේ ධනය. ඒ ධනයෙන් භාණ්ඩාගාරයට එන ලද ධනයෙන් පංගුවක් හොරකම් කරනවා. ඊළඟට, භාණ්ඩාගාරයට එන්න තියෙන ධනය හොරකම් කරනවා. ඒකයි හොරකම් කරනවා කියන්නේ. ඒ කියන්නේ මේ රටේ මහජනයාගේ ධනය. ඊළඟට මේ රටේ ජනතාවගේ සම්පත් ඉඩම් දේපළ ස්වභාවික සම්පත් මේවා



තමයි හොරකම් කරන්නේ. ජනවාරි මාසේ පරිවර්තනයේදී ලංකා ඉතිහාසයේ ප්‍රබලතම මාතෘකාව වූයේ වංචාවට දූෂණයට නාස්තියට දඬුවම් ලබාදීමයි. ඒත් ඇයි එහෙම නොවුණේ. ඔබ මා සිතනවාට වඩා දූෂිත වළල්ල ප්‍රබලයි. මේකට ප්‍රධාන දේශපාලකයින් ඉන්නවා. එක්ලක්ෂ අනූදාහක් වූ හමුදාවේ සියයකට ආසන්න ප්‍රමාණයක් සම්බන්ධ වී ඉන්නවා. අසූහතර දාහක් වූ පොලීසියේ පනහකට ආසන්න ප්‍රමාණයක් සම්බන්ධ වී ඉන්නවා. දෙදාස් හාරසීයක් වන සිවිල් සේවයේ සේවයේ සීයකට ආසන්න ප්‍රමාණයක් සම්බන්ධවී ඉන්නවා. ඒ විතරක් නොවෙයි ව්‍යාපාරිකයො සම්බන්ධයි. මේකට නීතිවිරෝධී ගිනිඅවි තිබෙනවා. ඇවන්ගාඩ් වැනි. මේකට පාතාලේ සබඳකම් තියෙනවා. මේවට ලියාපදිංචි නොකරන ලද වාහන තියෙනවා. මේ දූෂිත වළල්ල ඔබ මා සිතන තරම් සරල වලල්ලක් නොවේ. මෙයට අධිකරණයේ මැදිහත්වීම් තියෙනවා. 2010 ජනාධිපතිවරණේදී මෛත්‍රීපාල මහත්මයාගේ මැතිවරණේ පෙලපාලියකදි එතුමාගේ කාර් එකට හානියක් සිදුවුණා. පොදු දේපළ යටතේ නඩුවක් දැම්මා. ඒ නඩුව අනුව අපේ පක්ෂයේ පොළොන්නරුවේ පාර්ලිමේන්තු මන්ත්‍රී හැටියට කටයුතු කළ සුභසිංහ සහෝදරයා රිමාන්ඩ් එකේ හිටියා මාස 9ක්. අද එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රී කෙනෙක් හැටියට කටයුතු කරන සිඩ්නි ජයරත්න මන්ත්‍රීවරයා මාස 6ක් රිමාන්ඩ් භාරයේ සිටියා. මොකක්ද? රජයේ දේපළක් වන වාහනයකට රුපියල් 25,000/-කට වැඩි අලාභ හානියක් සිදුවීම හේතුකොට ගෙන. ඇප නැතිව මාස නවයක් රිමාන්ඩ් එකේ හිටියා. දැන් සතියෙන් එළියට එනවා. කොහොමද එහෙම වෙන්නේ.

> "අපි රේල් පාරක ආවා නම් අපි දැන් ඉන්නේ එක්දාස් දෙවැනි සිල්පර කොටේ ගාව නම් අපිට එක්දාස් තුන්වැනි කොටේට පය තිබ්බයි කියලා මේ මාවතේ කිසිවක් වෙන්නේ නැහැ. මේකම තමා. ඒනිසා අපි වෙන මාවතක් කැපිය යුතුව තිබෙනවා."

මේ දූෂිත වලල්ලෙ අධිකරණය ඉන්නවා. මේක සඟවන්න ඕනෙ කරුණක් නොවේ. සැප්තැම්බර් මාසෙ නඩුව මැයි මාසෙ 05 වෙනිදාට කල් යනවා. කොහොමද කල් යන්නේ.

මේ දූෂිත වලල්ල ප්‍රබලයි. මේ වලල්ල පරාජය කරන්න බැහැ හුදු කුඩා මැදිහත්වීම්වලින්. මාධ්‍ය සාකච්ඡාවකින්, අල්ලස් හෝ දූෂණ කොමිසන් සභාවට පැමිණිල්ලක් දැමීමෙන් පරාජය කරන්න බැහැ. ඔවුන් සතුව මාධ්‍යය තිබෙනවා නම් ඔබ කල්පනා කරල බලන්න. මිග් ප්‍රහාරක යානා ගනුදෙනුව පිළිබඳව සන්ඩේ ලීඩර් පුවත්පතේ ලියවෙනවා. මාසයක් යනකොට ලසන්ත වික්‍රමතුංග ඝාතනය වෙනවා. ඒවා වෙන්නේ කොහොමද? රෝහණ කුමාර ඝාතනය වුණේ කොහොමද? ඉතිහාසය සොයල බලන්න. මේවා සරල දේවල් නොවේ. ඒ නිසා මේ දූෂිත වළල්ල හුදු මාධ්‍ය සාකච්ඡාවකින් හුදු පොස්ටරයකින් පරාජය පත් කළ හැකි වළල්ලක් නොවෙයි. මේ රාජ්‍යය ශුද්ධකිරීමේ කාර්ය භාරයේදී මහජන ව්‍යාපාරයක අවශ්‍යතාවය තියෙනවා. ප්‍රබල මහජන පෙරමුණකින් විතරයි ඒ දූෂිත වලල්ල පරාජයට පත් කළ හැකි වන්නේ. එසේ නැතිව මේ රාජ්‍යය ශුද්ධත්වයට පත් කරන්න පිරිසිදු කිරීම සඳහා අවස්ථාව ලැබෙයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ.

**නාස්තිය**

ඒ විතරක් නොවෙයි. මේ නාස්තිය මතක තියා ගන්න මේ රටේ ඇත ගොවි ජනතාව සාමාන්‍යයෙන් මේ රටේ ධනය නිෂ්පාදනය කරන ජනතාව පරපෝෂිත කණ්ඩායමක් නඩත්තු කරනවා. මේක සාධාරණද? කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ආවා ආණ්ඩුවට සම්බන්ධවී සිටින මන්ත්‍රීවරු 58 දෙනෙකුට මාසෙකට රු. 5,90,000/- ගානේ මාසික කුලියට වාහනයක් අරන් ලබාදෙන්න. පන්ලක්ෂ අනූදාහයි මාසික කුළිය. වැට් සහ එන්බීටී එකතු වුනාම රු. 700,000යි. වාහන 58ක් වෙනුවෙන් වියදම මිලියන 2436යි. කෝටි 243යි. මේ රටේ ජනතාව කෝටි 243ක් වැය කරන්න ඕනද? 58 දෙනෙකුට වාහන වෙනුවෙන්. අපි අහන්නේ තමුන්නාන්සේලාගෙන්. පරපෝෂිතයෝ නොවෙයිද මේ? මේව නාස්තිය නෙවේද? කෘෂිකර්ම අමාත්‍යංශය තාමත් මාස 08ට ආසන්න කාලයක් මාසෙට රුපියල් ලක්ෂ 210 ගානේ බදු ගෙවමින් ඉන්නවා. කිසිම ප්‍රයෝජනයක් ගන්නේ නෑ. සාධාරණද? කෘෂිකර්මාන්තය හරිනම් ගෙනියන්න ඕන ගොවි ජනපදයක පිහිටවන්න ඕන. කොළඹ නගරයේ ලක්ෂ 210ක් දීල කාර්යාලයක් ලබාගත යුතුද? මේවා කොහොම යුක්තිසහගත වෙන්නේ?

19වන සංශෝධනය අනුව අමාත්‍යවරු සිටිය හැක්කේ 30යි. නියෝජ්‍ය රාජ්‍ය අමාත්‍යවරු 40යි. හැබැයි අමාත්‍යවරු 30 සිට 48 දක්වා 18න් වැඩි වෙන්නේ ඇයි? ජනතාව දැනගන්න ඕන. රාජ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරු රාජ්‍ය අමාත්‍යවරු සංඛ්‍යාව 40යි. ඒක 45 දක්වා වැඩිවෙන්නේ ඇයි? 30ක් සහ 40 ක් එකතුව 15වැනි පිටුවට



''ඔබ ප්‍රතිපත්තිගරුක විය යුතුයි. ජනතාව සඳහා ප්‍රතිපත්ති සේම ඔබේ සතුරන් සඳහා ප්‍රතිපත්තිද ඔබට තිබිය යුතුයි. නැතිනම් ඔබට ජය ගත නොහැකියි.''

**ෆිදෙල් කස්ත්‍රෝ**

# අර්බුදයේ ගැඹුර පෙන්වන ඇමරිකානු ජනාධිපතිවරණය



එක්සත් ජනපදයේ 45වන ජනාධිපතිවරයා ලෙස ඩොනල්ඩ් ට්‍රම්ප් තේරී පත් විය. ඔහුගේ ජයග්‍රහණය ප්‍රධාන ධාරාවේ අනාවැකි සියල්ල සුනු විසුණු කර දමා තිබේ. ඇතැමුන් පූර්ව කල්පනය කළ ආකාරයට මෙවර එක්සත් ජනපද ජනාධිපතිවරණයේ ප්‍රතිඵල Brexit ජනමත විචාරණයේ ප්‍රතිඵලය හා සමාන වී තිබේ.

නොවැ. 10 වැනි දින ඩොනල්ඩ් ට්‍රම්ප් හා ධුරයෙන් සමුගැනීමට නියමිත ජනාධිපති බැරක් ඔබාමා අතර හමුව සිදුවිය. එතැන් සිට සති 10ක කාලය තුළදී පදවි හුවමාරුවේ ක්‍රියාවලිය අවසන් කළ යුතුය. එක්සත් ජනපද ව්‍යවස්ථාවට අනුව අභිනව ජනාධිපතිවරයා ජනවාරි 20වැනි දින දිවුරුම් දිය යුතුවේ. එකී කාලය තුළදී ඩොනල්ඩ් ට්‍රම්ප්ට එක්සත් ජනපදයේ තීරණාත්මක ධුරයන් 50ක් ද ඇතුළත්ව ධවල මන්දිරයේ කාර්ය මණ්ඩලයත්, කැබිනට් මණ්ඩලයත්, තවත් දේශපාලනික පත්වීම් 4000ක් පමණත් සිදු කිරීමට සිදුවේ. නොවැම්බර් 10වැනිදා සිටම එක්සත් ජනපදයේ රහස් තොරතුරු සේවා ආයතන 17කින් ඉදිරිපත් කරනු ලබන (එක්සත් ජනපදය විසින් සිදුකරන රහසිගත මෙහෙයුම්ද ඇතුළත්) දෛනික රහස් තොරතුරු වාර්තාවද ඔහු වෙත ලබා දීමට නියමිතය.

පදවි හුවමාරු ක්‍රියාවලිය එලෙස සිදුවෙමින් පවතිද්දී එක්සත් ජනපදයේ නගර පුරා ට්‍රම්ප් විරෝධී උද්ඝෝෂණ සිදු කෙරෙමින් පවතී. ඇතැම් ස්ථානවල ඒවා ප්‍රචණ්ඩ උද්ඝෝෂණ බවටද පරිවර්තනය වී තිබේ.

මෙවර එක්සත් ජනපද ජනාධිපතිවරණයේ මෙම ප්‍රතිඵලය බොහෝ දෙනෙකු බලාපොරොත්තු නොවූවකි. විශේෂයෙන්ම එක්සත් ජනපදයේ පාලක පංතියේ අපේක්ෂාව වූයේ ඩොනල්ඩ් ට්‍රම්ප් නොවේ. මෙම ප්‍රත්ඵලය ඊරුංසඑ ජනමත විචාරණයේ ප්‍රතිඵලය සේම ආන්දෝලනාත්මක ප්‍රතිඵලයක් වී ඇත්තේ එබැවිනි. බොහෝ විචාරකයන්ට අනුව මෙහිදී සිදුවී ඇත්තේ ද ඊරුංසඑ ජනමත විචාරණයේදී සිදු වූ දෙයමය.

ඩොනලඩ් ට්‍රම්ප්ගේ ජයග්‍රහණයේ වරද ඩිමොක්‍රටික් පක්ෂය භාරගත යුතුයයි ප්‍රවීන දේශපාලන විචාරක නොම් චොම්ස්කි පවසයි. ඊට බලපෑ හේතු දෙකකි. පළමුවැන්න නම් ඩිමොක්‍රටික් පක්ෂය එක්සත් ජනපද කම්කරු පංතිය අමතක කර දමා නව ලිබරල්වාදී ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමයි. ඉන් වාසි සැලසුණේ මහා පරිමාණ ධනපතීන්ට පමණකි. මේ නිසා උරණ වූ සහ අසතුටට පත්වූ සුදු ජාතික කම්කරු ජනතාව ඩොනල්ඩ් ට්‍රම්ප්ට ඡන්දය ප්‍රකාශ කළහ.

දෙවන හේතුව නම් ඩිමොක්‍රටික් පක්ෂයේ නව ලිබරල්වාදී ප්‍රතිපත්තියෙන් හෙම්බත් වී සිටි ජනතාවට ඇති වූ 'වෙනසක' අවශ්‍යතාවයි. පසුගිය ජනාධිපතිවරණය තුළදී හිලරි ක්ලින්ටත් පවත්නා තත්වයම ඉදිරියට ගෙනයාම නියෝජනය කළ අතර ඩොලඩ් ට්‍රම්ප් 'අලුත් වෙනසක්' වෙනුවෙන් පෙනී සිටියේය. එකී 'වෙනස' කවරක් දැයි නිශ්චිත නැති වුවද ජනතාව 'වෙනසක්' වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කර ඇත.

ඇමරිකා එක්සත් ජනපදයේත්, මහා බ්‍රිතාන්‍යයේත් පැවැත්වූ ආසන්නතම මැතිවරණ දෙකෙහි ප්‍රතිඵල මේ මොහොතේ ධනවාදයේ අර්බුදයේ ගැඹුර ප්‍රකාශයට පත්කරන්නක් බවට පත්වී තිබේ. ලෝක ආර්ථික අර්බුදයත් ඊට විසඳුම් ලෙස ඉදිරිපත් කළ නව ලිබරල්වාදී ප්‍රතිපත්තීන් වූ ලිහිල්කරණය, පුද්ගලිකකරණය, සහන කප්පාදු වැඩපිළිවෙළ හා ඒකාබද්ධ වෙළඳ ප්‍රතිපත්තීන් හේතුවෙන් මෙම රටවල ජනතාවගේ ජීවන තත්වය බරපතළ ලෙස කඩා වැටී ඇත. ඔවුන්ට රැකියා අහිමි වී ඇත. විශ්‍රාම වැටුප් අහිමි වී ඇත. ඔවුන්ගේ සුරක්ෂිතතාව අහිමි වී ඇත. ඔවුන්ට පමණක් නොව ඔවුන්ගේ දූ දරුවන්ගේ අනාගතය පිළිබඳවද ඇත්තේ බරපතළ අවිනිශ්චිතතාවයකි. ඒ අතරම මහා පරිමාණ ධනවතුන්ගේ බැංකු හා කාර්මික ධනපති ජාලයේ වර්ධනය ඔවුන්ගේ නිරීක්ෂණයට හසුවේ. තේරී පත්වන පාලකයන් මෙකී මහා පරිමාණ ධනපතීන්ගේ වුවමනාවන් පමණක් ඉෂ්ට කරති. මේ නිසා ජනතාවට වෙනසක් අවශ්‍යවී ඇත. ඔවුන්ගේ වේදනාව ප්‍රකාශ කළ යුතුව ඇත.

එහෙත් එහිදී ඔවුන්ට එය සිදුකිරීමට සිදුව ඇත්තේ ඔවුන් වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති විසඳුම් දෙකකින් එකක් තෝරා ගැනීමෙනි. එබැවින් මෙම මැතිවරණ ප්‍රතිඵලවලින් ප්‍රකාශයට පත්වන්නේ එම ප්‍රතිවිරෝධයයි.

කෙසේ වෙතත් ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ තේරී පත්වීමෙන් එක්සත් ජනපදයේ විදේශ ප්‍රතිපත්තියේ හෝ දේශීය වැඩපිළිවෙළෙහි සැලකිය යුතු වෙනස්කම් සිදු වෙතැයි බලාපොරොත්තු විය නොහැකිය. එම ප්‍රතිපත්තීන් තීරණය කරනුයේ පුද්ගලයන් විසින් නොව ක්‍රමය විසිනි. ඒවා පුද්ගලික රුචිකත්වයන් මත වෙනස් නොවේ. එබැවින් එක්සත් ජනපද ජනතාව අපේක්ෂා කරන වෙනස ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ පාලන කාලය තුළදීද නොලැබෙනු ඇත.

## කොලොම්බියාව තවත් සාම ගිවිසුමක

කොලොම්බියාව සහ එරට වාමාංශික FARC ගරිල්ලාවරු පසුගිය 12වනදා නව සාම ගිවිසුමකට අත්සන් තැබූහ. මෙම දෙපාර්ශවය අතර අත්සන් කෙරුණු පළමු සාම ගිවිසුම ජනමත විචාරණයෙන් පරාජයට පත් වූ බැවින් ඔවුන්ට මෙලෙස නව සාම ගිවිසුමක් සැකසීමට සිදුවිය.

සංශෝධිත නව සාම ගිවිසුම ජනමත විචාරණයකට ලක් නොකරන අතර එය එරට කොංග්‍රස් මණ්ඩලයේදී අනුමත කර ගැනීමට නියමිතය.

පළමු සාම ගිවිසුම 2016 සැප්. 26 වන දින කියුබාවේදී අත්සන් තැබුණු අතර එය ඔක්. 02 දින පැවති ජනමත විචාරණයෙන් පරාජයට පත්විය.



## ඩැනියෙල් ඔටේගාට තවත් අවස්ථාවක්



නිකරගුවාවේ සැන්ඩිනිස්ටා ජාතික විමුක්ති පෙරමුණේ ජනාධිපති අපේක්ෂක ඩැනියෙල් ඔටේගාට ජනාධිපතිවරයා ජය හිමිකර දෙමින් නිකරගුවාවේ මැතිවරණය පසුගිය නොවැම්බර් 06වැනිදා අවසන් විය. එම මැතිවරණය එයත් 2016-2021 කාලය සඳහා නව ජනාධිපතිවරයෙක්, උප ජනාධිපතිවරයෙක් හා නව පාර්ලිමේන්තුවක් තෝරා පත්කර ගැනුණි. උප ජනාධිපතිවරයා ලෙස තෝරා පත්කර ගැනුනේ සැන්ඩිනිස්ටා ජාතික විමුක්ති පෙරමුණේ උප ජනාධිපතිධුර අපේක්ෂිකා රොසයිරෝ මුරිල්ලෝය. මෙවර මැතිවරණයේදී ඡන්ද පාවිච්චිය 68.2%ක් විය.

| ජනාධිපතිවරණ අපේක්ෂක | පක්ෂය | ඡන්ද | ප්‍රතිශතය |
|---|---|---|---|
| ඩැනියෙල් ඔටේගා | සැන්ඩිනිස්ටා ජාතික විමුක්ති පෙරමුණ | 1,806,651 | 72.44% |
| මැක්සිමිනෝ රොද්‍රිගුවස් | ව්‍යවස්ථාදායක ලිබරල් පක්ෂය | 374,898 | 15.03% |
| ජොසේ ඇල්වරාඩෝ | ස්වාධීන ලිබරල් පක්ෂය | 112,562 | 4.51% |
| සැටනිනෝ සෙරාටෝ | නිකරගුවානු ලිබරල් සන්ධානය | 107,392 | 4.31% |
| එරික් කැබිසාස් | කොන්සවේටිව් පක්ෂය | 57,437 | 2.30% |
| කාලෝස් කැනාලේස් | ජනරජයක් සඳහා වන සන්ධානය | 35,002 | 1.40% |

මෙවර ජනාධිපතිවරණයේදී ඩැනියෙල් ඩැනියෙල් ඔටේගාව නිකරගුවානු ජනාධිපතිවරයා ලෙස තෝරා පත්කර ගනු ලැබුවේ පිට පිට තුන්වන වතාවටයි.

ඩැනියෙල් ඔටේගා 1979 ජූලි 19 වන දින සිදුකෙරුණු නිකරගුවානු සමාජවාදී විප්ලවයේ නායකයාය. ඔහු එදින සිට 1990 දක්වා එරට සමාජවාදී රාජ්‍යයේ ජනාධිපතිවරයා ලෙස කටයුතු කළ අතර 1990 වසරේදී පැවති මැතිවරණයෙන් සැන්ඩිනිස්ටා ජාතික විමුක්ති පෙරමුණට බලය අහිමි විය. නැවතත් 2007 මැතිවරණයේදී ඔහු එරට ජනාධිපතිවරයා ලෙස තොරා පත්කර ගැනුණි. 2011 පැවති මැතිවරණයෙන් ඔහු යළිත් ජයග්‍රහණය කළේය.

මෙවර මැතිවරණයෙන් එරට පාර්ලිමේන්තුවටද නියෝජිතයින් තෝරා පත්කර ගැනීම සිදු කෙරිණි. එහිදී මුළු මන්ත්‍රවරු 92 අතරින් මන්ත්‍රීධුර 70ක් දිනා ගැනීමට සැන්ඩිනිස්ටා ජාතික විමුක්ති පෙරමුණ සමත් විය. කලින් පාර්ලිමේන්තුවේ ඔවුන්ට සිටියේ 63ක් පමණි.

| පක්ෂය | මන්ත්‍රී ධූර | ඡන්ද ප්‍රතිශතය |
|---|---|---|
| සැන්ඩිනිස්ටා ජාතික විමුක්ති පෙරමුණ | 70 | 66.46% |
| ව්‍යවස්ථාදායක ලිබරල් පක්ෂය | 13 | 15.51% |
| ස්වාධීන ලිබරල් පක්ෂය | 2 | 4.86% |
| අනෙකුත් පක්ෂ | 7 | |

මෑත කාලීන නිකරගුවානු මැතිවරණවල විශේෂත්වය වන්නේ එම ගැටුම්වලින් තොරවීම සහ මැතිවරණ ප්‍රතිඵල සඳහා එරට මාධ්‍යයන්ගෙන් කෙරෙන බලපෑම අවම වීමයි. කෙසේ වෙතත් එරට විපක්ෂ කණ්ඩායමක් වන 'ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන පුළුල් පෙරමුණ' මෙම මැතිවරණ ප්‍රතිඵල ප්‍රතික්ෂේප කරන අතර නව මැතිවරණයක් ඉල්ලා සිටී.

ඩැනියෙල් ඔටේගාගේ නායකත්වයෙන් යුතු සැන්ඩිනිස්ටා පෙරමුණු පාලන කාලයේදී නිකරගුවාවේ දුප්පත්කමේ ප්‍රතිශතය 42.5% සිට 29.6% දක්වා අඩු වූ අතර ආර්ථික වර්ධන වේගය 4.5% ක පැවතුණි. මෙම අගය මධ්‍යම ඇමරිකානු රටවල් අතුරින් වාර්තාවන වැඩිම ආර්ථික වර්ධන වේගයන්ගෙන් එකකි.

## යුරෝපයේ මධ්‍යම පංතිය හැකිළෙයි



යුරෝපයේ මධ්‍යම පංතිය 2.3% කින් හැකිළි ඇතැයි ජාත්‍යන්තර කම්කරු සංවිධානය සිය නවතම සමීක්ෂණයක් මගින් හෙළිකර ඇත. යුරෝපා මධ්‍යම පංතියෙහි මෙම හැකිළීම සිදුවී ඇත්තේ 2004 -2011 කාල වකවානුව තුළය. තවද මෙම හැකිළීම බරපතළ ලෙසම සිදුවී ඇත්තේ ග්‍රීසිය හා ජර්මනිය වැනි රටවලය.

යුරෝපා සංගමය තුළ මධ්‍යම පංතිය ලෙස සලකනු ලබන්නේ යුරෝපයේ මධ්‍ය ආදායමෙන් 80% සිට 120%ක් දක්වා ආදායමක් ලබන්නන්ය. සාමාන්‍යයෙන් යුරෝපා සංගමයේ නිවාස ප්‍රමාණයෙන් (කුටුම්භ ප්‍රමාණයෙන්) 23% සිට 40% දක්වා ප්‍රතිශතයක් මධ්‍යම පංතියට අයත්වේ. නවතම සමීක්ෂණය අනුව යුරෝපයේ ශක්තිමත්ම මධ්‍යම පංතිය සිටිනුයේ ඩෙන්මාර්කයේ සහ ස්වීඩනයේය. එය පිළිවෙලින් 40%ක් සහ 39%කි. අඩුම මධ්‍යම පංතික ප්‍රතිශතය සිටිනුයේ ලැට්වියාවේ (23%) සහ ලිතුවේනියාවේ (24%)ය.

යුරෝපයේ ශක්තිමත්ම මධ්‍යම පංතිය ඇති රටවල එක් නිවසක වැඩිහිටියෝ කිහිප දෙනෙක් රැකියාවේ නිරත වෙති. එනම් එවැනි එක් නිවසකට ආදායම් මාර්ග කිහිපයක් ඇත. ඉන් අනෙක් අතට අදහස් කෙරෙන්නේ කිසියම් පවුලකට එක් රැකියාවක් කිරීමෙන් පමණක් මධ්‍යම පංතික ජීවන තත්වයක් ලබා ගත නොහැකි බවයි. මින් පෙරදී ගුරුවරුන්, වෛද්‍යවරුන් වැනි රැකියා කරන්නවුන් මධ්‍යම පංතියට අයත් සේ සැලකුවද තවදුරටත් ඔවුන් මධ්‍යම ආදායම් ලබන්නන් ලෙස සැලකිය නොහැකි බවද ජාත්‍යන්තර කම්කරු සංවිධානය ප්‍රකාශ කරයි.

මධ්‍යම පංතියේ කඩා වැටීම ඇතැම් රටවල, එනම් ජර්මනිය, ලක්සම්බර්ග්, නෙදර්ලන්තය, බ්‍රිතාන්‍යය හා ඩෙන්මාර්කය යන රටවල මූල්‍ය අර්බුදයට පෙර සිටම වර්ධනය විය. ග්‍රීසිය, ස්පාඤ්ඤය, එස්තෝනියාව, සයිප්‍රසය සහ පෘතුගාලය වැනි රටවල එය මූල්‍ය අර්බුදයට පසුව වර්ධනය විය.

# අය වැය ප්‍රෝඩාව සහ ජනතාවට බර පැටවීම

"යහපාලන" පාලනයේ තුන්වන අයවැය පසුගියදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරිණි. අයවැය තේමාව ලෙස මේ වසරේ යොදා ඇත්තේ "සැමට ප්‍රතිලාභ හිමිවන වේගවත් සංවර්ධනයක් කරා..." යනුවෙනි. පාර්ලිමේන්තුව තුළ මේ දිනවල සිදුකරන අයවැය විවාදයේදීත්, රට තුළ ජනමාධ්‍ය සහ ජනතාව අතර කෙරෙන කථාබහෙනුත් මනාව පෙනී යන්නේ, මෙවර අයවැයෙන් ඉටු නොවී ඇත්තේද අයවැය කථාවේ පළමු පිටුවෙහිම දක්වන අරමුණු බවයි.

එසේම මුදල් අමාත්‍ය රවි කරුණානායක අයවැය අවසන් කරන්නේ "මහජනයා වෙත බදු පනවා පීඩාවට පත් කිරීමට මුදල් අමාත්‍යවරයෙකු අවශ්‍ය වන්නේ නැහැ. සෑම මුදල් අමාත්‍යවරයෙකුටම අවශ්‍ය වන්නේ, මහජනයාට සහනදී ඔවුන්ගේ ජීවන තත්වය නඟා සිටුවීමටයි" යනුවෙනි. නමුත් මේ යහපාලන ආණ්ඩුවේ මිත්‍යා අයවැය මගින් මුළුමනින්ම ඉටුනොකර පැහැර හැර ඇත්තේද එම අවශ්‍යතාවයයි. දැනටමත් ක්‍රියාත්මක බදු වර්ගවලට අමතරව පනවා ඇති වාහන අනතුරු බද්ද අන්තර්ජාල පරිහරණ බද්ද, ඒ.ටී.එම්. ඊසි කැෂ් ගනුදෙනු බද්ද, සිම් කාඩ් බද්ද ආදී නව බදුවලින් පැහැදිලි වන්නේ ජනතාවට තව තවත් ආණ්ඩුවේ දඩ - බදු - ගාස්තුවලින්ම මිරිකීමට ලක්කර ඇති බවය.

## අයවැය දැක්ම


අයවැය ලේඛනයක් යනු ඕනෑම ආණ්ඩුවක ආර්ථික උපාය මාර්ගය ඉදිරි වසරට අදාළ ක්‍රියාවට නගන ආර්ථික සැලැස්මයි. එය හුදු ව්‍යාපාරයක වන ආදායම වියදම ලේඛනයක් ඉක්මවා යන්නේද ඒ තුළින් ගම්‍යවන ආණ්ඩුවේ ආර්ථික උපාය මාර්ග පිළිබඳ වන බැවිනි. එසේම, එම ආර්ථික උපාය මාර්ග සම්පූර්ණ වනතුරු රටේ ජනතාව මුහුණ දෙන දෛනික ආර්ථික ගැටලුවලට විසඳුම් ලබාදීමද අයවැය මගින් අපේක්ෂා කරයි. නමුත් මෙවර ඉදිරිපත් කර ඇති අයවැය විසින් ඉහත අපේක්ෂාවන් බිඳ දමනු ලැබ ඇත.

වර්තමානයේ රටක් ලෙස අප මුහුණ දෙන ප්‍රධානම අර්බුදය වී ඇත්තේ ගෙවා පියවිය නොහැකි ලෙස වසරින් වසර ඉහළ යමින් තිබෙන දැවැන්ත ණය අර්බුදයයි. 2015 වසරේදී රුපියල් බිලියන 8503ක්ව පැවති ගෙවිය යුතු ණය ප්‍රමාණය මේවන විට රුපියල් බිලියන 10,000ක් ඉක්මවන මට්ටමේ පවතී. ගතවූ වසර පහ තුළදී වසර දෙකක්ම ආණ්ඩුවේ ආදායම ණය වාරිකය හා පොලිය ගෙවීමට ප්‍රමාණවත් නොවීය. එසේම පැවති රාජපක්ෂ පාලනය විසින් ගනු ලැබූ ඉහළ පොළී ණය ආර්ථික ව්‍යාපෘති සඳහා යොදවන අතර, එහි ණය ගෙවීමට සිදුව ඇත්තේ 2017 සිට ඉදිරි වසර කිහිපය තුළදීය. රාජපක්ෂ පාලනයේ ණය කල් පිරීමට ලක්වන්නේ ඉදිරි වසර කිහිපය තුළදීය. නමුත් මෙම අයවැයේ එම අර්බුදය අනාගතයට කෙසේ වෙතත් 2017 වසර සඳහාවත් නොදැකීම ආණ්ඩුවේ අර්බුදය හා නොහැකියාව මනාව ප්‍රදර්ශනය කරයි.

එසේම දවසින් දවස වර්ධනය වන වෙළඳ ශේෂ පරතරය පියවීම කෙසේ වෙතත් පරතරයේ වර්ධනය අඩු කර ගැනීමටවත් මෙවර අයවැය ඉලක්කයක් නොමැත. එසේම බලයට පත්වෙන ඕනෑම පාලනයක්ම පුරාජේරු වාක්‍යවලට පමණක් සීමාකරන ආර්ථික වර්ධනය මෙවර අයවැයේ දැකිය හැකිය. නමුත් ආර්ථිකය වර්ධනය තුළ ආදායම් වර්ධනයේ පංගුව කොපමණ වර්ධනය වන්නේදැයි විග්‍රහයක් කර නොමැත. 1994 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 23%ක්ව පැවති රජයේ ආදායම මේ වන විට 12% කට දෙගුණයකින් පහළ වැටී ඇත. එම රජයේ ආදායම ඉහළ නැංවීමේ උපායමාර්ගික දැක්මක් මෙවර අයවැයේද නොමැත.

> "දවසින් දවස වර්ධනය වන වෙළඳ ශේෂ පරතරය පියවීම කෙසේ වෙතත් පරතරයේ වර්ධනය අඩු කර ගැනීමටවත් මෙවර අයවැය ඉලක්කයක් නොමැත. එසේම බලයට පත්වෙන ඕනෑම පාලනයක්ම පුරාජේරු වාක්‍යවලට පමණක් සීමාකරන ආර්ථික වර්ධනය මෙවර අයවැයේ දැකිය හැකිය."

ආර්ථික වර්ධනය අත්පත් කර ගත්තද අදටත් එම වර්ධනයට රටක් ලෙස දායක වීමක් සිදු වී නොමැත. ආර්ථිකයේ 53%ක් සඳහා දායක වී ඇත්තේ බස්නාහිර පළාත පමණි. උතුරු මැද 04%ක්ද වයඹ 09%ක්ද ඌව පළාත 04%ක්ද ආදී වශයෙන් අනෙකුත් පළාත්වලින්




ඇත්තේ දායකත්වයේ ඉතාම අඩු මට්ටමකි. මෙම ගැටලු ලෙස පුළුල් ලෙස දැකීමක් කෙසේ වෙතත් එවැනි වුවමනාවක සේයාවක්වත් මෙවර අයවැය තුළින් විද්‍යමාන නොවේ. අයවැය ධනේශ්වර දෘෂ්ටිකෝණයකින්වත් ආර්ථිකය පුළුල් කිරීමේ උත්සාහයක් ගෙන ඇතැයි විග්‍රහකරගත නොහැකි හිස් ලියවිල්ලක් බවට පත්කර ඇත්තේ රාජපක්ෂ පාලනය මෙන්ම රනිල්- මෛත්‍රී පාලනයටද පවතින ආර්ථික අර්බුදයට පිළිතුරු නැති බව පසක් කරමිනි.

ආර්ථික උපායමාර්ගික දැක්මක් වෙනුවට අයවැය තුළ ඇත්තේ ජනතාව පීඩාවට පත්කරන යෝජනා රැසකි.

## ජනතාවට පටවන බර

▲ මාර්ග නීති කඩ කරන්නන් හට පනවන මාර්ග නීති බද්ද - දැනට යෝජිත ආකාරයට මාර්ග නීති 7ක් සඳහා දඩය රු. 25,000/- දක්වාත් මෙතෙක් පැවැති අවම දඩය රු.20/- වෙනුවට රු. 2,500/-ක්ද අය කිරීමට යෝජිතය.

▲ උසස් පෙළ සිසුවාට ටැබ් යන්ත්‍ර දෙන මුවාවෙන් අන්තර් ජාල පහසුකම් ගාස්තු 25%කින් ඉහළ දැමීම

▲ වායු විමෝචන ගාස්තු ඇතුළත්ව කාබන් බද්ද පනවා එම මුදල් රජයට ලබා ගැනීම

▲ නව නඩු පැවරීමේ ගාස්තුවක් අයකිරීම

▲ සෑම ගනුදෙනුවකින්ම (බැංකු හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින්) රු. 1000කට රු. 5ක් ආණ්ඩුවට අයකර ගැනීම

▲ ජාතිය ගොඩ නැගීමේ බද්ද "තාර්කිකරණය" මගින් අමතර මිලියන 7200ක් අයකර ගැනීම. එම තාර්කිකරණය යටතේ මෙතෙක් බදු අය නොකරන ලද සමුපාකාර සමිති හා ලක් සතොස වැනි රජයේ ව්‍යාපාර ආයතනවලටද ජාතිය ගොඩ නැගීමේ බදු අදාළ කිරීම

එසේ බර පැටවීමේ සංයුක්ත එකතුව ලෙස, 2017 වසරේදී රජයේ මුළු ආදායම රු. බිලියන 2088ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. එය 2016 වසරේදී අපේක්ෂිත ආදායමට වඩා 26.7%ක වැඩිවීමකි. නමුත්, ගැටලුව වන්නේ, ආණ්ඩුව බදු දඩ මගින් අපේක්ෂිත මෙම ඉහළ ආදායම ලබා ගැනීමට හැකි වන්නේද යන්නය. 26.7%ක් වැඩිපුර අපේක්ෂා කළද 2015/2016 වසරවල රජයේ ආදායම ඉහළ ගොස් ඇත්තේ 9.2%කින් පමණි.

(ඇමුණුම 1 - 2016.11.12 පාර්ලිමේන්තුවේ රාජ්‍ය මුදල් කාරක සභාවට එවන ලද මුදල් අමාත්‍යංශයේ ආදායම් ඇස්තමේන්තුව)

| රුපියල් බිලියන | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| බදු ආදායම (සමස්ත) | 1356 | 1432 | 1821 |
| ආදායම් බදු | 263 | 236 | 335 |
| ආයතනික | 156 | 32 | 51 |
| උපයන විට ගෙවන බදු | 26 | 32 | 51 |
| පොලී මත අයකෙරෙන බදු | 63 | 68 | 84 |
| පෞද්ගලික | 11 | 15 | 22 |
| ආර්ථික සේවා බදු | 6 | 11 | 20 |
| භාණ්ඩ හා සේවා මත පනවන බදු | 804 | 854 | 1086 |
| එකතු කළ අගය මත පනවන බදු | 220 | 315 | 380 |
| නිෂ්පාදන බදු | 498 | 444 | 575 |
| මත්පැන් | 105 | 130 | 430 |
| සිගරට් | 80 | 85 | 105 |
| මොටර් වාහන | 263 | 180 | 230 |
| පෙට්‍රෝලියම් | 45 | 45 | 55 |
| වෙනත් | 4 | 4 | 5 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 45 | 54 | 66 |
| විදුලි සංදේශ | 33 | 35 | 35 |
| මෝටර් වාහන බදු සහ වෙනත් | 8 | 6 | 22 |
| විදේශ වෙළදාම මත පනවන බදු | 289 | 342 | 400 |
| ආනයන | 132 | 135 | 165 |
| සෙස් | 46 | 55 | 60 |

ආණ්ඩුව යහපාලන අයවැයේ ප්‍රබලම ප්‍රහාරය එල්ල කර ඇත්තේ ජනතාවගේ අනාගතය වෙනුවෙනි. ඒ අධ්‍යාපනයට වෙන්කර ඇති මුදල් රුපියල් කෝටි 3800ක් (බිලියන 38ක්) කප්පාදු කරමිනි. එයට ඇති පැහැදිලි කිරීම හරි අමුතුය. කලින් වසරේ අධ්‍යාපනයට වෙන් කළ වියදම යොදවා නොගත් නිසා මෙවර කපාහැර ඇති බවය. අධ්‍යාපනයට වෙන් කිරීම කප්පාදු කිරීමට ඉදිරියේ කරන තර්කය වෙනත් වියදම් (රජයේ නාස්තිකාර වියදම් අඩුකිරීමට) හෝ ජනතාව පිට පටවන බදු දඩ ගාස්තු අඩුකිරීම අදාළ කර නොගන්නේ කබරගොයි තලගොයි න්‍යායට අනුවය.

## සෞඛ්‍ය හා අධ්‍යාපන කප්පාදුව

අධ්‍යාපනය සඳහා රජයේ පංගුව අඩුකරන ආණ්ඩුවම අයවැයේ තවත් යෝජනාවකින් යෝජනා කරන්නේ විශ්වවිද්‍යාල සුදුසුකම් ඇති දරුවන් ඇතළත් කරගන්නා පෞද්ගලික විද්‍යාලවලට පහසුකම් සැලසීමට එම විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන දරුවන්ට රුපියල් ලක්ෂ අටක ණය මුදලක් ලබාදෙන බව කියාසිටීමය. මෙම යෝජනාවේ අරමුණ ඉතා පැහැදිලි ලෙසම රජයේ අධ්‍යාපනයට වෙන්කරන මුදල් කප්පාදු කරන අතරම දැනුම වෙළඳ භාණ්ඩයක් බවට පත්කර අලෙවි කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීමය.

අධ්‍යාපනයට මෙන්ම සෞඛ්‍යයටද PPP (රාජ්‍ය-පෞද්ගලික සහභාගිත්වය) ඇති කිරීම රජයේ අරමුණ ලෙස දක්වමින් සිදුකරනු ලබන්නේ, දැනට රජයේ අත්‍යාවශ්‍ය සුභසාධන කටයුතු ලෙස පවත්වාගෙන යන අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා පෞද්ගලික කරණය සඳහා විවෘත කිරීමයි. පෞද්ගලික අංශය සමග ඒකාබද්ධවී රජයේ රෝහල්වල ගෙවන වාට්ටු පිහිටුවීමට යෝජනා කිරීම මෙවර අය වැය තුළ අන්තර්ගතව ඇත්තේ එහි එක් පියවරක් ලෙසිනි.

සීනි කි.ග්‍රෑ. 1ක් රුපියල් 5කින්, හාල් මැස්සන් කි.ග්‍රෑ. 1ක් රුපියල් 5කින් අඩු කිරීම වැනි තාවකාලික බාල යෝජනා ප්‍රමාණයකින් ජනතාව සතුටු කිරීමට උත්සාහ කළද එක් දඩ කොළයකින් ඒ සියල්ල තමන්ගෙන් නැවත අය කර ගන්නා බව ජනතාවට දැන් මනාව පැහැදිලිය. මෙවර අයවැය තම නොහැකියාව ආණ්ඩුව විසින් ජනතාවට පෙන්නුම් කළ හොඳම ලිඛිත සාක්ෂිය බව ඔප්පු කර හමාරය.



"මාක්ස්වාදය මට සමාජය යනු කුමක්දැයි ඉගැන්නුවා. මම ඊට පෙර සිටියේ දෑස් බැඳ උතුර දකුණ සොයාගැනීමට නොහැකිව මහා වනයක අතරමංවූ අයෙක් ලෙසයි. ඔබ සැබෑ ලෙසම පංති අරගලයේ ඉතිහාසය තේරුම් ගන්නේ නැතිනම්, අඩුගනනේ සමාජය පොහොසත් හා දුප්පත් ලෙස බෙදී ඇති බව හා එක් පිරිසක් අනෙක් පිරිස සූරාකන බව පැහැදිලිව තේරුම් ගන්නේ නැතිනම් ඔබ කැලෑවක අතරමංවූ කිසිවක් නොදන්නා අයෙක් බවට පත් වෙනව."

**ෆිදෙල් කස්ත්‍රෝ**

## අය වැය 2017

# කාන්තාවන් හා ළමුන් අමතක කර...

පසුගිය මාසය ගෙවී ගියේ 2017 වසර සඳහා වූ අයවැයේ උණුසුමත් සමගය. රටක අනාගතය ගැන හොඳ සැලසුමක් ඇතිව අයවැය සකස් කරන්නේ නම් විශේෂ අවධානය යොමු කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් ඇත. එම ප්‍රධාන ක්ෂේත්‍ර අතරින් එකක් වන කාන්තා හා ළමුන් සඳහාද ආණ්ඩුවල විශේෂ අවධානය යොමුවිය යුතුය. ඒ, ළමුන් යනු රටේ අනාගත සම්පත වන බැවිනුත් කාන්තාවන් යනු ඒ අනාගත පරපුර බිහිකරන්නියන් බැවිනුත් මේ පාර්ශ්වයන් දෙකෙහිම අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරීම ආණ්ඩුවල වගකීම වන බැවිනුත්ය.

පිහිටුවා තිබෙන්නේ එක් කෝටි හැට ලක්ෂයක් පමණ වූ කාන්තාවන් හා ළමුන් පිළිබඳව විශේෂ අවධානයකින් ආණ්ඩුව මැදිහත් විය යුතු නිසාය.

කාන්තා හා ළමා කටයුතු සඳහා වෙන් කරන මුදල් වසරක් තුළ රුපියල් කෝටි 706කින් කපා හරින අතරේ ජනාධිපතිවරයාගේ හා අගමැතිවරයාගේ 2017 වසරේ වියදම් සඳහා වූ මුදල් වැඩි කරගෙන ඇත. 2016 වසර සඳහා වූ ජනාධිපතිවරයාගේ වියදම් රුපියල් කෝටි 239 සිට රුපියල් කෝටි 665 දක්වා ඉහළ නංවාගෙන ඇත. එසේම 2016 වසර සඳහා වූ අගමැතිවරයාගේ වියදම් රුපියල් කෝටි 125 සිට

අමාත්‍යාංශයක්, අමාත්‍යවරියක් සිටියාට රටේ කාන්තාවන්ට හා ළමුන්ට සිදුවන කිසිදු සෙතක් නොමැත. මුළු රටම අර්බුදයට ගිය විට, සෑම ක්ෂේත්‍රයක්ම බිඳ වැටීමට ලක් වූ විට කාන්තා හා ළමා අයිතීන් පමණක් රැකෙන්නේ නැත. මන්ද මෙය වත්මන් ධනවාදී සමාජ ක්‍රමයේම ප්‍රශ්නයක් වන නිසාය. සෑම විනාඩි 90කට වරක් කාන්තාවක් ලිංගික අතවරයකට ලක්වන, ළමා අපචාර සීඝ්‍රයෙන් වර්ධනය වන රටක වෙසෙන කාන්තාවන් ලෙස අප මෙම සමාජ තත්වයන් වෙනස් කර ගැනීම සඳහා පෙරට ආ යුතු කාලයයි මේ.



එහෙත් කනගාටුවට හේතුව නම් එසේ විශේෂ අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර සෑම එකකටම පාහේ ආණ්ඩුවලින් හිමිව ඇත්තේ කුඩම්මාගේ සැලකිල්ලය. මෙවර ඉදිරිපත් කළ 71 වැනි අයවැය තුළින්ද සිදුව ඇත්තේ සුපුරුදු පරිදි අධ්‍යාපනය, සෞඛ්‍ය ක්ෂේත්‍රවලට මෙන්ම කාන්තා හා ළමා කටයුතු ක්ෂේත්‍රයටද කලින් හිමිව තිබූ ප්‍රතිපාදන ප්‍රමාණයවත් නොලැබී යාමය.

2016 වසර සඳහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයට රුපියල් කෝටි 976ක මුදලක් වෙන් කළද 2017 වසර සඳහා එම මුදල රුපියල් කෝටි 270 දක්වා කපා හැර ඇත. කපා හැර ඇති මුදල රුපියල් කෝටි 706කි.

අපේ රටේ කාන්තා ජනගහනය 52%කි. එනම් එක් කෝටි හත් ලක්ෂයක් පමණය. ළමා ජනගහනය ලක්ෂ 53ක් පමණය. කාන්තාවන් හා ළමුන් සඳහා වෙනමම අමාත්‍යාංශයක්

රුපියල් කෝටි 239 දක්වා වැඩි කරගෙන තිබේ. ඒ අනුව ජනාධිපතිවරයා වෙනුවෙන් දවසකට රුපියල් එක් කෝටි 76 ලක්ෂයක් පමණද, අගමැතිවරයාගේ දවසක වියදම රුපියල් ලක්ෂ 65ක් පමණද වැඩි කරගෙන ඇත. එසේ වැඩි කරගන්නා අතරේ 2016 දී කාන්තාවන් හා ළමුන් වෙනුවෙන් දවසකට වෙන්කර තිබූ මුදල රුපියල් 1.67 සිට 2017 වසරේදී දවසකට ශත 46ක් පමණ දක්වා කපා හැර ඇත.

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වන්නේ කාන්තා හා ළමුන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් අණ පනත් සම්මත කරගෙන ඒවා ක්‍රියාත්මක කිරීම වුවත් නොකෙරෙන්නේත් එයමය. තවමත් ලංකාවේ කාන්තා ප්‍රඥප්තියක් ප්‍රකාශයට පත් කර නොමැත. එසේ නැතහොත් සම්මත වූ පනත් ඇත්නම් ඒවා ක්‍රියාත්මක වන්නේ නැත. නමට

# ජෙනී මාක්ස්




''අවකාශය විසින් අප දෙදෙනා වෙන් කළ විගසම කාලය, මගේ ආලයට සේවය කළේ පැළෑටිවලට හිරු රැස් හා වැසි ජලය සේවය කරන්නාක් මෙන්ය. ලෝකයේ බොහෝ කාන්තාවන් සිටින බවත් ඔවුන්ගෙන් සමහරු ඉතා සුන්දර බවත් නොකිවමනාය. එහෙත් මගේ ජීවිතයේ ඉතාම බලවත් සහ සුන්දරම මතකයන් පුබුදුවාලන, හැම ලක්ෂණයක්ම සහිත වෙනත් මුහුණක් මා කොහෙන් සොයාගන්නද? අවසානයක් නැති මගේ වඳ වේදනාවන්, මැකිය නොහැකි පාඩු පවා මම ඔබේ සුන්දර මුහුණෙන් දකිමි. ඒ වටිනා සුන්දර මුහුණ සිපගන්නා විට වඳ වේදනා පසුබා නැඟී සිටීමට මම සමත්වෙමි.''

මේ මාක්ස්වාදයේ පියා ලෙසින් හඳුන්වන 20 වන සියවසේ ශ්‍රේෂ්ට බුද්ධිමතෙකු වූ කාල් මාක්ස් තම ආදරණීය බිරිඳ වූ ජෙනී මාක්ස්ට ලියා යැවූ ලිපියක සඳහන් වූවක්.

1814 ජර්මනියේ ට්‍රීර් නගරයේ රදල පවුලක උපන් ජෙනී, තාරුණ්‍යයේ එළිපත්තට පැමිණෙද්දී කාල් මාක්ස් හා පෙමින් වෙළුණා. ඒත් මේ සම්බන්ධයට ඇගේ ඥාතීන්ගෙන් එල්ලවුණේ දැඩි විරෝධයක්. තමන්ගේ සියලු වත්කම්වලට වඩා මාක්ස් වටින බව තේරුම්ගත් ඇය වසර 7ක ප්‍රේමය වඩාත් ගැඹුරු බැඳීමකට පෙරළමින් 1836 ගිම්හාන කාලයේදී කාල් මාක්ස් හා අතිනත ගත්තා. මාක්ස් අසාධාරණයට ලක් වූ බහුතරයක් මිනිසුන් වෙනුවෙන් දිවා රෑ නොබලා වෙහෙසෙද්දී, ඒ අසාධාරණයට ලක් වූ පංතියට අවබෝධය ලබා දීමට තම පෑන මෙහෙයවද්දී ඔහු ළඟින් සෙවණැල්ලක් සේ සිටිමින් ඔහුට උදව් කළේ ඇයයි.

පවුලේ අගහිඟකම් සෙමින් සෙමින් වැඩිවෙද්දී ඔහු දුක් විඳින මිනිසුන් වෙනුවෙන් උදාර සේවයක් කරන බව වටහා ගත් ඇය මාක්ස්ගේ හැම කටයුත්තකදීම නොමඳව උදව් කළා. මාක්ස්ගේ අත් පිටපත් නැවත ලියමින්ද පොත්පත් ලිවීමට අවශ්‍ය නිදහස ලබාදෙමින්ද ඇය ඔහුට සැබෑ සහායිකාවක් වුණා.

බොහෝ දිනවල එකම ආහාරය ලෙස පාන් සහ අර්තාපල් ගැනීමට සිදු වූ විටත් දරුවන්ගේ සෞඛ්‍ය තත්වය ක්‍රමයෙන් බරපතළ තත්වයට පත්වන විටත් අඳුරු සීතල වැසි සමයන් හිදී ගෙවල් කුලී ගෙවා ගැනීමට නොහැකිව ගෙවල් අතහැර යාමට සිදුවූ විටත් ඇය මාක්ස් හා කිසි විටෙක උරණ වූයේ නැහැ. එය කෙසේ හෝ විඳ දරා ගැනීමට ඇය සමත් වුණා.

අගහිඟකම් විඳ දරා ගැනීමට සමත් වුණත් ඒ අගහිඟකම්වල ප්‍රතිඵලයක් ලෙස තම ආදරණීය දරුවන්ගෙන් කිහිපදෙනෙක් ඉතා අඩු වයසින් රෝගාතුර වී මරු තුරුලට යන විට අම්මා කෙනෙක් ලෙස ඇය ඒවා කෙසේ විඳ දරාගන්නට ඇත්ද?

ඒ සියලු දුෂ්කරතා අභියස නොසැලී හිදිමින් මාක්ස්ට සහාය දුන් ඇය, මාක්ස් මෙන්ම දුක් විඳින මිනිසුන් වෙනුවෙන් තම ජීවිතය නිහඬව කැප කළ ඇය, අක්මාවේ පිළිකාවකින් රෝගාතුරව මෙලොව හැරගියේ 1881 දෙසැම්බර් 23 දායි. ඇය කළ විශිෂ්ට සේවය ඇගයීමට මෙවැනි කෙටි සටහනක් ප්‍රමාණවත් නොවූවත් එවන් චරිත ගැන නැවත නැවත සිහි කිරීම තුළින් අපේ ජීවිතවලට යමක් උකහාගත හැකියි.

## හෙටත් අද වාගේ නොවෙන්නම...


ජීවිතය හෙම්බත්ව
කුරගාන මිනිසුනට
හීන පොකුරක් අරන්
ඇවිත් උඳුවප් සීත...

ඒ සීතලට හසුව
ගල් ගැසුණු පපු කුහර
කකියනා ලේ බිඳක
තෙත හඳුනනුද? කෙලෙස...

යනෙන විට මග දෙපස
ලාබ කළ හීනවල
නෙත රැඳී හිත හඬයි
හිස් පසුම්බිය කොණක...

එදත් කවදත් වගේ
අදත් උඳුවප් ගෙවෙයි
නිමක් නැති හීන පොදි
තොගය අවසන් නොවෙයි...

හෙටත් දවසක් නොවී
අදත් වාගෙම ගෙවෙන
ඉතින් යමු ඒ හීන
සැබෑවෙන දිනක් වෙත...



දැනුම සමාජය හා චින්තනය 11

# පෙනුමේ හා හරයේ වෙනස

අප අවට ලෝකයත් මානව සමාජයත් නිවැරදිව වටහා ගැනීමේදී ඒ වෙත ප්‍රවේශ විය යුතු ආකාරය පිළිබඳව අපි කථා කරමින් සිටිමු. එහිදී තවත් එක් ආකාරයක් වන්නේ අඩංගුව සහ ආකාරය ලෙස ලෝකය තේරුම් ගැනීමය. අඩංගුව හා ආකාරය යනු එක වස්තුවක එකිනෙකට අන්තර් සම්බන්ධිත පාර්ශ්ව දෙකකි. එහෙත් මේ දෙක අතර සම්බන්ධයක් මෙන්ම ප්‍රතිවිරෝධයක්ද තිබේ. ඕනෑම භෞතික වස්තුවක් මෙන්ම සමාජයද සකස්ව ඇති ආකාරයක් තිබේ. එසේම එහි අඩංගුවක්ද තිබේ. ඒ නිසා ලෝකය තේරුම් ගැනීමේදී ආකාරය අනුව පමණක් නොව එහි වන අඩංගුව අනුවද තේරුම් ගත යුතුවේ.

උදාහරණයක් ලෙස සමාජය දෙස බලමු. වත්මන් ධනපති ක්‍රමයේ ආකාරය කුමක්ද? එය බොහෝ විට පෙනී සිටින්නේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු නැමති ආකාරයෙනි. විටෙක සමූහාණ්ඩුවකි. තවත් විටෙක ජනරජයකි. ලංකාවේදී ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය ලෙස පෙනී සිටී. එහෙත් ධනවාදයේ අඩංගුව කුමක්ද? සූරාකෑම, පංති පාලනය, පංති පීඩනය ආදිය වේ. ධනවාදයේ අඩංගුව තුළ ඇත්තේ, ධනේශ්වර පංතියේ ආඥාදායකත්වයයි. එනම් ධනේශ්වර ප්‍රාග්ධනය හා ධනේශ්වර රාජ්‍යයයි. එහෙත් එහි ආකාරය විවිධය. ආකාරය ප්‍රජාතන්ත්‍රවාදී වුවද අඩංගුවේ ඇත්තේ පංති පාලනයකි. එසේම සමහර විට ලෝකයේ සමාජ ක්‍රම හඳුනා ගැනීමේදීද මේ දැක්ම අපිට ප්‍රයෝජනවත්ය.

### සමාජවාදයද? ධනවාදයද?

ලොව රටවල් සමාජවාදීද ධනවාදීද යන්න වටහා ගැනීමේදී එය එම රටේ සමාජ ආකාරය දෙස බලා තීරණය කළ නොහැක. ඒ සඳහා එහි අඩංගුව වටහා ගත යුතු වේ. කිසියම් රටක් සමාජවාදීද නැද්ද යන්න තීරණය කිරීමේදී එම රටේ දේපළවල අයිතියත්, දේපළ ආකාරයත් ඊටත් වඩා එහි රාජ්‍ය බලය දරන්නේ කුමන පංතියද යන්නත් වැදගත් වේ. 1970 දශකයේදී ලංකාව හඳුන්වනු ලැබූයේ සමාජවාදී රාජ්‍යයක් ලෙසය. එසේම එම කාලයේ ලොව බොහෝ රටවල් පෙනුමෙන් එනම් ආකාරයෙන් සමාජවාදී මෙන් විය. එහෙත් එය එසේ නොවීය. ඒවයේ අඩංගුවේ තිබුණේ ධනේශ්වර දේපළ සබඳතාය. ධනේශ්වර රාජ්‍ය බලයය. එසේම දැන් සමහරු චීනය ධනවාදයට ගොස් ඇතැයි කියති. ඒ, චීනයේ දේපළවල ආකාරය තුළ සමාගම් පවතින නිසාය. තනි තනි ධනපතියන් සිටින නිසාය. එහෙත් චීනයේ අඩංගුව තුළ තවම ඇත්තේ වැඩි වශයෙන් පොදු දේපළය. එහි රාජ්‍ය බලය දරන්නේ, ධනපති පංතිය නොව කොමියුනිස්ට් පක්ෂයය. චීනයේ අඩුපාඩු හා දුර්වලතා ඇතත් එය සමාජවාදීය. එය තේරුම් ගත හැක්කේ ආකාරය අනුව පමණක් නොව අඩංගුව අනුවද යමක් වටහා ගන්නා විටය.

### හරය හා පෙනුම

ප්‍රකෘතිය තේරුම් ගැනීමේ තවත් ආකාරයක් වන්නේ, හරය හා පෙනුම ලෙස එය තේරුම් ගැනීමය. මෙය අප කලින් කථා කළ අඩංගුව හා ආකාරයට සමාන වුවත් ඊට සර්වසම නොවේ. එහෙත් අප ඉහත සඳහන් කළ උදාහරණ හරය හා පෙනුම සඳහාත් ගැලපේ.

ඕනෑම වස්තුවකට, ක්‍රියාවලියකට, සිදුවීමකට පෙනුමක් තිබේ. අප පංචේන්ද්‍රියයන් මගින් වහාම හඳුනා ගන්නේ එම පෙනුමයි. එසේම ඊට හරයක්ද තිබේ. එය අපට වහාම හඳුනාගත නොහැක. ඒ හරය පෙනුම තුළ සැඟව පවතින නිසාත් බොහෝ විට හරය පෙනුමට වඩා ප්‍රතිවිරෝධීව තිබෙන නිසාත්ය. තාර්කික අධ්‍යයනයක් අවශ්‍ය වෙන්නේ ඒ නිසාය. 'හරය හා පෙනුම සමපාත වන්නේ නම් විද්‍යාවක් අවශ්‍ය නොවනු ඇත' යනුවෙන් වරක් එංගල්ස් පැවසූවේ මෙම ස්වභාවය ගැනය. ලෝකය තේරුම් ගැනීමේදී හැම විටකම පෙනුම සත්‍යය නොවේ. සත්‍යය ඇත්තේ හරය තුළය. එබැවින් පෙනුම සත්‍ය ලෙස සිතා මුලා නොවී හරය වටහා ගත යුතුය.

### පැතලි ලෝකය හා ලෝක ගෝලය

පෘථිවිය මත අතීතයේ ජීවත් වූ මිනිසා විශ්වාස කරනු ලැබුයේ ලෝකය පැතලි වස්තුවක් බවය. ඒ මිනිසාගේ දැස් පෙනුමේ සීමාව අනුව පෙනුමින් ලෝකය පැතලි ලෙස පෙනුන නිසාය. එහෙත් පසු කලෙක විද්‍යාවේ දියුණුව නිසා පෘථිවිය ගෝලාකාර බව සොයාගන්නා ලදී. එසේම ආදි කාලීන මිනිසා සිතුවේ සූර්යයා පෘථිවිය වටා ගමන් කරන බවකි. ඒ 'පෙනුමට' අනුව එසේ පෙනෙන නිසාය. සූර්ය කේන්ද්‍රවාදය පවා නිර්මාණය වූයේ මේ අනුවය. එහෙත් හරය අනුව ගත්කල සත්‍යය වන්නේ, පෘථිවිය සූර්යයා වටා ගමන් කිරීමය. එපමණක් නොවේ අහසේ ඇති තරු දෙස බැලූවිට අපට පෙනෙන්නේ, ඒවා එකිනෙකට ළංව පිහිටා ඇති ලෙසය. විවිධ තරු රටා 'රාශි' ලෙස මිනිසා විසින් නම් කළේද මෙම 'පෙනුම' සත්‍ය සේ සලකාය. එහෙත් හරය ඊට වෙනස්ය. එකිනෙකට සමීප ලෙස අපට පෙනෙන තරු සැබෑ ලෙස පවතින්නේ ආලෝක වර්ෂ දහස් ගණන් එකිනෙකට දුරස්ථවය. හරය හා පෙනුම වැදගත් වන්නේ මේ නිසාය. සමාජයක් වටහා ගැනීමේදී ආණ්ඩුවක් තේරුම් ගැනීමේදී පමණක් නොව තනි තනි මිනිසුන් වටහා ගැනීමේදීද පෙනුමෙන් අවසන් නිගමනයකට නොපැමිණ හරය අවබෝධකර ගැනීම අත්‍යාවශ්‍යය. අපට අධ්‍යයනය අවශ්‍ය වන්නේ ඒ සඳහාය. අපේ රටවල සුදුවතින් සැරසී සිටින අතේ පිරිත් නූල් බැඳ සිටින නිතර පන්සල් යන බොහෝ දේශපාලනඥයින් පෙනුමෙන් සිල්වත් ගුණවත් සේ පෙනුණද හරයෙන් ගත්කල අපරාධකරුවන්, සමාජ විරෝධී වැඩකරන්නන් බව පැහැදිලි වේ. පෙනුමින් අහිසංක ලෙස පෙනෙන, පෙනුමින් හොඳ ලෙස පෙනෙන හැම දෙනාම එසේ නොවන බවත් හරයෙන් ගත්කල එවැනි සමහර අය නපුරු දුෂ්ට මිනිසුන් බවත් අපි අත්දැකීමෙන් දකිමු. ඒ අප දැක ඇත්තේ මෙම සත්‍යයි. ඒ නිසා ලෝකයත් සමාජයත් මිනිසාත් නිවැරදිව වටහා ගැනීමේදී පෙනුම හරහා නොව හරයට අනුව තේරුම් ගැනීම අවශ්‍ය වේ. ජනතාව මෙම දැක්මට අනුව කටයුතු කරන්නේ නම් ධනපති කපටි පාලකයන්ට යළිත් නොරැවටෙනු ඇත.

> විවිධ තරු රටා 'රාශි' ලෙස මිනිසා විසින් නම් කළේද මෙම 'පෙනුම' සත්‍ය සේ සලකාය. එහෙත් හරය ඊට වෙනස්ය. එකිනෙකට සමීප ලෙස අපට පෙනෙන තරු සැබෑ ලෙස පවතින්නේ ආලෝක වර්ෂ දහස් ගණන් එකිනෙකට දුරස්ථවය. හරය හා පෙනුම වැදගත් වන්නේ මේ නිසාය. සමාජයක් වටහා ගැනීමේදී ආණ්ඩුවක් තේරුම් ගැනීමේදී පමණක් නොව තනි තනි මිනිසුන් වටහා ගැනීමේදීද පෙනුමෙන් අවසන් නිගමනයකට නොපැමිණ හරය අවබෝධකර ගැනීම අත්‍යාවශ්‍යය.



### හේතුව හා ඵලය

ලෝකය තේරුම් ගැනීමේ තවත් වැදගත් ආකාරයක් වන්නේ, හේතුව හා ඵලය නිවැරදිව අවබෝධ කර ගැනීමය. ලොව පවතින සෑම දෙයකටම, සිදුවන හැම සිදුවීමකටම එය එසේ වීමට පාදක වූ හේතුවක් හෝ හේතු සමුදායක් තිබේ. හේතුවකින් තොරව කිසිදු ඵලයක් බිහි නොවන අතර සෑම ඵලයකටම හේතුවක් හෝ හේතු කිහිපයක් තිබේ. මෙම හේතු නිවැරදිව වටහා ගැනීම වැදගත්වන අතර එසේ නොවූ විට අප වැරදි නිගමනවලට ගොස් රැවටීමට ලක්වේ.

ඕනෑම ඵලයක හේතුව හෝ හේතු පවතින්නේ ඵලයට පෙරාතුවය. එහෙත් අනෙක් අතට ඵලයට පෙරාතුව පවතින හැම දේම එහි හේතුව නොවේ. එබැවින් හේතුව සොයාගත හැක්කේ අධ්‍යයනයකින් පසුව පමණි. අපට මෙය වැදගත් වන්නේ ඇයි? අප අවට සිදුවන හා පවතින හැම දේම හොඳ දේවල් නොවේ. නරක දේද සිදුවේ. නරක ඵලයක් වැළැක්වීමටත් හොඳ දේවල් ලබාගැනීමටත් අපට පහසුවන්නේ, ඊට අදාළ සැබෑ හේතු වටහා ගැනීම මගිනි. ඕනෑම ඵලයක සැබෑ හේතුව වටහා නොගත්විට අපගේ ක්‍රියාකාරිත්වය සිදුවන්නේ නිවැරදි දැක්මක් අවබෝධයක් තුළ නොව වැරදි දැක්මක් තුළය. එවිට අපට ලැබෙන ප්‍රතිඵලයද අපට අවශ්‍ය ප්‍රතිඵලය නොවේ. උදාහරණ කිහිපයකින් මෙය තේරුම්ගත හැකිය.

### අහසින් ගිය ඉබ්බා

අහසින් ගිය ඉබ්බාගේ කතාව ළමා කාලයේ අප අසා ඇති ප්‍රසිද්ධ කතාවකි. එම කතාවට අනුව අපට උගන්වන්නේ ඉබ්බා වැටීමේ 'හේතුව' 'කට' බවය. එහෙත් මෙය සත්‍ය නොවේ. ඉබ්බා වැටීමේ සැබෑ හේතුව කට නොව ගුරුත්වාකර්ෂණයය. කට ඇරීම වැටීමට පෙර සිදුවූ ආසන්න සිදුවීම මිස හේතුව නොවේ. ඒ නිසා යමක හේතුව ලෙස ඒ සමඟ සිදුවූ ආසන්න සිදුවීම ගැනීම නිවැරදි නොවේ. ලෝකයේ අතීතයේ ලෝක යුද්ධ දෙකක් සිදුවිය. ධනවාදී අධ්‍යයනය ලෝක යුද්ධවලට හේතු ලෙස කියා සිටියේ සරල සිදුවීම්ය. 1වැනි ලෝක යුද්ධයට හේතුව ලෙස කියා සිටියේ ඔස්ට්‍රියාවේ ෆර්ඩිනැන්ඩ් කුමරා සර්බියානු ජාතිවාදියෙකු විසින් ඝාතනය කිරීම බවය. එය එසේනම් ලෝක යුද්ධ ඇතිවීම වැළැක්වීම ලෙහෙසිය. කුමාරවරු ඝාතනය නොකර සිටි විට යුද්ධ ඇති නොවේ. එහෙත් එසේ නොවී දෙවන ලෝක යුද්ධයද ඇතිවිය. ඒ ඇයි? ලෝක යුද්ධවල සැබෑ හේතුව

15 වැනි පිටුවට



"මාධ්‍ය මගින් කරන්නේ බොරු කියන එක පමණක් නොවේ. සාවද්‍ය පරාවර්තනයන් ඇති කිරීමයි. බොරුව හා සාවද්‍ය පරාවර්තනයන් යනු වර්ග දෙකක්. බොරුව දැනුම මත ඍණාත්මක බලපෑමක් ඇති කරනවා. සාවද්‍ය පරාවර්තනයන් චින්තනය මත ඍණාත්මක බලපෑමක් ඇති කරනවා. එය තොරතුරු වසන්කිරීමට හෝ විකෘති කිරීමට සමාන නැහැ. එමගින් සිදුවන්නේ සිතීමට ඇති හැකියාව මොට කිරීමයි."

**ෆිදෙල් කස්ත්‍රෝ**

# වරාය විකිණීම හා රට ඉදිරියේ ඇති අභියෝගය



ශ්‍රී ලංකාවේ සමුද්‍රීය නාවික ඉතිහාසය සැලකීමේදී එය ඉතා දීර්ඝ ඉතිහාසයකට ගමන් කරයි. ටොලමි විසින් අඳින ලද ලෝක සිතියමේ පවා ශ්‍රී ලංකාවේ වරායන්ද ඒවා පිහිටි ස්ථානද සලකුණු කර තිබීමෙන් එම කරුණ මනාව පැහැදිලි වේ. අතීතයේ සිටම ශ්‍රී ලංකාව නාවික කේන්ද්‍රස්ථානයක් ලෙස ලොව පුරා ප්‍රචලිතව පැවතුණි. ඉන්දියන් සාගරය මැද ඉන්දියානු අර්ධද්වීපයට දකුණින් පිහිටා ඇති ශ්‍රී ලංකාව, බටහිර සිට නැගෙනහිරටත්, නැගෙනහිර සිට බටහිරටත් යාත්‍රා කළ වෙළෙඳ හා සංචාරක නාවිකයින්ගේ ප්‍රකට නැව් තොටක් ලෙස පැවතුණි.

එදා මෙදා තුර සියවස් ගණනාවක් ගෙවී ගොස් ඇතත් ශ්‍රී ලංකාවේ සමුද්‍රික වෙළඳාම සඳහා කේන්ද්‍රීය වටිනාකම පහව ගොස් නැත. ඒ නිසාම අප්‍රිකානු මහද්වීපයට අයත් නැගෙනහිර වෙරළේ පිහිටි වරායන් සඳහාද මැදපෙරදිග කලාපයේ පිහිටි වරායන් සඳහාද අග්නිදිග හා නැගෙනහිර කලාපයේ වරායන් සඳහාද බෙංගාල බොක්කේ පිහිටි වරායන් සඳහාද ඉතාමත් වැදගත් නාවික කේන්‍ද්‍රස්ථානයක් බවට කොළඹ වරාය පත්ව ඇත. කොළඹ වරායේ සිට සැතපුම් හතක දුරින් පිහිටි ආසියානු පැසිපික් සේද මාර්ගය ඔස්සේ දිනකට නෞකා 300 - 400 අතර ප්‍රමාණයක් ගමන් කරනු ලබයි.

ශත වර්ෂ ගණනාවක් ස්වභාවික වරායක් ලෙස පැවති කොළඹ වරාය ඉංග්‍රීසි පාලන සමය තුළ කෘත්‍රිම වරායක් බවට පත්කර ඇත. 1885 වර්ෂයේදී ඉදිකිරීම් අවසන් කර ඇති දිගින් අඩි 4212ක් වූ නිරිතදිග දියකඩනය මඟින් විවෘතව පැවති මුහුදු බොක්ක මනා සේ ආවරණය වූ ආරක්ෂිත වරායක් බවට පත්වීමත් සමඟ නාවික වෙළෙඳ නෞකාවලට කොළඹ වරාය මඟහැර යා නොහැකි වරායක් බවට පත්වී ඇත.

කෘත්‍රිම වරායක් ලෙස කොළඹ වරාය සියවසකට ආසන්න කාලයක් පැමිණි ගමන් මඟ 1979දී තීරණාත්මක වෙනසකට බඳුන් විය. එම කාලවකවානුව වන විට කොළඹ වරායේ කටයුතු වරාය කොමිෂන් සභාව, වරාය නැව් බඩු සංයුක්ත මණ්ඩලය, වරාය සැසඳුම් හා ආරක්ෂක සංස්ථාව යටතේ ක්‍රියාත්මක විය. නාවික වෙළඳාමේ සිදුවෙමින් පැවති සීඝ්‍ර වෙනස්කම්වලට අනුගත වන පරිදි 1979දී කොළඹ වරාය කටයුතු සිදුකළ ප්‍රධාන ආයතන තුන අහෝසි කර 1979 අංක 51 දරන ශ්‍රී ලංකාවේ වරායවල් පිළිබඳ පාර්ලිමේන්තු පනත මඟින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටවනු ලැබිණි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවීමෙන් පසු මීටර් හතක්ව පැවති කොළඹ වරායේ ගැඹුර මීටර් පහළොවක් දක්වා ගැඹුරු කරමින් එකවර නෞකා 27ක් නැංගුරම් ලා තැබිය හැකි වරායක් බවට පත්වීම විශාල ජයග්‍රහණයකි. විශේෂයෙන් අන්තර් ජාතික ප්‍රමිතීන්ට අනුකූලව සියලු යන්ත්‍ර සූත්‍රද සහිතව ඉදිකරන ලද ජයබහළු පර්යන්තයේ පළමු අදියර 1985 වර්ෂයේදී මෙහෙයුම් කටයුතු ආරම්භ වීමත් සමඟ විදෙස් විනිමය උත්පාදනයෙහි ලා එතෙක් පැවති සම්ප්‍රදායන් බිඳ දමමින් රජය අන්තර් ජාතික වෙළෙඳාම සමඟ සෘජුව සම්බන්ධ වී ඇත. ඒ අනුව ලෝකයේ ප්‍රති අපනයන බහලු මෙහෙයුම් කටයුතු සිදුකරන වරායන් අතර කොළඹ වරාය ප්‍රමුඛ වරායක් බවට පත් වී ඇත.

මෙලෙස අන්තර් ජාතික නාවික වෙළඳ කටයතු සමඟ සෘජුව සම්බන්ධ වෙමින් රටට මහා ධනස්කන්ධයක් උපයා දෙන ලද කොළඹ වරාය සතුව පැවති බහළු මෙහෙයුම් පර්යන්ත තුනෙන් එක් පර්යන්තයක් වූ එලිසබෙත් රැජිණ පාලම (QEQ) චන්ද්‍රිකා කුමාරතුංග රජය විසින් සී/ස දකුණු ආසියා ද්වාර (South Asia Gateway Terminal - SAGT) පර්යන්ත සමාගම වෙත 1999 වර්ෂයේදී විකුණා දමන ලදී. එය වරාය අධිකාරියට එල්ල කරන ලද බලවත් පහරක් මෙන්ම එය ශ්‍රී ලංකා ආර්ථිකයටද බලපාන සිදුවීමක් විය.

මෙවැනි බාධාකාරී හා ගැටලුකාරී තීරණ හමුවේ වුවද කොළඹ වරාය රජයට මහා ධනස්කන්ධයක් උපයාදෙන ආයතනයක්ව පැවතුණි. විශේෂයෙන් අධ්‍යාපන සේවා, සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාමට අවශ්‍ය මුදල් වරාය උපදවන ධනය උපයෝගි කර ගෙන රජය වියදම් කරන ලදී.

අන්තර් ජාතික නාවික වෙළඳාම 90 දශකයේ අග භාගය වන විට වෙනස්කම් රැසකට බඳුන්ව පැවති අතර එමඟින් කොළඹ වරායේ මෙහෙයුම් කටයුතුවලට සෘජුව බලපෑම් සිදුවිය. විශේෂයෙන් නැව් සමාගම් තම ප්‍රවාහන වියදම අඩුකර ලාභය වැඩිකර ගැනීම අරමුණු කර ගනිමින් විශාල නෞකා මඟින් භාණ්ඩ ප්‍රවාහන කටයුතුවල නිරතවීම 90 දශකයේ අග වන විට අරඹා තිබුණි. ඒ අනුව නැව් නිෂ්පාදනය කරනු ලබන සමාගම් ඉදිකරමින් පැවති නෞකාවල ගැඹුර මීටර 15 ඉක්මවා තිබූ අතර 1997 වර්ෂයේදී කොළඹ වරායට පැමිණි Regina Mearsk නෞකාවේ ගැඹුර මීටර 14.5 ක් විය.

> රාජපක්ෂ පාලනය පෙරළා දමා බලයට පැමිණි රනිල් - මෛත්‍රී හයිබ්‍රිඩ් ආණ්ඩුවට මේ වන විට වසර දෙකකට ළංවී ඇත. රටේ ජනතාවත් වරාය සේවකයාත් වෙනසක් බලාපොරොත්තු විය. සිදුව ඇත්තේ පැවති නපුර වෙනුවට අලුත් නපුරක් පැමිණීම පමණි.

2004 වර්ෂයේ ඉදිකරන ලද Emma Mearsk නෞකාවේ ගැඹුර මීටර 16 ක් පමණ විය. එම නැව කොළඹ වරාය වෙත නොපැමිණි අතර ඉන්පසු නාවික වෙළෙඳ කටයුතුවලට එක්කරන ලද නෞකා කොළඹ වරාය අත්හැර ඒ වන විට ඉදිකර පැවති ගැඹුරින් වැඩි වරායන් වෙත යාත්‍රා කිරීම සිදුවිය. මේ අනුව කොළඹ වරායේ ඉරණම ඉතා පැහැදිලි වූ අතර ඉතාම නුදුරු කාලයකදී වරාය සතු පර්යන්ත දෙකේ (JCT/ UCT) කාර්යය භාරය අහෝසි වීමේ අනතුර හොඳින් දැනෙන්නට විය.

විශේෂයෙන් නාවික වෙළෙඳාම තුළ සිදුව පැවති වෙනස්කම් කල්තියා හඳුනාගෙන කටයුතු නොකිරීම නිසා ශ්‍රී ලංකා වරාය අධිකාරියත් රටට මුදල් ගලා එන ප්‍රධාන මාර්ග යකුත් වැසීයාමේ බරපතළ අනතුර පැවතිණි. පසුගිය රජය විසින් ප්‍රමාද වී හෝ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගන්නා ලද ඩොලර් මිලියන 400ක මුදලක් යොදවා දකුණු කොළඹ වරාය ඉදිකිරීම සඳහා දියකඩනය ඉදිකිරීමේ වැඩ කටයුතු 2008 වසරේ ආරම්භ කරනු ලැබිණි.

එම කටයුත්තේ ඊළඟ පියවර ලෙස ශ්‍රී ලංකා රජය මැදිහත්ව ගොඩනගන ලද දකුණු කොළඹ වරායේ පර්යන්ත පහසුකම් කඩිනමින් ගොඩනගා නවීන උපකරණ ලබාගෙන අභිමි වී පැවති ජාත්‍යන්තර නාවික වෙළඳාම යළිත් ශ්‍රී ලංකාව වෙත දිනාගත යුතුව පැවතුණි. අවාසනාව ඊට හරස් විය. රාජපක්ෂ රජයට අවශ්‍ය වූයේ රටේ වුවමනාව නොව තමන්ගේ බල වුවමනාවයි. ඒ අනුව හම්බන්තොටට වරායක් ඉදිකිරීම රජයේ ප්‍රමුඛ කටයුත්ත බවට පත්කර ගනිමින් කොළඹ දකුණු වරාය ඉදිකිරීම මඟින් අත්පත්කරගත හැකිව තිබූ මහා ධනස්කන්ධයක් අත්හැර දමන ලදී. බලය වෙනුවෙන් හම්බන්තොට වරාය ඉදිකිරීමට ණය ලබාදෙන ලද චීන රජයට කප්පම් ලෙස දකුණු කොළඹ වරායේ දකුණු කොටස චීනයේ කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්ත සමාගමට (Colombo International Container Terminal - CICT) 2013 වර්ෂයේදී විකුණනු ලැබිණි. එය මහා පාවාදීමකි. අත උඩ පැවති මහා ධනස්ක්ධය බලය වෙනුවෙන් අත්හැර දැමීමකි. එම මහා පාවාදීම හේතුවෙන් ලෝකයේ නිෂ්පාදිත විශාල නෞකා සියල්ල දකුණු කොළඹ වරාය වෙත පැමිණ මේ වන විට මෙහෙයුම් කටයුතු වල නිරත වන අතර එමඟින් රජයට ලැබිය යුතු මහා ධනස්ක්ධයක් (CICT) සමාගම උපයනු ලබයි.

රාජපක්ෂ පාලනයේ පැවැත්ම වෙනුවෙන් ගනු ලැබූ මෙම වැරදි තීරණය හේතුවෙන් කොළඹ වරායේ බිඳවැටීම ඉක්මන් වූ අතර කෙසේ වෙතත් දකුණු කොළඹ වරායේ නැගෙනහිර කොටස ශ්‍රී ලංකා වරාය අධිකාරිය මැදිහත්ව ඉදිකිරීමට කටයුතු කිරීම නිසා යම් අස්වැසිල්ලක් ගෙන දෙන්නට විය.

2015 ජනවාරි 08 රාජපක්ෂ ආණ්ඩුව පරාජය වී රනිල් - මෛත්‍රී හවුල් ආණ්ඩුව බලයට පත්විය. ජනතාවගේ සාක්කු පිරවීමටත්, රාජපක්ෂවරුන් විසින් හිස්කර ඇති භාණ්ඩාගාරය පිරවීමටත්, රාජපක්ෂවරු ගෙන ඇති කෝටි දස ලක්ෂයක් වූ ණය කන්ද අවසන් කිරීමටත්, රට ගොඩනැගීමත් තම අරමුණ බව සඳහන් කරමින් රාජපක්ෂ පාලනය පෙරළා දමා බලයට පැමිණි රනිල් - මෛත්‍රී හයිබ්‍රිඩ් ආණ්ඩුවට මේ වන විට වසර දෙකකට ළංවී ඇත. රටේ ජනතාවත් වරාය සේවකයාත් වෙනසක් බලාපොරොත්තු විය. සිදුව ඇත්තේ පැවති නපුර වෙනුවට අලුත් නපුරක් පැමිණීම පමණි.

රාජපක්ෂවරු බලය වෙනුවෙන් දකුණු කොළඹ වරායේ කොටසක් චීනයට විකුණා හම්බන්තොට වරාය වෙනුවෙන් ඩොලර් කෝටි ගණනින් ණය ගනු ලැබිණි. රනිල් - මෛත්‍රී හවුල් ආණ්ඩුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අවසන් සුසුම් පොද වාතලයට මුසු කිරීමට සැරසී ඇත. විෂයභාර අමාත්‍යවරයා ලෙස අර්ජුන රණතුංග අමාත්‍යවරයා කොළඹ දකුණ වරායේ පිහිටි මේ වන විට ඉදිකිරීම් අවසන් කර ඇති ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හදවත බඳු නැගෙනහිර පර්යන්තයේ (ECT) 49% කොටස් ප්‍රමාණයක් පෞද්ගලික සමාගමක් වෙත පැවරීමට යෝජනා කරමින් කැබිනට් පත්‍රිකාවක් යොමුකර ඇත. 2015.06.22 යොමු කරන ලද එම කැබිනට් පත්‍රිකාව 2015.07.08 කැබිනට් මණ්ඩලය අනුමත කර ඇත. 2016.06.06/07/08 දිනවල පුවත් දැන්වීමට අනුව නැගෙනහිර පර්යන්තයේ (ECT) 85% කොටස් ප්‍රමාණයක් විකිණීමට අදාලව දැන්වීම් පළකරනු ලැබිණි. 2016.09.20 පැවති ටෙන්ඩර් කමිටුවේදී නැගෙනහිර පර්යන්තයේ (ECT) 85%ක කොටස් මිලදී ගැනීමට සමාගම් 07ක් කැමැත්ත පලකර ඇත. ඉන්දියානු සමාගම් හා චීන සමාගම් කිහිපයක් ඒ අතර සිටිති. නැගෙනහිර පර්යන්තයේ (ECT) 49%ක් විකුණා දැමීමට කැබිනට් මණ්ඩලය අනුමැතිය දෙන විට එම තීරණය වෙනස් කර නැගෙනහිර පර්යන්තයේ (ECT) 85%ක කොටස් ප්‍රමාණයක් විකුණා දැමීමට උපදෙස් ලබාදී ඇත්තේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා යටතේ ක්‍රියාත්මක ආර්ථික කළමණාකරණ කමිටුව විසිනි. එම කමිටුවේ නියෝජිතයන් ලෙස පාස්කරලිංගම්, චරිත රත්වත්තේ, මලික් සමරවික්‍රම, අර්ජුන මහේන්ද්‍රන් යන බලවතුන් විසින් කටයුතු කරනු ලබයි.

රාජපක්ෂ ආණ්ඩුව විසින් බලය වෙනුවෙන් කොළඹ වරාය ගොඩනැගීම ප්‍රමාද කරනු ලැබිණි. චීන සමාගම්වලට කප්පම් ලබාදෙමින් අත උඩ ලාභය අත්හරිනු ලැබිණි. රනිල් - මෛත්‍රී ආණ්ඩුව නැගෙනහිර පර්යන්තය ඉන්දියාවට ලබාදී කප්පම් ලබාදීමට සූදානම්ව ඇත. දකුණු කොළඹ වරායේ පිහිටි නැගෙනහිර පර්යන්තය (ECT) ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මුළුමනින්ම මෙහෙයුම් කටයුතු ආරම්භ කළහොත් පමණක් කොළඹ වරාය තවදුරටත් පවතිනු ඇත. එසේ නොවී නැගෙනහිර පර්යන්තය 49% ක් හෝ 85%ක් යන කුමන ප්‍රමාණයක් පුද්ගලික සමාගමක් වෙත පැවරුවද එය කොළඹ වරායේ අඳුරුතමද දිනය වනු ඇත.

වසර 68 ක් ජනතාව තමන්ව පාලනය කිරීමට බාරදී ඇත්තේ හොරු රැළකට බව තේරුම් ගැනීමට තවත් කාලය අවශ්‍ය නොවනු ඇත. බලය ඉල්ලන විට ජනතා සේවකයින් බලය ලබා ගත් පසු ජනතාවගේ දේපළ විකුණන් කන හොර දෙටුවන් වී ඇත. ජනතාවට අලුත් ගමනකට අවතීරණ වීම හැර වෙනත් විකල්පයක් නැති බව පැහැදිලිය.



# රට ණය කළේ ජනතාව නොවෙයි ජනතාව මත බදු පැටවීම වැරදියි

පාර්ලිමේන්තු මන්ත්‍රී
සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා

අයවැය කථාව ඉවර වෙන විට ජනතාවට ලැබුණු දේ මොකක්ද? රවි කරුණානායක මුදල් ඇමතිතුමා සිංහල භාෂාවෙන් සහන පොඩ්ඩක් පෙන්නලා, ඉංග්‍රීසි භාෂාවෙන් බදු ගොඩාක් පැටෙව්වා. ජනතාවට බදු ගොඩාක් යෝජනා කළා.

**බදු පිට බදු**

2016 අයවැයේ තිබෙන යෝජනා 114න් මේ සමාජයට, ජනතාවට දැනෙන්න, ඔය සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය ක්‍රියාත්මක වන්නට, අඩු තරමින් ඒක පටන් ගන්නට, නවෝත්පාදන ආර්ථිකයකට යන්න මොනවාද ක්‍රියාත්මක කරන්නට පුළුවන් වුණේ? එහෙම දෙයක් ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා තමයි අද ඔබතුමන්ලාට සිද්ධ වෙලා තිබෙන්නේ ඒ යෝජනාම ආයේ ආලේප කරලා, ආයේ හැඩ කරලා, වෙනත් වචන යොදලා වෙනත් ආකාරයකින් ගේන්නට. එතකොට ඔබතුමන්ලා මේ අය වැයේ යෝජනා කරලා තිබෙන්නේ මේ ආණ්ඩුව මේ මොහොතේ මුහුණ දෙන ඇත්ත ආර්ථික අර්බුදය ප්‍රකාශයට පත් කිරීම. මේ ආර්ථික අර්බුදයත් සමඟ තීරණය වෙලා තිබෙන ආණ්ඩුවේ ඉදිරි පැවැත්ම ආරක්ෂා කර ගන්නේ කොහොමද කියන අභියෝගයට උත්තර සෙවීමක් තමයි මේ අය වැයෙන් කරලා තිබෙන්නෙ.

VAT එක ගහලා, දින 10කින් තමයි අය වැය ඉදිරිපත් කළේ. ඔබතුමන්ලාට අවශ්‍ය නම් ඒක මේ අයවැයේ යෝජනාවක් කරන්න තිබුණා. හැබැයි, ඔබතුමන්ලා කල්පනා කළේ බදු පිට බදු - tax on tax - පනවන්න පුළුවන් ක්‍රමයක් ගැනයි. VAT එක ගහලා එන භාණ්ඩයට තමයි ඔබතුමන්ලා ඊළඟට බදු පනවන්නේ. නව බදු දිහා බැලුවාම එය ඉතා පැහැදිලියි. මධ්‍යම පන්තියටත්, තැළෙන පෑගෙන පන්තියටත්, අනිකුත් හැම පන්තියකටමත් බදු පටවන ක්‍රමයක් මේ ගෙනත් තිබෙන්නේ. " සැමට ප්‍රතිලාභ හිමිවන, වේගවත් වර්ධනයක් කරා..." කියායි මෙම අයවැය ලේඛනයේ පිට කවරයේ සඳහන් වන්නේ. ඒ වේගවත් වර්ධනය වෙන මොකක්වත් නොවෙයි. ගාටා ගෙන යන, ඉස්සරහට යන්න බැරි අර්බුදයක තිබෙන ආර්ථිකයට, ඔබතුමන්ලාගේ අර්බුදයට බදුවලින් උත්තරයක් සෙවීමයි මේ කර තිබෙන්නේ. සැමට බදු, වේගවත් බදු වැඩි කිරීමක්! මේක තමයි හරයේ තිබෙන්නේ.

මෙතෙක් සමුපකාර සමිතිවලටයි, ලක් සතොසටයි, ජාතිය ගොඩනැගීමේ බදු නිදහසක්; බදු සහනයක් තිබුණා. අන්න, ඒ බදු සහනය දැන් තමුන්නාන්සේලා ඉවත් කරලා තිබෙනවා. දැන් සමූපකාර සමිති භාණ්ඩවලට, ලක් සතොසේ විකිණීමට තිබෙන භාණ්ඩවලට තමුන්නාන්සේලා ජාතිය ගොඩනැගීමේ බද්ද 'තාර්කීකරණය' කර තිබෙනවා. අහිංසක මිනිස්සුන්ට බදු වැඩි වෙනවා; මිල වැඩි වෙනවා; විකුණන භාණ්ඩවල මිල වැඩි වෙනවා. අයවැය කථාවේ 1 කොටසේ 63 වැනි පිටුවේ 366 ඡේදයෙන් තමුන්නාන්සේලා කියනවා, විශ්‍රාම අරමුදල් හැර අනෙකුත් අරමුදල් සියල්ල වහාම භාණ්ඩාගාරයට ලබා ගන්න ඕනෑයි කියලා. මොකක්ද ඒකේ තේරුම? විශ්‍රාම අරමුදල හැර රජයේ දෙපාර්තමේන්තු, ආයතන, සංස්ථා යටතේ තිබෙන අනෙකුත් සියලුම අරමුදල් වහා ක්‍රියාත්මක වන පරිදි, භාණ්ඩාගාරයට ලබා ගන්න ඕනෑයි කියනවා. අද මධ්‍යම රාත්‍රී 12.00 ඉඳලා අදාළ චේච්ද දන්නේ නැහැ. ඊළඟට SMS එක ඒවිද දන්නේ නැහැ. " වහා ක්‍රියාත්මක වන පරිදි, සියලුම සෙස් අරමුදල් භාණ්ඩාගාරයට ලබා ගන්නවා"යි කියලා.

**පික්පොකට් ආර්ථිකය**

ඇත්ත කාරණාව මොකක්ද? මේ රට ණය කළේ ජනතාව නොවෙයි. මේ වැරදි දේශපාලන තීරණ ගත්තේ ජනතාව නොවෙයි. මේ නාස්තිකාර වියදම්වලට ව්‍යාපෘති හදා ගත්තේ ජනතාව නොවෙයි. හරියට කළමනාකරණය කරන්නේ නැතිව ඒවා පාඩු කළේ ජනතාව නොවෙයි. ඒක නිසා සැමට ප්‍රතිලාභ මුවාවෙන් තමුන්නාන්සේලාගේ සැමට බදු පනවන ප්‍රතිපත්තියට අපි එකඟ නැහැ; මේ රටේ ජනතාවත් එකඟ නැහැ. ඒක වැරදියි.

එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් බලයට පත් වුණොත් ආර්ථිකය ශක්තිමත් වනවා; බැංකු ශක්තිමත් වනවා; ව්‍යාපාර ශක්තිමත් කරනවා කියන මිථ්‍යාවක් සමාජය තුළ තිබුණා. හැබැයි, දැන් ඒවා තමුන්නාන්සේලාගේම ප්‍රතිපත්තිවලින් සුන්නද්දූලි කරලා අවසන්. රුපියල් 10,000ක ගනුදෙනුවක් කරන කොට තමුන්නාන්සේලා රුපියල් පහක් කපා ගන්නවා; පික්පොකට් ගහනවා. සේවක අර්ථ සාධක අරමුදල ගැන කියනවා. නමුත්, සේවක අර්ථ සාධක අරමුදල ගැන අයවැය කථාවේදි කිව්වේ නැහැ; පැනලා ගියා. මෙපමණ කාලයක් සේවක අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභීන්ට අයිතියක් තිබුණා. තමන්ට තිබෙන සේවක අර්ථ සාධක අරමුදල ඇපයට තියලා නිවාස ණයක් ගන්න. ඒක ඉවත් කරන්න කියලා මහජන අදහස් දැක්වූ ජනතාව කිව්වාද? "අපට මේ සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභයක් හැටියට තිබෙන නිවාස ණය එපා" කියලා.

**විශ්‍රාම වැටුප් කාලබෝම්බය**

මන්ත්‍රීවරු වන අපි, මහජන නියෝජිතයින් හැටියට වැටුපක් නොවෙයි දීමනාවකුයි ලබන්නේ. හැබැයි, වැටුපක් හැටියට හිතා ගෙන, මන්ත්‍රීවරුන්ට තිබෙන විශ්‍රාම වැටුප් ක්‍රමය එහෙමම තියාගෙන, විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කරලා, සාමාන්‍ය රජයේ සේවකයා වෙනුවෙන් දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් අලුතින් හදන්න යෝජනා ගෙනෙනවා. එතකොට ඒවා කොහොමද, 'සැමට ප්‍රතිලාභ' වෙන්නේ? කොහොමද ඒක සාධාරණීකරණය වෙන්නේ? කොහොමද ඒක යුක්ති සහගත වෙන්නේ? රටට සේවය කරපු අහිංසක විශ්‍රාමික ජනතාවගේ විශ්‍රාම වැටුප කාලබෝම්බයක් කියනවා. එහෙමනම්, මේ මන්ත්‍රීවරු 225 දෙනා අවුරුදු පහක් ඉඳලා, ඉන් පසුව මැරෙන කල් ලැබෙන විශ්‍රාම වැටුප මොකක්ද? ඒක කොහොමද සාධාරණීකරණය කරන්නේ? ඒක පරමාණු බෝම්බයක්! ඒ කාරණයත් මෙහි ලියන්නට ඕනෑ. රජයේ සේවකයින් හැටියට අමාත්‍යාංශ ලේකම්තුමන්ලා මෙවැනි වාක්‍ය අයවැය යෝජනාවකට ඇතුළු කිරීම පිළිබඳව අප කනගාටු වෙනවා.

රජයේ රෝහල්වල ගෙවන වාට්ටු ඇති කරනවාය කියනවා. ගෙවන වාට්ටු කොහේද ඇති කරන්නේ? දැන් ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ ගෙවන වාට්ටු තිබෙනවා. අපි ඒ රෝහලේ නිලධාරින් COPE එකට ගෙන්වා අහනවා. රජයේ රෝහල්වලින් සාමාන්‍ය ජනතාවට ලැබෙන ප්‍රතිලාභ මොනවාද කියලා. දැන් මේ ගෙවන වාට්ටු ඇති කරනවාය කියන්නේ කුමන රජයේ රෝහල්වලද? අනුරාධපුරය, පේරාදෙණිය, කුරුණෑගල, මාතර, ගාල්ල කරාපිටිය රෝහල්වල දැන් ලෙඩ්ඩු පිරිලා ඉන්නවා. OPD එක ඉඩ නැහැ. හැම තැනම ඉඩ නැහැ. මෙහෙම තිබියදී යෝජනා කරනවා, මේ රජයේ රෝහල්වලම ගෙවන වාට්ටු ඇති කරන්න. එතකොට සැමට ප්‍රතිලාභ ලැබෙනවාද? ඒකටද, ඔය රාජ්‍ය සහ පෞද්ගලික අංශ ඒකාබද්ධ කිරීම කරන්නේ?

> ගොවියෙකුට අවමය වශයෙන් අක්කර 1000ක භූමි භාගයක් දෙනවාලු ඒ කියන්නේ, ගොවියෙකුට වගා කරන්න ඉඩම් අක්කර 1000ට වැඩියෙන් දෙනවා කියන එකනේ. මට මුදල් ඇමතිතුමාගෙන් දැන ගන්න ඕනෑ, මේ ගොවියා කවුද කියලා. ඒ අපේ රටේ ගොවියෙක් නම්, ඒ ගොවියාට ඉඩම් අක්කර 1000ක් දෙනවා නම් ඒ ගැන අපි සන්තෝෂයි. හැබැයි, මේ ගොවියා විදේශීය ගොවි සමාගමක් නම් එදාට වෙන්නේ අපේ දේශීය ගොවියා ඒ විදේශ 'ගොවියාගේ' කම්කරුවා බවට පත්වෙන එකයි.

එතකොට, ඔබතුමන්ලාගේ මේ " සැමට ප්‍රතිලාභ" අයවැයේ ප්‍රතිපත්තිය තමයි, පෞද්ගලික අංශය ඒකාබද්ධ කරලා රාජ්‍ය නොවන උපාධි පිරිනමන ආයතන දිරිමත් කිරීම, ඒකට තමයි විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකුට රුපියල් ලක්ෂ අටක ණය දෙන්නත් යෝජනා කරන්නේ. මේ අනුව දැන් නිදහස් අධ්‍යාපනය කියන එක "මුදලට අධ්‍යාපනය" දක්වා යන ගමන මේ අය වැයෙන් තව තීව්‍ර කරලා තිබෙනවා; වර්ධනය කරලා තිබෙනවා.

**කොළය වසා විකිණීම**

2017 දී විකුණන්න සූදානම් කරන ආයතන ප්‍රමාණය මෙම අයවැය කථාවෙන් ඉතා පැහැදිලියි. මේ කොළය වහලා රිංගලා යන්නේ කොහාටද? මේ රිංගලා යන්නේ, ලැයිස්තුගත කරන්න යෝජනා කරලා තිබෙන, වෙන්දේසියට ඉදිරිපත් කරලා තිබෙන රාජ්‍ය ව්‍යාපාර ටික විකුණන්නයි. මේ ඉතිරි ලැයිස්තුව තුළ Chilaw Plantations Limited, Elkaduwa Plantations Limited, Kurunegala Plantations limited, Sri Lankan Airlines ආදී ආයතන තිබෙන්න පුළුවන්. මේ තුළ දැනටත් ඒකාබද්ධ කරපු මිහින් ලංකා ආයතන තිබෙනවා, ලාබ ලබමින් තිබුණු ඒ ලැයිස්තුව තමයි මේ ඉදිරිපත් කරන්නේ. තව අපි දන්නේ නැති, ඔබතුමන්ලාගේ හිතේ තිබෙන ආයතන මේ ලැයිස්තුවට ඇතුළු කරගන්න පුළුවන්. ඒක තමයි මේ යෝජනා කරලා තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ හිතේ තියෙන ඒ ලැයිස්තුව තමයි අනෙකුත් ලැයිස්තුගත කිරීම කියල කියන්නේ.

මේ අයවැය යෝජනාවලින් තමුන්නාන්සේලා තවත් අපූරු අදහසක් කියනවා. ගොවියෙකුට අවමය වශයෙන් අක්කර 1000ක භූමි භාගයක් දෙනවාලු ඒ කියන්නේ, ගොවියෙකුට වගා කරන්න ඉඩම් අක්කර 1000ට වැඩියෙන් දෙනවා කියන එකනේ. මට මුදල් ඇමතිතුමාගෙන් දැන ගන්න ඕනෑ, මේ ගොවියා කවුද කියලා. ඒ අපේ රටේ ගොවියෙක් නම්, ඒ ගොවියාට ඉඩම් අක්කර 1000ක් දෙනවා නම් ඒ ගැන අපි සන්තෝෂයි. හැබැයි, මේ ගොවියා විදේශීය ගොවි සමාගමක් නම් එදාට වෙන්නේ අපේ දේශීය ගොවියා ඒ විදේශ 'ගොවියාගේ' කම්කරුවා බවට පත්වෙන එකයි.

**එට්කා දොර හැරීම**

මේ අය වැයේ තවත් එවැනි කාරණා, තවත් අපූරු යෝජනා ගණනාවක් තිබෙනවා. ඒ ප්‍රතිපත්තිය තමයි, විදේශීය ආයෝජකයාටත් අවුරුදු 5කට බහුවිධ වීසා -multiple visa- දෙන්නේ. එහෙම යෝජනා කරන්නේ ආයෝජකයන් මෙරටට කැඳවා ගන්නයි. ආයෝජකයන්ට මේ රටට එන-යන එක කරදරයි. ඒ සඳහා සැරින් සැරේට වීසා ගන්න වෙනවා. ඒ නිසා, අවුරුදු 5කට එකපාර වීසා දෙනවා. හරි. ඒක ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය කියමුකෝ. හැබැයි, මෙහි තවදුරටත් සඳහන් වී තිබෙනවා මෙහෙම. "ඒ වාගේම ඒ ආයෝජකයා සමග එන විශේෂඥ ශ්‍රමිකයාටද අවුරුදු 5කට වීසා ලබා දෙනු ලැබේ."


එතකොට, මේ යෝජනාව යට අපි මේ දිනවල සාකච්ඡාවට බඳුන් කරමින් යන තවත් කථාවක් තිබෙනවා නේ. ඒක තමයි ETCA ගිවිසුම. ඒ ගිවිසුම ඇතුළේ සඳහන් වෙනවා, ඉන්දියාවෙන් එන්න බලාපොරොත්තු වන විදේශීය විශේෂඥ ශ්‍රමිකයා ගැන. අපට මේ ආණ්ඩුවෙන් දැන ගන්නට ඕනෑ, මේ ආයෝජකයන් එක්ක එන විදේශීය විශේෂඥ ශ්‍රමිකයා කියන්නේ අන්න අර ETCA ගිවිසුමක් එක්කම ඇදන්න බලාපොරොත්තු වෙන තොරතුරු තාක්ෂණ ශ්‍රමිකයාද කියලා. GATT සම්මුතිය අනුවත් අපේ වෘත්තිකයෙක් ඉන්දියාවට ගියොත් අපේ වෘත්තිකයෙකුට දෙන්නේ උපරිම අවුරුද්දයි. ඊට පස්සේ ඔවුන් කල්පනා කරනවා, මෙයාව තියා ගන්නවාද, මෙයා හොඳද නරකද කියලා. හැබැයි, මේ ක්‍රමය අනුව ලංකාවට ඇවිල්ලා "විදේශීය විශේෂඥ ශ්‍රමිකයා" කියන නාමාවලිය යටතේ අවුරුදු පහක් තිස්සේ අපේ තොරතුරු තාක්ෂණ සේවයත්, අනෙකුත් සියලු දේත් ඩැහැ ගැනීමේ ඉඩකඩ හදා දෙනවාද කියන එක පිළිබඳව අපට සාධාරණ සැකයක් තිබෙනවා. ජනතාවටත් ඒ සැකය තිබෙනවා.

පෞද්ගලික අංශයට අර්ථසාධක අරමුදල තිබෙනවා. හැබැයි විදේශගත ශ්‍රමිකයාට එහෙම එකක් නැහැ. ඒක නිසා ඔහු වරින් වර සල්ලි එවලා අවසානයේ ලංකාවට එන කොට බංකොලොත් වෙලායි එන්නේ. ඒක නිසා එවැනි අයට මේ වාගේ විශ්‍රාම වැටුප් ක්‍රමයක් හදන එක හොඳයි. හැබැයි, තමුන්නාන්සේලාට ඒ යෝජනාව තවත් අලංකාර කරන්න තිබුණා. එයට විදේශගත ශ්‍රමිකයන්ගෙන් ලබන ප්‍රමාණය කොපමණද, ඒ වාගේම රජයේ දායකත්වය කොපමණද කියලා. රජයේ කොයි පංගුවක් මේකට දායක කරනවාද කියලාත් මේකේ තිබෙන්න ඕන.

මහ බැංකුව පිළිගෙන තිබෙනවා, වට්ටම් ක්‍රියාවලිය ඇතුළේ මහ බැංකුව පැත්තෙන් බැඳුම්කරවලින් වෙච්ච පාඩුව කෝටි 7,000ක් කියලා. එතකොට මේ රටේ ණය බරට රටේ ජනතාව දායක වෙලා නැහැ. ඒකට තමුන්නාන්සේලා එකතු කර ගත් මේ ගජ මිතුරන් ටික දායක කර ගෙන තිබෙනවා. ඒ ණය බරට අපේ රටේ වැඩ කරන ගොවි ජනතාව, ධීවරයා, කම්කරුවා, ශිෂ්‍යයා, තරුණයා, කාන්තාව හා රජයේ සේවකයා දායක කරන්න එපා. ඒ නිසා අපි කියනවා, "සැමට ප්‍රතිලාභ" කියලා ඔබතුමන්ලා මේ බෙදන්නේ සැමට බදු. වේගවත් වර්ධනය කියලා වැඩි කරන්න යන්නේ බදු. බදු ආර්ථිකයකින් රටේ ජනතාව පීඩාවට පත් කරන මේ අයවැයට අපේ විරෝධය පළ කරනවා.

කවුළුව හැර තබමි

# ලෝකය දිනීමට කියවමු!




ජනතා විමුක්ති පෙරමුණේ නියමුවා ප්‍රකාශන මගින් පසුගිය දා 'සෝවියට් දේශයේ බිඳවැටීම සහ ධනවාදයේ වත්මන් අර්බුදය' යන මැයින් කෘතියක් එළිදක්වන ලදී. යුගයේ දේශපාලනයට එයින් ඉගෙන ගත හැකි පාඩම් රැසකි.


තමන්ගේම වරප්‍රසාද අත්කර ගැනීමේ සීමාවෙන් ඔබ්බට නොගිය කොමියුනිස්ට් ව්‍යාපාර හේතුවෙන් යුරෝපා විප්ලවයේ පමාවීම සහ පරාජයන් සමග හටගත් සෝවියට් කම්කරු පන්තියේ අපේක්ෂා භංගත්වය ගසා කෑමට තැත්කළ නිලධාරී තන්ත්‍රයේ පීඩනය පිළිඹිබු කරමින් 1924 වන විට ස්ටාලින් හා බුහාරින් 'තනිරටේ සමාජවාදය' යන න්‍යාය ඉදිරියට ගත්තෝය.

ධනවාදයේ අධිරාජ්‍යවාදී අවදිය වන මේ අවදියේ නිෂ්පාදන බලවේග එකතැන පල්වීමත්, වටයෙන් වටයට මතුවන ආර්ථික අර්බුදයත් දිනෙන් දින ජනතාව වෙලාගන්නා අපරිමිත දරිද්‍රතාව සහ දුක් පීඩාත් සීඝ්‍රයෙන් වැඩෙන් රැකියා වියුක්තියත් හා රාජ්‍ය මුදල් පද්ධතිවල පල්ල ගැලවී අර්බුදය තීව්‍රවීමත් එක්පැත්තකින් මෙම කෘතියෙන් සාකච්ඡා කෙරේ. අනෙක් පසින් ජුන්ටා පාලන තන්ත්‍රවල මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී පාලන තන්ත්‍රවලද කුණාටු වී යෑම් සහ අනිවාර්ය බංකොලොත්භාවය ගැන මින් සාකච්ඡා කරනු ලබයි. තවත් පැත්තකින් විවිධ ධනපති රටවල ආඥාදායකත්වයේ ස්වරූපය වෙනස්කරමින්ද පැලැස්තර දමමින්ද අර්බුදය විසඳා ගැනීමට දැරූ සියලු ප්‍රයත්න ව්‍යර්ථ වී ගොස් ඇති අතර රටවල් අතරත් කා කොටා ගැනීම් උග්‍ර වී ඇත.

අනෙක් පැත්තෙන් සෝවියට කොමියුනිස්ට් පක්ෂය තුළ නිලධාරීවාදය මෝදු වී වර්ධනය වීමත් නිලධාරී තන්ත්‍රය අතේ රාජ්‍ය තන්ත්‍රය අත්අඩංගුවට පත්වීමත් එමෙන්ම 03 වන ජාත්‍යන්තරයේ පිරිහීයාමට මෙම තත්වය බලපෑ අන්දමත් සාකච්ඡා කරන ඉහත කෘතිය විප්ලවය තනි රටක හිර කර තබාගැනීමට ස්ටැලින්වාදී පාලක කල්ලිය දැරූ වියරු ප්‍රයත්නයත් නිසා සෝවියට් දේශයේ සමාජවාදී පාලනය බිඳ වැටීමට හේතු පාදකවූ අන්දමද මෙම කෘතියෙන් සාකච්ඡා කෙරේ.

ලෙනින් සිය අවසාන කාලයේදී තියුණු ඇසකින් විනිවිද දුටු සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ නිලධාරීවාදී පිරිහීම මගින් එයට අත්වන ඉරණම ප්‍රත්‍යක්ෂ වූ පසු සමාජවාදය නිෂ්ඵල ප්‍රයත්නයක් බවත් ඓතිහාසික අත්වැරැද්දක් බවත් යථාර්ථයක් නොවන බවත් තහවුරු කිරීමට ලොව පුරා ප්‍රතිවාදීහු බෙරිහන් දෙමින් උමතු ප්‍රයත්නයක යෙදුණහ. දැනුදු යෙදිති. මේ සියලු ගැටලුවලට පිළිතුරු සපයමින් සම්පාදිත ඉහත කෘතිය පරිශීලනය කිරීම සමාජවාදී විප්ලවය ගැන බලාපොරොත්තු නොසෙල්වා ගත්, ඒවෙනුවෙන් කැපවෙන සියලු දෙනාටම ප්‍රයෝජනවත් වන බව අවධාරණය කළ යුතුය.

# ලෝකය එක හිසකින් පහත්වී



"ලෝකය එක හිසකින් පහත් විය. එය මේ අපේ යුගයේ ශ්‍රේෂ්ඨතම මිනිසාගේ හිසයි" මෙය මාක්ස්ගේ අවමඟුල් උළෙලේදී එංගල්ස් කළ ප්‍රකාශයයි.

"කොහොම නැණ පහනක් ද නිවුණේ කෙලෙස හදකද ගැස්ම සිඳුනේ"

මෙය ලන්ඩනයේ හයිගේට් සුසාන භූමියේ මාක්ස්ගේ සොහොන මත කොට ඇති ද බ්ලවොව් නැමැති කවියාගේ කවි පද දෙකකි.

පසුගිය නොවැම්බර් 25 රාත්‍රියේ ඉහත පාඨ දෙකම කැටි වූ ශ්‍රේෂ්ඨ මිනිසෙකුගේ හිස ලොවින් පහත් වී ගියේය. ඔහු නම් කිසිවෙකු නොව අපේ යුගයේ ජීවත් වු විප්ලවීය සංකේතය හා විශිෂ්ඨතම විප්ලවවාදියාවූ පිදෙල් කැස්ත්‍රෝය. ඔහු ලොව මහා බලවතාගේ ගෙමිදුලේ සිටත් කිසිවිටෙකත් ඔහුට හිස නොනැමීය. තමා තෝරගත් මඟෙහි නොසෙල්වී ගමන් කළේය. ඔහුගේ නික්මයාම ශතවර්ෂ ගණනාවකට පිරිමාසාලිය නොහැකි වනු ඇත.

වාර 633 ක් හතුරා ඔහු මරා දැමීමට කුමන්ත්‍රණය කළේය. එහෙත් ඔහු තම විප්ලවීය ධජය කිසිවිටෙකත් අඩකුඹු කළේ නැත.

හදවත තුළ එකම අදහස් ඇති පුද්ගලයින් රැසක් කිසිදු දෙයකින් වෙන්කළ නොහැක. එක හා සමාන අදහසක්, එක හා සමාන පරමාර්ථයක්, එක හා සමාන පිරිසිදු හදවතක්, එක හා සමාන ගෞරවයක්, ඔවුනගේ ජීවයන් එකට බඳවා තිබෙන ජීව රුධිරය වනු ඇත. මේ පුද්ගලයින් වෙන් කොට තැබීමට සිරගෙවල්වල බිත්ති හෝ සොහොන් ගැබ්වලට පුළුවන්කමක් නැත.

"ඔව් අපි කියුබාවේ නිදහස තකා සටන් කළෙමු. අපි දැන් ඉන් පසු තැවෙමුද? නැත. නැත."

මේ ඒ ශ්‍රේෂ්ඨ විප්ලවවාදියා තමන්ට එරෙහිව පැවති සුප්‍රසිද්ධ නඩු විභාගයේදී අධිකරණය ඉදිරියේ සාක්ෂි දෙමින් කී අභීත ප්‍රකාශයේ උපුටා ගත් තැන් දෙකකි.


විප්ලවවාදීන් කිසිදා නොමියෙති, මන්ද ඔවුන්ගේ මුල් ජනතාව අතර කිඳාබැස තිබෙන හෙයිනි. ෆිදෙල් යනු පීඩිත ජනතාවගේ හෘදය සාක්ෂියෙන් කිසිදා උදුරා දැමිය නොහැකි මහා ගසකි. එහි සෙවන ලැබූ ජනයා එය දිවිහිමියෙන් සුරකිනු ඇත.

# මැති ඇමති කුසගින්න

මෙවර අයවැය විවාදයේදී අගමැති රනිල් වික්‍රමසිංහ සහ ඇමති ජෝන් අමරතුංගට පුදුම කැක්කුමක් ඇතිවී තිබෙනු දක්නට ලැබිණි. ඒ මැති ඇමතිවරු ආර්ථික අපහසුකම් නිසා විඳින දුක ගැනය.

හොඳ නිවාස, හොඳ වාහන ආදිය නොමැති නිසා මන්ත්‍රීවරු මහත් අසීරුතාවලට මුහුණ දී සිටින බවත් ඒ නිසා ඔවුන්ට එම පහසුකම් වහා ලබාදීමට තමා යෝජනා කරන බවත් ජෝන් ඇමතිවරයා නාහෙන් හඬමින් කියා සිටියේය. රනිල්ද එය අනුමත කරමින් කථා කළේය. දැන් ජනතා මුදල් කෝටි ගණනක් වැය කරමින් මැති ඇමතියන්ට සැප වාහන ගෙන්වීමට ආණ්ඩුව පිඹුරුපත් සකසයි. ජනාධිපතිවරයා මේ ගැන කියන්නේ කුමක්දැයි අප දන්නේ නැත.

ආණ්ඩුවට අනුව දැන් ජනතා ප්‍රශ්න විසඳා දී ඇත. ප්‍රශ්න තිබෙන්නේ මැති ඇමතියන්ටය. ජනතාව දැන් 'ෆුල් සැප' විඳිති. බදු සහ දඩ ගසා ජනතාවට 'සැප පිට සැප' දෙන ආණ්ඩුව මැති



ඇමතියන් විඳින 'දුක' කෙසේ ඉවසන්නද? ඉදින් ඔවුන්ටත් සැප දිය යුතුය. 'ඔහොම යං ඔහොම යං'

# පොලිටිකල් පංතිය

පොලිටික්ක ටික දවසක් නැතුව ඉඳල හොර බළලෙක් වගේ පංතියට ගොඩවුණා.

"ගුඩ් මෝනිං සර්" වසන්තිය 'එක' දැම්ම.

"සර් එනවා දැක්කෙත් නෑ" අනුරුද්දිය 'දෙක' දාගත්ත.

"ආයුබෝවන් ළමයිනේ, මම ආවා... ඔය ළමයි තමයි දැක්කෙ නැත්තෙ," පොලිටික්ක ආපු නැති දවස්වලත් පංතියෙ හිටිය වගේ ටෝක් එක.

"ඒක තමයි, සර් ඉඳලා... අපි තමයි නැතුව ඉඳලා තියෙන්නෙ..." මංජුව හිමීට කියපු දේ ඇහුණ අයට හිනාවක් පැන්න.

"කියන්නකො ළමයිනේ අපිටත් හිනාවෙන්න." පොලිටික්ක හැපි මූඩ් කියල හැමෝම දැනගත්ත.

"නෑ සර් මේ නිකං," මංජුව කොළේ වැහුව.

"අපි සින්දුවක් කියමුද?" පොලිටික්ක යෝජනා කළේ කවුරුත් නොහිතපු වෙලාවක.

"මරුනෙ. කියමු සර්," පොලිටික්ක සිලබස් කවර් කරල නැති වුණත් සිංදු කියන්න කැමැත්තෙන් හැමෝම කිවුව.

"ඉතින් මොකෙන්ද සර් පටන් ගන්නෙ... නැගලා යන එකකින්ද ස්ලෝ නම්බර් එකකින්ද?" ජමිය සංගීත ඔස්තාද් වගේ.

"නැගල යන එකක්නම් බයිසිකලේ තියෙනව," කනිය කියද්දි " ස්ලෝ එකක්නම් 'බරබාගෙ' තියෙනව" කියල මංජුවත් අදහසක් දැම්ම.

"නෑ ළමයිනේ ඒවා මහ පරණ ඒවනෙ. තව හොඳ සින්දු තියෙනවා." පොලිටික්ක සීරියස් අරන් කිවුව.

"පංතියෙ ලව් සෝන් කියන එක හරි නෑ නේද?" අනුරුද්දිය කිවුවෙ නැන්දම්ම වගේ.

"කවුරුත් එහෙම කියන්න ඕනෙ කිවුවෙ නෑනෙ" වසන්තිය ලේල්ලිට ඇන්ද.

"නෑ නෑ ළමයිනේ හොඳ සින්දු තියෙන්නෙ," පොලිටික්ක තවත් තෙපරබානව.

"හරි සර්ම කියන්නකො," පොලිටික්ක හිතේ තියාගෙන වටේ යනව කියල හැමෝටම තේරුණා.

"ඇයි ළමයිනේ අර සින්දුවක් තියෙන්නෙ... පො..." පොලිටික්ක ආයෙත් ගිල්ල.

"අයියෝ කියන්නකො සර්," වසන්තිය හුරතලේ.

"එහෙනම් ඔය ළමයිනුත් කියන්නකො මම පටන් ගන්නම්." ඉඳල ඉඳල පොලිටික්ක කට ඇරිය. "පොට්ටු... පොට්ටු... මල් පොහොට්ටු... පෙත්ත... පෙත්ත... විකසිත වී"

"අයියෝ සර් එකත් අලුත් නෑනෙ," මංජුව කන්ඩෙම් කළා.

"පරණ වෙන්නෙ කොහොමද? තවම පටන් ගත්ත විතරයිනෙ." පොලිටික්ක සිංදුව නතර කරල ආත්මගරුත්වය වෙනුවෙන් සටන් වැදුණා.

"ඇයි සර් ඔය සිංදුව පල්ලිවල මඟුල්වලදි කියනවා. වෙන වෙඩිංවලත් කොච්චර ගහල තියෙනවද?" මංජුව වෙඩිං මේසෙක කෑම මතක් කරගෙන කෙළ ගිලින ගමන් කිවුව.

"නෑනෙ, මංජුල පටලගෙන මේක සර්ට අලුත්. ඒත් අපිට පරණයි." සමන දෙකොණ පැටලෙව්ව.

"එහෙම වෙන්නෙ කොහොමද සමන්. සිංදුවක් ඇහෙන්නෙ හැමෝටම එකටනෙ." හැමෝගෙම ඇස් සමනට හැරුණා.

"එහෙම වෙන්නෙ මේකනෙ. සර් කියන්න හදන මේ සින්දුව අපි සිංදුවක් විදිහට අහල තියෙනව. එත් දැන් සර් එක කියන්නෙ හදන්නෙ වෙන ලකුණක් ඔළුවෙ තියාගෙන. ඒකත් අපිට අලුත් නෑ. අපි ඒ සිංදුවත් අහල තියෙනව. බලයෙන් විසිවුණු අය, මිනිස්සු පයින් ගහල කුණු බක්කිවලට දාපු අය පොහොට්ටු හරි බකට්ටු හරි ලකුණ කරගෙන එන්න හදනව. එත් ගහපු ගැහිලි මිනිස්සුන්ට මතක නිසා එන්න බැහැ. එන්න දෙන්න හොඳත් නෑ." සමන පොලිටික්කගෙ පොට්ටුව චොර කරල දාන අතරෙ බෙල් එක වැදුණා.

## පෙනුමේ හා හරයේ...

11 පිටුවෙන්

අධිරාජ්‍යවාදීන් අතර තරගය වේ. එම තරගය පවතින තාක්කල් ඕනෑම ආසන්න සිදුවීමක් මත යුද්ධ ඇතිවිය හැකිය. ලෝක යුද්ධ අවසන් කිරීමට නම් අධිරාජ්‍යවාදය පැරදවිය යුතුය.

හේතුව හා ඵලය වටහා ගැනීම අපේ ජීවිතයටද වැදගත්ය. පවුල් තුළ ගැටුම්වලදී, සමාජය තුළ අපරාධවලදී, ඊට බලපෑ සැබෑ හේතු තේරුම් නොගතහොත් මිනිසුන් රැවටීමට ලක්වනු ඇත. පවුල් තුළ ගැටුම් යනු පුද්ගල වැරදි පමණක් හේතුකොටගෙන සිදුවන දේ ලෙස අපට පෙනුණද සැබෑ හේතුව ඇත්තේ ධනවාදයේ ඇති ප්‍රතිවිරෝධය තුළය. ධනවාදය තුළ වන ප්‍රතිවිරෝධය හා පීඩාව පවුල තුළද පවතින අතර එය වර්ධනය වී පුපුරා යාම ගැටුමක් ලෙස ප්‍රකාශයට පත්වේ. මිනිසාගේ දුප්පත්කමට හේතුව, ලෙඩදුක්වලට හේතුව සෙවීමේදීද මිනිසුන් විශාල ලෙස වැරදි නිගමනවලට පැමිණේ. දුප්පත්කමට, ප්‍රශ්නවලට, ලෙඩදුක්වලට හේතුව පෙරකළ පාපකර්ම ලෙස, ග්‍රහපලපෑම් ලෙස, අනුන් කළ කොඩිවින ලෙස, නැතිනම් පුද්ගලයින්ගේ දුර්වලතා ලෙස දැක ඊට පිළියම් සොයා යන අය ඒ තුළම විනාශයට පත්වේ. වත්මන් සමාජය තුළ අපේ දුප්පත්කමට හේතුව ධනවාදී සූරාකෑම හා පෞද්ගලිකව දේපළ ගොඩගැසීම වේ. ලෙඩදුක් කරදර එන්නේද ඒ හරහාය. එය වටහා නොගත්විට සිදුවන්නේ වංචාකාරයන්ට රැවටීම පමණි.



මේ නිසා ඕනෑම ඵලයකට බලපෑ සැබෑ හේතුව සොයා ගැනීම ලෝකය නිවැරදිව තේරුම් ගැනීමට අත්‍යාවශ්‍ය වේ. ලෝකයේ නිවැරදිව අවබෝධකර ගැනීමට ඉවහල්වන අනෙක් කරුණුද සමඟ මීළඟ කලාපයෙන් හමුවෙමු.

## නව යුගයක් සඳහා...

07 පිටුවෙන්

70යි. එකතුව 70ව 93 දක්වා වැඩිවෙන්නේ ඇයි? මා දැක්ක මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය සභාපතිවරයා ප්‍රකාශයක් කළා සාමාන්‍යයෙන් අපේ රටේ ඇමතිවරයෙක් නඩත්තු කරන්න මාසෙකට මිලියන 06ක් (ලක්ෂ 60ක්) වියදම් වෙනවා. අපි එහෙම නඩත්තු කළ යුතුද? අපි අහනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එක්සත් ජාතික පක්ෂය ඒකාබද්ධව ආණ්ඩුවක් හදනකොට ඇමතිවරු සංඛ්‍යාව වැඩිවෙන්න මොකද රට ලොකු වෙනවාද? විෂයන් වැඩි වෙනවාද? 19 වන සංශෝධනයේ අමාත්‍යවරු තිහ(30) හතළිස් අට(48) වුනේ ඇයි කියලා මේ රටේ ජනතාව දැනගත යුතුයි. ඒනිසා මේ නාස්තිය නැති කරන්න සාමාන්‍ය සරල ක්‍රමවේදයන් හරහා පුළුවන්කමක් ලැබේවි කියල අපි විශ්වාස කරන්නේ නැහැ.



### චින්තනයක් සහිත සමාජයක්

ඒ නිසා අද යහපත් රාජ්‍යකරණය පිළිබඳව ප්‍රබල ජනතා ව්‍යාපාරයක අවශ්‍යතාවයක් තියෙනවා කියල අපි විශ්වාස කරනවා, රට ඉදිරියට ගෙනයන්න නම්. ඒවිතරක් නොවෙයි. මේ සමාජය ගොඩනැගිය හැකිද? මිත්‍යාව පිටුපස හඹායන මොකක්ද මේ සමාජය. අපේ රටේ රූපවාහිනී නාලිකාව කියන්නේ තාක්ෂණයේ ඉහළ අධියරක්. ඒක තාක්ෂණයේ ඉතා ප්‍රබල අදියරයක්. හැබැයි ඒ ප්‍රබල අදියර උපයෝගී කරගෙන තිබෙන්නේ මොකක් සඳහාද? සමාජයෙත්, මිනිසාගේත් චින්තනය වර්ධනය කිරීම වෙනුවෙන්ද? එහෙම නැත්නම් මිනිසා ඉතා කුඩා ගුලක රිංගවපු මිත්‍යාවලින් පිරිච්චි ඔලු කුහර විලින් පුරවා ගත්තු මිනිස්සු වෙනුවෙන්ද අපි මේ තාක්ෂණය අද උපයෝගී කරගෙන තියෙන්නේ. මොකක්ද මේකට කරන්නේ. උදේ 7 සිට ඒ කියන්නේ උදෑසන වැඩසටහන් ටික බලන්න. මොකක්ද කරන්නේ. හක්ගෙඩියක් අරගෙන එනවා, පැලයක් අරගෙන එනවා, ගණ දෙවියන් එක්ක සබඳතාවයක් අරගෙන එනවා බෝකර් කෙනෙක් එනවා, මේ මොකක්ද වෙලා තියෙන්නේ සමාජයට. සැලකිල්ලක් දැක්විය යුතු නැද්ද මේ ප්‍රශනයේදී. චින්තනයක් සහිත මිනිසුන් ඕන නැද්ද අපට. ඒ නිසා මේ මිත්‍යාවෙන් ගිලිච්ච සමාජයක්. අධ්‍යාපනය මෙය ප්‍රබල පුළුල් අවස්ථා ගොඩනැගිය යුතු ක්ෂේත්‍රයක්.

ඒනිසා මේ සමාජය යහපත් කිරීමේ, සුව කිරීමේ නිරෝගී සම්පන්න ජීවිතයක් අධ්‍යාපනයක් විසල් මනසක් සහිත චින්තනයක් සහිත සමාජයක් ගොඩනැගෙන්න ඕනැ රට ඉදිරියට යන්න. එක අධ්‍යාපනය, දෙක අදූෂිත බව තුන හොඳ විසල් මනසක් සහිත මිනිසුන්ගෙන් පිරි රටක්. හතර යහපත් පාලනයක්. කොහොමද යහපත් පාලනයක් ගොඩනැගිය හැකි වන්නේ. උසද කොටද බලල රැකියා දෙන සංස්කෘතිය මොකක්ද? එක වෙලාවක ඔබ උපාධි කාරයෙක්ද? උපාධිය වැඩක් නැහැ. උපාධිකාරයො ඇති. මාළුකාරයගේ මාළු පෙට්ටියේ හැම වර්ගයක්ම තිබෙනවා වගේ උපාධිකාරයා කිව්වම හිතනවා හැමදේම තියෙනවා කියලා. උපාධිය මොකක්ද කියලවත් අහන්න ඕන අඩුම තරමින්. මොන උපාධියක්ද ඔයාට තියෙන්නේ. ඔයා ඉංජිනේරු උපාධියක් නම් මේ රක්ෂාව දෙන්නම්. එහෙම නෙවේ ඔයා උපාධි කාරයෙක්ද? උපාධිකාරයකුට රක්ෂා තියෙනවා. මගේ මාළු ලැල්ලේ ඕනතරම් මාළු තිබෙනවා වාගේ. මොකක්ද මේ ගොඩනගන්න හදන්නේ.

මේ යහපාලනය කියල කියන්නේ නගර සභාවේ තාප්පේ කළුතෙල්වලින් ලියන ලද වැකියක්. යහපාලනය කියන්නේ ඊට වඩා අරුතක් තියෙන ඊට වඩා මහ බරක් තිබෙන වචනයක්. හැබැයි මේ කියන යහපාලනය නගර සභාවේ තාප්පේ කළු තෙල්වලින් ලියපු වැකියක්. ඔබට තේරුම් ගන්න පුළුවන් ඒ වැකියේ ස්වභාවය කොහොමද කියලා. මේක තේ සිද්ධවෙන්නේ. ඒනිසා අපිට අභියෝගයක් තිබෙනවා මේ රට මෙතනින් ඉදිරියට ගෙනියන්න නීතිය සහ විදානයේ ආධිපත්‍යය තහවුරු කරන්නේ කොහොමද? කොහොමද නීතිය සහ විධානයේ ආධිපත්‍යය තහවුරු කරන්නේ. නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යංශයේ අතිරේක ලේකම්වරයා ගේනවා ඔහු යටතේම තිබෙන මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ චෝදනාවකට කටඋත්තරයක් ගන්න. කොතනද යහපත්භාවයක් තිබෙන්නේ. මේ චෝදනාවට ලක්වූ කෙනා. රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ අතිරේක ලේකම්වරයා හැටියට පත්කරනවා. දමයන්ති ජයරත්න. කොහොමද වෙන්නේ? මොකක්ද මේ වෙන්නේ?

### නව මාවතක්

මීට වඩා යමක් කිසිවක් මේ මාවතෙන් අපිට ලැබෙන්නේ නැහැ. ඒක තමයි අප ඉදියේ තියෙන සත්‍යය. එහෙනම් මොකක්ද අපට තියෙන්නේ. මේ මාවත වෙනුවට වෙනත් මාවතක් ගොඩනැගිය යුතුමයි. කාටහරි කියන්න පුළුවන් ඒක අසීරුයි නේ. ඔව් අසීරු තමා. හැබැයි ඒකතමා නිවැරදි. අභියෝගයන් හමුවේ අලුත් දේ අත්හදා බලන්න ගියේ නැත්නම් මිනිස් ශිෂ්ටාචාරය මෙතෙන්ට වර්ධනය වෙන්නේ නැහැ. එහෙම නොවුණා නම් අපි තවම ගහෙන් බිටම බැහැලා රැහේ එකතුවෙලා, වටකරලා, සතෙක් දඩයම් කරන මිනිස් ප්‍රජාවක්. මිනිසා සංවර්ධනය වී තිබෙනනේ අභියෝගයන් හමුවේ ඇති පරිවර්තනයන් උකහා ගනිමින්. ඒක තමා මිනිස් ප්‍රගමනයේ ඉතිහාසය. මිනිස් ඉතිහාසය ප්‍රගමනය වී තිබෙන්නේ, අභියෝගයන්වලට සාර්ථකව මුහුණදීමෙන් අත්පත්කර ගන්නා අත්දැකීම් මත. අත්පත්කර ගන්නා දැනුම මත ඉදිරිපත්වන අභියෝගයන් නැවත ජයග්‍රහණය කිරීම මගින් මේ මිනිස් ශිෂ්ටාචාරය ගොඩනැගී තිබෙනවා.

ඒ නිසා අද අප ඉදිරිපිටත් තිබෙන්නේ අසීරු අභියෝගයන්. සිංහල දෙමළ මුස්ලිම් ජනතාව අතර ජාතික සමගිය හදන එකත් අතිශය අසීරුතම අභියෝගයක්. ඒක සරල නැහැ. අපිට ඉතා හොඳින් තේරෙනවා උතුරේ දෙමළ ජනතාව ඔවුන්ගේ නායකත්වයන්ගෙන් අපේක්ෂා කරන්නේ කුමක්ද කියන එක. ඔවුන්ට එම අපේක්ෂා කරන කාර්යයන් ඉටුකරගැනීම නොහැකිවීම පිළිබඳ ඔවුන්ගේ තිබෙන පශ්චාතාපය අපි හොඳට දන්නවා. ඒ නිසා අපිට අභියෝගාත්මක කරුණු තමයි ගොඩක් තියෙන්නේ. හැබැයි මේ අභියෝගවලට සාර්ථකව මුහුණ දිය හැකි වන්නේ මේ මාවතේ තවත් දිගට යාමෙන් නෙමෙයි. අපි රේල් පාරක ආවා නම් අපි දැන් ඉන්නේ එක්දාස් දෙවැනි සිල්පර කොටේ ගාව නම් අපිට එක්දාස් තුන්වැනි කොටේට පය තිබ්බයි කියලා මේ මාවතේ කිසිවක් වෙන්නේ නැහැ. මේකම තමා. ඒනිසා අපි වෙන මාවතක් කැපිය යුතුව තිබෙනවා. මේ රටේ මහාජන බලවේගයක් ඒකරාශි කළ යුතුව තිබෙනවා. අපි දේශපාලන ව්‍යාපාරයක් හැටියට දකින්නේ, එක් යුගයක් හමාර කොට නව යුගයක් ආරම්භ කිරීම සඳහා වූ මහජන ව්‍යාපාරයක අවශ්‍යතාවයයි.

## වෙනස් විය යුත්තේ...

03 පිටුවෙන්

*ජ.වි.පෙ. වැඩපිළිවෙළට මෙම සටන් ඒකාබද්ධ වෙන්නේ කවරාකාරයටද?*

**ලාල් කාන්ත සහෝදරයා:-** ප්‍රධාන යැයි කියන දේශපාලන පක්ෂ ගැන තියෙන කලකිරීම නිසා මිනිස්සු පහුගිය පාර්ලිමේන්තු මැතිවරණයෙදී කාටවත් ආණ්ඩුවක් හදන්න බලය දුන්නෙ නැහැ. යූ.ඇන්.පී. එකටවත් ශ්‍රීලංකා එකටවත් වෙන කාටවත් බලයක් දුන්නේ නැහැ. ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන පාවිච්චි කරලා ජනතාව නොදීපු බලයක් පාවිච්චි කරගෙන මොවුන් හවුල් ආණ්ඩුවක් හදාගෙන තිබෙනවා. 2020 වෙනකොට ජනතාව මෛත්‍රීගෙ ශ්‍රීලංකා එකටවත්, රනිල්ගේ යූඑන්පී එකටවත් මහින්දගේ පොහොට්ටුවටවත් මිනිස්සු ඡන්දෙ දෙන්නේ නැහැ. ඒ නිසා මේ තුන්ගොල්ල උත්සාහ කරන්නේ, 2020දී තුන් හවුල් ආණ්ඩුවක් හදන්න. ඒක තමයි ලංකා ඉතිහාසයේ ප්‍රතිගාමීම ආණ්ඩුව.



දැනුත් මේ තුන්ගොල්ල නිල නොවන විදිහට එකතුයි. හොරකම්. වංචා, දූෂණවලට දඬුවම් දෙන එකෙන් බේරන්න හදනවා; බේරගෙන යනවා. බේරීමත් බේරගැනීමත් අරමුණු කරගෙන ඔවුනොවුන් එකතු වෙනවා. සියලු දූෂිතයින් සහ ඔවුන්ගේ ආරක්ෂකයින් එකට එකතු වී තුන් හවුලක් හැදෙනවා. දැනටත් මේ හවුල නිල නොවන විදිහට ගොඩනැගී තිබෙනවා. ඒ නිසා තමයි අයවැය කතාවෙදී ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යවරයා කියන්නේ, මහින්ද රාජපක්ෂ මහත්තයාත් අපිට මේ දේවල් කරන්න උදව් කරන්න ඕනැ කියලා.

ජනතාව මේ තත්වය, මේ අවදානම තේරුම් ගත යුතුයි. එහෙම ආණ්ඩුවක් හැදෙන එක වළක්වලා, මේ ප්‍රතිගාමී බලවේග තුනම පැත්තකට තල්ලු කරලා ජනතාවාදී ආණ්ඩුවක් ගොඩනගන්න සමත් දේශපාලන ව්‍යාපාරයක් ගොඩනගන්න ඕනැ. දැන් තියෙන හවුල් ආණ්ඩුව හැදෙන බව පහුගිය මැතිවරණයේදී ජ.වි.පෙ. කිවුවා. ඒ වගේම අපි කිවුවා, හොරු හොරුන්ට විරුද්ධව කටයුතු කරන්නෙ නැති බව. ඒක දැන් ඔප්පු වී තිබෙනවා. මේ සියලු ජනසතුරන්ගේ හවුල පැරදවීම සඳහා දැන් සිටම කටයුතු කිරීමේ වගකීම ජනතාවට තිබෙනවා.

ජනතාවගේ දේපළ, රාජ්‍ය සම්පත්, තමන් මෙතෙක් භුක්ති විඳි සේවා ආරක්ෂා කරගන්න, මහජන ධනය කොල්ලකෑ දූෂිතයින්ට වංචනිකයින්ට දඬුවම් දෙන්න ජනතාවට සටනක් තියෙනවා. ඒක තමන්ගේ ක්ෂේත්‍රවල සිට පමණක් සටන් වැදීමෙන් දිනා ගත හැකි දෙයක් නෙමෙයි. එක අපි කාගේත් පොදු සටනක්. මේ අනතුර කල් ඇතිව දැකලා එය පැරදවීම සඳහා ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයෙන් ගොඩනැගෙන පුළුල් ජනතා පෙරමුණ වටා අත්වැල් බැඳගන්න කියලා අපි ජනතාවට ආරාධනා කරනවා.

## මහ බැංකු බැඳුම්කර වංචාව...

02 පිටුවෙන්

- ජනතාවගේ විරෝධය නොසලකා සිංගප්පූරු පුරවැසියෙක් වන අර්ජුන් මහේන්ද්‍රන් මහතා අගමැතිවරයාගේ වුවමනාව මත මහ බැංකු අධිපති තනතුරට පත්කිරීමත්
- මහ බැංකු බැඳුම්කර වංචාව හෙළිවූ අවස්ථාවේ සිට හිටපු අධිපතිවරයා රැකීමට උත්සාහ කිරීමත් ඔහුගේ ධුර කාලය දීර්ඝ කිරීමට පවා සූදානම් වීමත්
- මෙතරම් බරපතළ චෝදනාවකට ලක්වූ හිටපු මහ බැංකු අධිපතිවරයා එම තනතුරෙන් ඉවත් නොකොට ඔහුගේ ධුර කාලය අවසන් වී ඔහු ස්වාභාවිකව ඉන් ඉවත්වන තුරු සිටීමත් (නැවත එම තනතුරට ඔහු පත්කිරීමට උත්සාහ කළද ජනතා විරෝධය නිසා එය නොහැකි විය.)
- ඉන්පසු මෙම චෝදනා සහිත අර්ජුන් මහේන්ද්‍රන් මහතාට ලංකාවේ ආර්ථිකය සම්බන්ධ වෙනත් වැදගත් හා බලවත් තනතුරු පිරිනැමීමත්
- මහ බැංකු බැඳුම්කර වංචාව සෙවීමේ කාර්යය කෝප් කමිටුව විසින් පවරා ගැනීමෙන් පසුව කෝප් කමිටුවේ එජාප නියෝජිතයන්ගේ සංයුතිය වෙනස් කරමින් එහි සිටි වේළුකුමාර් මන්ත්‍රීවරයා ඉවත් කොට ඒ වෙනුවට සුජීව සේනසිංහ මන්ත්‍රීවරයා පත් කිරීමත් එමගින් කෝප් කමිටුව තුළදී අර්ජුන් මහේන්ද්‍රන් බේරා ගැනීමේ මෙහෙයුමක් ක්‍රියාවට නැගීමත්,
- මහ බැංකු බැඳුම්කර ගනුදෙනුවේදී වංචාවක් සිදුවී ඇති බවත් ඉන් රජයට විශාල පාඩුවක් සිදුවී ඇති බවත් ඊට හිටපු මහ බැංකු අධිපතිවරයා සහ මහ බැංකුවේ ඇතැම් නිලධාරීන් සම්බන්ධ බව කෝප් වාර්තාව මගින් තහවුරු කර තිබියදී තවමත් අර්ජුන් මහේන්ද්‍රන් මහතා සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීමත් යන සියලු කරුණුවලින් තහවුරු වන්නේ, අගමැතිවරයාට ඉහත වංචාවේ වගකීමෙන් බේරී යා නොහැකි බවය.

මේ තත්වය තුළ බොරු සෝෂා කිරීම නවතා ඒ වෙනුවට කෝප් වාර්තාවේ නිර්දේශ වහාම ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙසද ඒ අතරම හදිසි ක්‍රියාමාර්ග ලෙස සලකා පහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීමට වහාම පියවර ගන්නා ලෙසද අපි ආණ්ඩුවට බලකරමු.

01. මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳ කෝප් වාර්තාව පදනම් කර ගනිමින් මෙම වංචාවට සම්බන්ධ සියලුම දෙනාට එරෙහිව නීතිමය පියවර ගැනීමට හා එහිදී වැරදිකරුවන් වන සියලු දෙනාට උපරිම දඬුවම් ලබාදීමටත් රජයට වංචා කළ මුදල් ප්‍රමාණය ආපසු අයකර ගැනීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීම

02. මහ බැංකු බැඳුම්කර වංචාවට සම්බන්ධ බවට කෝප් වාර්තාවේ සඳහන් හිටපු මහ බැංකු අධිපති අර්ජුන මහේන්ද්‍රන් මහතා දැනට දරන රජයේ හා ආර්ථිකයේ සියලු තනතුරුවලින් වහාම ඉවත් කිරීම හා නැවත රජයේ කිසිදු තනතුරකට පත් නොකිරීම

03. බැඳුම්කර වංචාව මගින් අධික ලාභයක් ලබා ඇති පර්පචුවල් ට්‍රෙෂරීස් සමාගම මෙම වංචාව මගින් උපයා ගත් වත්කම් පිටට රැගෙන යාමේ ඉඩක් පවතින නිසා එම සමාගම හා ඊට අනුබද්ධ සියලු සමාගම්වල සියලු වත්කම් හා මුදල් පිටට රැගෙන යාම වැළැක්වීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග වහාම ගැනීම

04. කෝප් වාර්තාවෙන් අනාවරණය වී ඇති කරුණු අනුව මෙම වංචාවට සම්බන්ධ පර්පචුවල් ට්‍රෙෂරීස් සමාගම මහ බැංකුවේ ප්‍රාථමික ගනුදෙනුකරුවන්ගේ ලැයිස්තුවෙන් වහාම ඉවත් කිරීම

05. මෙම වංචනික ගනුදෙනුව සඳහා තම වෘත්තීය වගකීම මගහරිමින් මෙම ගනුදෙනුවට සහාය දැක්වූ මහ බැංකුවේ නිලධාරීන් විසින් බැඳුම්කර වංචාව පිළිබඳ කරන පරීක්ෂණවලට බාධා කළ හැකි නිසා මෙම පරීක්ෂණ නිමවන තුරු ඔවුන් මෙයට අදාළ වගකීම්වලින් වහාම ඉවත් කිරීම

06. එසේම, වත්මන් කෝප් වාර්තාවට පෙර 2015 අගෝස්තු 09 ඉදිරිපත් කළ කෝප් වාර්තාවෙන්ද පෙන්වා ඇති කරුණු සැලකිල්ලට ගනිමින් පසුගිය කාලය පුරා මහ බැංකුව මගින් බැඳුම්කර නිකුත් කිරීමේදී හා විවිධ මූල්‍ය ගනුදෙනුවලදී සිදුව ඇති වංචා සහ අක්‍රමිකතාවයන් සෙවීම සඳහා විධිමත් පරීක්ෂණයක් සිදුකිරීම

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com


## ඉල් මහ විරු සමරු




ප්‍රංශයේදී...




කුවේට් හිදී...



කටාර් හිදී...




බෙල්ජියමේ දී...




සහෝදරත්වයේ දිනය - රෝමයේදී...



සොවියට් දේශයේ බිඳවැටීම... කෘතිය පිළිගන්වමින්

# හොරා කෑ මහජන දේපොළ නැවත අත්පත් කර ගත යුතුයි!

## ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා



පසුගිය 01වැනි දින කොළඹ මහජන පුස්තකාලයේදී පැවැත්වූ 'දූෂිතයෝ සහ ආරක්ෂකයෝ' සම්මන්ත්‍රණයේදී අදහස් දැක්වූ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා දූෂිතයින්ට එරෙහි සටනේ ශුද්ධ වූ අයිතිය තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණටත් ඒ වටා එකතුවෙන බලවේගයන්ටත් පමණක් බව අවධාරණය කළේය. එහිදී ඔහු වැඩිදුරටත් මෙසේද පැවසීය.

"මේ රටේ දූෂිත කල්ලියක් ඉන්නවා. මේ දූෂිත වළල්ල තමයි පාලකයින් සහ පාලනය ආරක්ෂා කරන්නේ. මාධ්‍ය බලය උපයෝගි කරගන්නවා. මැතිවරණවලට සල්ලි පොම්ප කරනවා. පාතාලය සපයනවා. අවි ආයුධ දෙනවා. ඒ නිසා දූෂිතයින් වෙනුවට ජනතාව රැකගන්න පාලනයක් ගොඩනැගිය යුතුයි. ඒ නිසා දූෂණ විරෝධී සටන ශක්තිමත් කළ යුතුයි. දූෂිතයින්ට එරෙහි සටනේ ශුද්ධ වූ අයිතිය තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණටත් ඒ වටා එකතුවෙන බලවේගයන්ට පමණයි.

සමහරු අහනවා ඔයගොල්ලෝ ආවත් දූෂිත වළල්ලක් හැදෙයිද කියලා. අපේ රටේ සාධාරණ ව්‍යාපාරිකයින් බිය විය යුතු නැහැ. නමුත් මහින්ද රාජපක්ෂලා, නාමල් රාජපක්ෂලා බයවෙන්න ඕනෑ. රනිල් වික්‍රමසිංහත් දැන් බය වෙන්න ඕනෑ. රවී කරුණානායක බය වෙන්න ඕනෑ. අපි ඉතාමත් වැදගත් විනිවිදභාවයෙන් යුතුව පරීක්ෂණ දියත් කරනවා. අපිට පුද්ගලික වෛරයක් නැහැ. අපේ ව්‍යාපාරයේ මිනිසුන් ඉතාමත් උසස්. පෞද්ගලික ගැටුම් අපිට අදාළ නැහැ. අපි මහජනයාගේ පැත්තේ හිටගත් ව්‍යාපාරයක්. අපිට ගැටුම තිබෙන්නේ ජනතාවගේ වුවමනාවට එරෙහිව හිටගත් අය සමඟයි.

මේ රට දූෂණයට එරෙහිව පමණක් නොව මේ රට නව මාවතකට යොමු කරන බලවේගයක් ගොඩ නැගිය යුතුයි. අපි 2020 බලය ලබාගන්න පුළුවන් ව්‍යාපාරයක් ගොඩනගනවා. මේ රටේ ජනතාව තීරණය කරන්න ඕනෑ බලය දෙනවද නැද්ද කියලා. අපි බලය ලබාගැනීමට සූදානම් ව්‍යාපාරයක් හදනවා. ජනතාව තීරණය කරන්න පුළුවන් ඒ ව්‍යාපාරයට බලය දෙනවද නැත්නම් වෙන කාටහරි දෙනවද කියලා. ඒ වෙනුවෙන් අපි එයට අත තියල තිබෙනවා. මේ සටන වෙනුවෙන් සියලු දෙනාට කාර්යභාරයක් තිබෙනවා. සියලු දෙනාටම ඒ වෙනුවෙන් එකතුවෙන්න කියලා ආරාධනය කරනවා."

# ඉල් මහ විරුවන්ගේ ප්‍රාර්ථනා ඉටුකරන සමාජයක් ගොඩනඟනවා

## ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



රෝහණ විජේවීර සහෝදරයා ජනතා විමුක්ති පෙරමුණ ගොඩනගන විට ඔහුගේ හදවතේ තිබුණු ප්‍රාර්ථනාව වන දුෂ්ට ධනවාදී ක්‍රමය නිමා කර සමාජවාදය ගොඩනැගීමේ වගකීම සියලු දෙනා වෙත පැවරී තිබෙන බව අවධාරණය කළ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, ඒ වගකීම වන්නේ, සතුට තිබෙන සොම්නස සහිත නව සමාජවාදී සමාජයක් බිහි කිරීම බව පෙන්වා දුන්නේය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 13වැනි දින කොළඹ විහාර මහා දේවි එළිමහන් රංගපීඨයේ පවත්වන ලද 27වැනි ඉල් මහ විරු සමරුවේදීය. එහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා, නව සමාජය නිර්මාණය කිරීම සඳහා දිගු ගමනක් පැමිණ තිබෙන අතර යහපත් වටපිටාවක් තිබෙන නමුදු ජයග්‍රහණ ලබාගැනීම සඳහා සටන් කොට දිනාගත යුතු අභියෝග කිහිපයක් තිබෙන බවත් සියලු දෙනා එකතු වී එම අභියෝගය ජයග්‍රහණය කළ යුතු බවත් පෙන්වා දුන්නේය.

"සමාජයේ බොහෝ දෙනා මේ ධනවාදය ඇතුළේ සිසිර නිද්‍රාවක ගිලී ඉඳිද්දී අපි ඔබ සියලු දෙනාම වේලාසන අවදි වෙලා තිබෙනවා. අලුත් හිරු කිරණ දැක ගැනීම සඳහා ඉදිරි ගමනක අපි යෙදී සිටිනවා. අපි හැමදාම ප්‍රාර්ථනා කරපු සමාජවාදයේ අරුණාලෝකය දකින්න පුළුවන් ඉසව්වකට අපි හැම දෙනාම ඇවිත් තිබෙනවා."

# ආණ්ඩුව විදෙස් ගත ශ්‍රමිකයින්ගේ ගැටලු විසඳිය යුතුයි

## එතෙර අපි සංවිධානය

එතෙර අපි සංවිධානය විසින් පසුගිය 08වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදී විදෙස්ගත ශ්‍රී ලංකිකයින් මුහුණ දෙන ගැටලුවලට ආණ්ඩුව වහා මැදිහත් විය යුතු බව අවධාරණය කරන ලදී.

එහිදී එම සංවිධානයේ ලේකම් ලක්ෂ්මන් නිපුණාරච්චි සහෝදරයා අදහස් දක්වමින් විදෙස් ගත ශ්‍රමිකයින් රටට ආදායම් ගෙනන ප්‍රමුඛතමයින්ව සිටියත් ඔවුන් වෙනුවෙන් ආණ්ඩුවෙන් ලැබෙන සහන අවම බවත් ඔවුන් මුහුණ දෙන ගැටලුවලට වහා මැදිහත් විය යුතු ඇති බවත් කියා සිටියේය. වැඩිදුරටත් ඔහු මෙසේද පැවසීය.

"ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීමක් තමයි, තීරු බදු රහිත වාහනයක් ලංකාවට ගෙනඒමේ අයිතිය ඔවුනට ලබාදෙන්න කියන එක. අපි කියන්නේ අවම වශයෙන් ඔවුන් විසින් විදෙස් ගතව සිටියේදී රටට එවන ලද මුදලේ ප්‍රතිශතයක් ලෙස හෝ මෙම තීරු බදු සහනය ලබා දෙන්න.

විදෙස්ගත ශ්‍රමිකයින්ට ඡන්ද අයිතිය ලබාදීම සඳහා මේ වන විට යම් වැඩකොටසක් කෙරෙමින් පවතිනවා. එතෙර අපි සංවිධානයේ සුනිල් හඳුනෙත්ති සහෝදරයා විසින් කරන ලද යෝජනාවක් අනුව මේ වන විට පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් නම් කරනු ලැබ තියෙනවා. එහෙත් තාම එය රැස්වී නැහැ. අපි ඉල්ලන්නේ මෙම වහාම මෙම තේරීම් කාරක සභාව රැස්වී අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බවයි."



මෙම මාධ්‍ය හමුව සඳහා එතෙර අපි සංවිධානයේ භාණ්ඩාගාරික නීතීඥ ජානක අධිකාරි සහ සම්බන්ධීකාරක සංජීව බණ්ඩාර යන සහෝදරවරුද සහභාගි වූහ.

# අයි.එම්.එෆ්. අයවැයෙන් ජනතාව කබලෙන් ලිපට

## ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා




ආණ්ඩුව විසින් අයවැය ලේඛනය සකස් කර ඇත්තේ අයි.එම්.එෆ්. කොන්දේසි අනුව බවට චෝදනා කළ ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා මුදල් අමාත්‍යවරයා විසින් රටේ ජනතාව කබලෙන් ලිපට ඇද දමා ඇතැයි පැවසීය.

ඔහු මෙම අදහස් පළ කළේ 2017 අයවැය පිළිබඳ ජ.වි.පෙ. ස්ථාවරය පැහැදිලි කිරීම වෙනුවෙන් පසුගිය 11වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවැත්වූ මාධ්‍ය හමුවකදීය. එහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ විජිත හේරත් සහෝදරයා මෙසේද ප්‍රකාශ කළේය.

"අපේ රටේ ජනතාවට සහනයක් ලබා දෙන්න මේ අයවැය ලේඛනයට පුළුවන් වෙලා නැහැ. ඒ නිසා මේ අයවැයට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණේ අපි ඡන්දය පාවිච්චි කරනවා. ඒ විතරක් නෙවෙයි මේ ආණ්ඩුව ගෙන යමින් තිබෙන කොල්ලකාරී ආර්ථික ක්‍රමවේදයට එරෙහිව ජනතාව පෙළගැස්සවීම සඳහා ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කරනවා.

මේ ආණ්ඩුවට කඩා වැටුණු ආර්ථිකය ගොඩ ගන්න කෙටි කාලීන හෝ දිගු කාලීන වැඩපිළිවෙළක් නැහැ. රාජපක්ෂ පාලනය වගේම කෙටි කාලීණව ණය ලබාගැනීම පමණමයි උත්තරයක් හැටියට තියෙන්නේ. අයවැය හිඟය පියවා ගන්න මේ ආණ්ඩුවට තියෙන එකම උත්තරය ණය, බදු, දඩ පමණයි."





බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.